සැඟවුණු බොදු මග යළි පුබුදන

# හෙළ බොදු පියුම

ශ්‍රී බු. ව. 2559ක් වූ වෙසක් මස (ව්‍යවහාරික වර්ෂ 2015 මැයි)


43 වෙනි කලාපය

## ඔබ නොදුටු සතර පෙර නිමිති !




රු. 20/-


සැඟව ගිය බොදු මග යළි රැගෙන සෑම පුන් පොහෝ දිනකම එළිදකින දහම් සංග්‍රහය




# ලොව්තුරු සුව ගෙනෙන ආනා පාන සති...






















ආනා වෙ නම් අර ගත යුතු හොඳ දේම
පානා වෙ නම් පහ කළ යුතු කිලි සේම
ලෝනා මුනිඳු දුන් දම නැණ ඇති සෑම
ඕනා වඩන්නට දැන ගෙන හැම දාම

අරිය වෙහෙර යනුවෙන් බුදු හිමිද කළ
සිරිය ගෙනෙන අස්වස පස්වසය තුළ
හරිය කියන ලොව්තුරු මග නැණද බල
බැරිය වඩනු නැණ නැති හට නොමැත ඵල

කළ හැක සතර ඉරියව් හිඳ ගෙනම සතී
ඵල දෙත ලොවින් එතෙරට යන නිවන වෙතී
මළ ගිය දිනක මුත් සහයට ඇදිල එතී
ගැළවෙන මගකි තුන් ලොවටම සුවය දෙතී

හුස්මක තියෙන වායුව හොඳ නරක නොවේ
දැක්මක නැණින් තිලකුණ නම් ගෙනෙත සුවේ
දුක් නෙක පහ කරන සිතිවිලි එවිට ගෙවේ
දොස් දැක ලොවේ ගත් හුස්මෙන් වෙහෙස නිවේ

සුළඟට හිත තබා ආනා පාන සතී
වඩනට ගියොත් ලෝ සැප නම් කයට එතී
දුකකට ඇද දමන ලෝ තතු ගෙනෙන නිතී
නිවනට ඔබින ලෙස සුළඟද බැලිය යුතී

නහයට ඇදෙන හුස්මක මොහොතක පාසා
පහ කළ යුතු අවැඩ අකුසල් ලෙස දෝසා
දහමට අනුව දස කුසලෙට කර ආසා
යහ ගුණ වඩොත් පෑදෙයි නිවනට දෑසා

හුස්මක වුවද පවතින තිලකුණ දැකලා
ඇස් හැර බලනු දැන ගත හැකි වෙත මෙකලා
දොස් දෙන හේතු වේ නම් කොතැනක සකලා
අස් කළ යුතුයි නුවණින් දැන ගෙන රැකලා

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන

# රහතුන්ගේ උදම් වැකි

**3 වන කොටස**

අංගුලිමාල කියන මිනීමරු හොරා ගැන මේ පින්වතුන් ඕන තරම් කතා අහල ඇති. අහිංසක නමින් සිප් සතර ඉගෙන ගන්න ගිය තරුණයා, ගුරු පඬුරු පූජා කරන්නයි කියල රවටල මහා මිනීමරුවෙක් බවට පත් කළ හැටිත් හැමෝම වගේ අහල තියෙනවා. ඉතින් මේ මහා මිනීමරුවා මිනිස්සු මරල ඇඟිලි කපල ඒ ඇඟිලිවලින් මාලයක් දාගෙන හිටිය නිසා අංගුලිමාල වුන හැටිත් ප්‍රසිද්ධ කථාවක්. ලොව්තුරා බුදු පියාණන් වහන්සේගෙ පුරිස දම්ම සාරථී ගුණය නිසා මේ අංගුලිමාල දමනය වෙලා අන්තිමට අරිහතුන් වහන්සේ නමක් වුණා. ඉතින් මේ අරිහතුන් වහන්සේ, තමන් වහන්සේ ලැබූ ඒ සැනසීම ලබාගත් ආකාරයත්, එහි ඇති සුවයත් විස්තර කරන ථේර ගාථා කොටස තමයි මේ විග්‍රහ කරන්නෙ.

ගච්ඡං වදේසි සමණට්ඨිතොම්හි
මමං ච බ්‍රෑයි ඨිතමට්ඨිතො'ති,
පුච්ඡාමි තං සමණ ඒතමත්ථං
කථං ඨිතෝ ත්වං අහමට්ඨිතොම්හි.

මහණ, යන්නෙහි සිටියෙමියි කියහි, සිටි මා නො සිටියහ යයි ද කියහි, මහණ මෙ කරුණ ඔබ විචාරමි, හවත් කෙසේ සිටියෙ යැ? මම කෙසේ නො සිටියෙම් වේ ද?

ඨිතෝ අහං අඞ්ගුලිමාල සබ්බදා
සබ්බේසු භූතේසු නිධාය දණ්ඩං,
තුවඤ්ච පාණේසු අසඤ්ඤතෝසි
තස්මා ඨිතෝහං තුවමට්ඨිතෝසි.

අඟුල්මල මම හැම කල්හි සියලු සතුන් කෙරෙහි දණ්ඩනය හැරපියා සිටියෙමි, තෝ වනාහි ප්‍රාණීන් කෙරෙහි සංයම රහිත වෙහි, එහෙයින් මම සිටියෙමි, තෝ නො සිටියෙහි.

- ථේර ථේරී ගාථා -211 පිටුව -

අංගුලිමාල තෙරුණ් වහන්සේ මේ විදිහට තමයි ථේර ගාථාව පටන් ගන්නෙ. ලොව්තුරා බුදුන් වහන්සේ අංගුලිමාලව දමනය කරන්න මහ කැලේට වැඩිය මොහොතේ ඇති වුන කතා බහෙන් තමයි මේක පටන් ගන්නෙ. උන් වහන්සේ එතන ඍද්ධි ප්‍රාතිහාර්යක් පානවා, කොච්චර දුර දුවගෙන පිටිපස්සෙන් ආවත් අංගුලිමාලට තමන් වහන්සේ ළඟටවත් කිට්ටු වෙන්න බැරි වෙන්න. ඒ කිව්වෙ, දුවන අසුන් අල්ලල නවත්වන්න පුළුවන් හයියක්, වේගයක් තියෙන අංගුලිමාලට, මේ ශාන්ත ගමනින් වඩින බුදු පියාණන් වහන්සේට කිට්ටු වෙන්නවත් බැරි වුණා. එතකොට තමයි කල්පනාවට ආවෙ, මම මෙච්චර හයියෙන් දුවලත් අල්ල ගන්න බැහැනෙ කියල. එහෙම හිතල, හිටු මහණ කියල කෑ ගැහුවා. ඒ කෑ ගැහිල්ලට බුදුන් වහන්සේ දුන්න උත්තරය තමයි, මම නැවතිලා ඉන්නෙ ඔබත් නවතින්න කියල. දැන් අංගුලිමාලට නැවත ප්‍රශ්නයක් මතු වුණා. ඒ ප්‍රශ්නෙ තමයි මුල් ගාථාවෙන් උන් වහන්සේ කියා පාන්නෙ.



මේ මහණ ඇවිද ඇවිද කියනවා හිටිය කියල, ඒත් නැවතිලා හති හල හල ඉන්න මට කියනවා නවතින්න කියල. මොකක්ද මේකෙ තේරුම? ඔබ ඇවිද ඇවිද කියනවා නැවතිලා ඉන්නෙ කියල, ඒත් නැවතිලා ඉන්න මට කියනවා නවතින්න කියල. ඊට පස්සෙ ලොව්තුරා බුදු පියාණන් වහන්සේ අංගුලිමාලගෙ හිත වෙනස් කළා, කුතුහලයක් ඇති කළා. දැන් අහල දැනගන්නම ඕන තැනට ගෙනාවා. ඊට පස්සෙ තමයි උන් වහන්සේ ඇවිද ඇවිදත් නැවතිලා ඉන්නෙ කියල කියන්න හේතුවත්, නැවතිලා ඉන්න අංගුලිමාලට නවතින්න කියල කියන්න හේතුවත් පැහැදිලි කළේ. කොටින්ම කියනව නම්, ඒ වචන පෙළ තුල සැඟවිලා තියෙන දහම් අරුත, එහෙම නැත්නම් නිරුක්තිය මතු කරල දුන්නා. අංගුලිමාලගෙ හිතත් ඒකට උත්තරයක් ලැබෙන කල් බලන් ඉන්න මොහොතෙ, උන් වහන්සේ ඒ කාරණය මේ විදියට පහදල දුන්නා.

''මම සියලු සතුන් කෙරෙහි දණ්ඩනයෙන්, වද හිංසා කිරීමෙන්, ප්‍රාණ ඝාතයෙන් මුළුමනින්ම ඉවත් වෙලා ඉන්නෙ. ඒ නිසයි මම නැවතිලා ඉන්නව කිව්වෙ'' අපි දැන ගන්න ඕන, මොකෙන්ද උන් වහන්සේ නැවතුනේ කියල. අර කිව්ව විදිහට **සියලු සතුන් කෙරෙහි දණ්ඩනයෙන්, වද හිංසාවෙන්, සම්පූර්ණයෙන්ම ඉවත් වෙන්නෙ අරිහතුන් වහන්සේ.** ඒ නිසා උන් වහන්සේට සියලු පවු බැහැර කළ කියන අර්ථයෙන් භාහිත පාපී කියලත් කියනවා. සතුන් මැරීම, වද හිංසා දීම පාපයක්. එහෙම දෙයක් කිසිම කලෙක අරිහතුන් වහන්සේ නමකගෙන් වෙන්නෙ නෑ. මේ ගැන පැහැදිලි විග්‍රහයක් අංගුත්තර නිකායේ අෂ්ඨාංග උපෝසථ සූත්‍රය, නවාංග උපෝසථ සූත්‍රය, අරිය උපෝසථ සූත්‍රය, විශාඛා උපෝසථ සූත්‍රය ආදියෙන් ලබා ගන්න පුළුවන්. ප්‍රාණ ඝාතයට අයිති කොටස අරන් බැලුවොත්, ජීවිතාන්තය තෙක් ඒ රහතන් වහන්සේ පර පණ නැසීමෙන් වෙන්ව, පර පණ නැසීම අතහැර, බහා තැබූ දඬු මුගුරු ඇතිව, බහා තැබූ දැල් උගුල් ආයුධ ඇතිව, පාපයට ලජ්ජා ඇතිව බිය ඇතිව දයාවට පැමිණ සියළු ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පාවෙන් වාසය කරන්නේය. ඉතින් මේක අරිහතුන් වහන්සේගෙ ගුණයක්.

අරිහතුන් වහන්සේලා නවත්වපු දෙයක් තියෙනවා. සසර ගමන තමයි උන් වහන්සේලාගෙ නැවතුනේ. ඉතින් බුදුන් වහන්සේ අංගුලිමාලට දේශනා කරපු වචනවල නිරුක්තිය, එහෙම නැත්නම් ලෝකෝත්තර දහම් අරුත අනුව බැලුවොත්, බුදුන් වහන්සේ සසර ගමන නවතලයි උන්නෙ. නමුත් අංගුලිමාල ඒ වෙන කොට සසර තුළ සැරි සරනවා. ඒ වෙලාවෙ මළොත් එහෙම අපාගත වෙලා තමයි නවතින්නෙ. අන්න ඒ කාරණය අරගෙන තමයි උන් වහන්සේ, මම නැවතිලා ඉන්නෙ ඔබත් නවතින්න කියල අංගුලිමාලට දේශනා කළේ.

දෙවන ගාථාවෙන් බුදුන් වහන්සේ පැහැදිලි කළ දේ අංගුලිමාල රහතන් ☞

වහන්සේ පැහැදිලි කළේ මේ විදිහට. ඒ විස්තරය ඒ විදිහටම අංගුලිමාල අරිහතුන් වහන්සේ ප්‍රකාශ කරපු ගාථා පෙළේ තියෙනවා. ඉන් පසුව බුදුන් වහන්සේ සමග ඇති වෙච්ච ධර්ම කතාවෙන්, උන් වහන්සේ ලබපු දහම් අවබෝධය ගැන මේ විදියට සඳහන් වෙනවා.

වීරස්සං වත මේ මහිතෝ මහේසි
මහාවනං සමණෝ පච්චුපාදි,
සෝහං වජිස්සාමි සහස්සපාපං
සුත්වාන ගාථං තව ධම්මයුත්තං.

පූජිත වූ මහර්ෂී වූ ශ්‍රමණ තෙම කලෙකින් මට හිත පිණිස මහ වනයට එළඹියෙ යැ, මම ඔබගේ ධර්ම යුක්ත වූ ගාථාව අසා දහසක් පවු හැර දමන්නෙමි,

ඉවෙච්ච චෝරෝ අසිමාවුධං ච
සොබ්භෙ පපාතේ නරකේ අන්වකාසි,
අවන්දි චෝරෝ සුගතස්ස පාදේ
තත්ථෙව පබ්බජ්ජමයාචි බුද්ධං.

මෙසේ කියා අඟුල්මල් සොර අසිපත ද සෙසු අවි ද හෙබෙහි ප්‍රපාතෙයෙහි, පොළෝ විවරයෙහි දැමී යැ, සොර බුදුන් ගේ පා සඟල වැන්දේ යැ, එතැන්හි මැ බුදුන් ගෙන් පැවිද්ද අයැදී.

බුද්ධෝ ච බෝ කාරුණිකෝ මහේසි
යෝ සත්ථා ලෝකස්ස සදේවකස්ස,
තමේහි භික්ඛූ'ති තදා අවෝච
එසෝව තස්ස අහු භික්ඛුභාවෝ.

ඉක්බිති යම් කෙනෙක් දෙවියන් සහිත සත්ව ලෝකයාට කාරුණික වෙත්ද, මහර්ෂි වෙත් ද, ඒ බුදුහු එව මහණැ යි එදා ඔහුට වදාළහ. ඒ මැ ඔහු ගේ භික්ෂු භාවය වී.
-ථේර ථේරි ගාථා - 211 පිටුව -

ඉතින් උන් වහන්සේගේම පැහැදිලි කිරීම අනුව, බුදුන් වහන්සේගෙ දේශනා අහල පැහැදිලා සියලු පවුවලින් මිදෙන්න ක්‍රමයක් ඉල්ලා සිටියා. සියලු අවි ආයුධ අත හැරියා. මෙතන මහ ඍෂි කියල කියන්නෙ බුදුන් වහන්සේට. සියලු ඍෂිවරයන්ගේත් ඍෂිවරයා කියන අරුතින් තමයි එහෙම කියන්නෙ. හරියට දෙවියන්ගෙත් දෙවියා හෙවත් දේවාතිදේව, ඒ වගේම බ්‍රහ්මයන්ගෙත් බ්‍රහ්මයා හෙවත් බ්‍රහ්මාතිබ්‍රහ්ම කියනව වගේ, මහා ඍෂි කියන්නෙ බුදුන් වහන්සේට. ඉතින් බුදුන් වහන්සේ අංගුලිමාලව ඒහි භික්ඛු භාවයෙන් පැවිදි කළා. ඒක ලොව්තුරා බුදුන් වහන්සේ නමකට පමණක් කරන්න පුළුවන් ක්‍රියාවක්, ඒ වගේම ඒ සඳහා අනෙක් කෙනාට හේතු තියෙන්නත් ඕන. ලොව්තුරා බුදුන් වහන්සේ නමක් ධර්ම දේශනා කළාට පස්සෙ, ඒ දේශනාව අහල පැහැදුන කෙනෙක් පැවිද්ද ඉල්ලුවම හේතු තියෙනව නම්, එව මහණ කියල අමතනවා. ඒ මොහොතෙම ඒ පැවිද්ද ඉල්ලපු කෙනාට සිවුරු පාත්තර මැවිල හිස මුඩු වෙලා භික්ෂුන් වහන්සේ නමක් බවට පත්වෙනවා. ඒකට ඒ පැවිද්ද ඉල්ලපු කෙනාට හේතු තියෙන්නත් ඕන. අටුවාවල සඳහන් වෙන ආකාරයට, ඒහි භික්ඛු භාවයෙන් පැවිද්ද ලබා ගන්න පුළුවන් පිරිමි කෙනෙකුට විතරයි. කාන්තාවක් ඒහි භික්ඛු භාවයෙන් පැවිදි වුන තැනක් ධර්මයේ හමුවෙන්නෙ නෑ. මේකට හේතුව පෙර සංසාරෙ භික්ෂුන් වහන්සේලාට කරපු, එහෙම නැත්නම් සාසනය වෙනුවෙන් කරපු අට පිරිකර පූජා, සිවුරු පිරිකර පූජා. අටුවාවල සඳහන් වෙන ආකාරයට පිරිමි කෙනෙක් ඒ පූජා කළා නම් ඒහි භික්ඛු භාවයෙන් පැවිද්දත්, ගැහුණු කෙනෙක් කළා නම් ඇයට විශාඛා සිටු දුවට ලැබුන මේළ පළඳනාව කියන අති දුර්ලභ ආභරණයත් ලැබෙනවා.

මේළ පළඳනාව කියන ආභරණය සාමාන්‍ය කාන්තාවන්ට දරා ගෙන ඉන්න පුළුවන්කමක් නෑ. ඒක දරාගෙන ඉන්න නම් ඇත්තු පස් දෙනෙක්ගෙ බලයක් ඕන. විශාඛාව, බන්ධුල මල්ලිකා බිසව වගේ දෙතුන් දෙනෙකුට විතරයි ඒ කාලෙ මේළ පළඳනා තිබුණෙ. මොකද ඒ අයට ඇත්තු පස් දෙනෙක්ගෙ බල තියෙන පුණ්‍ය ඍද්ධියක් තිබුණා. රන් රිදී මුතු මැණික් සියල්ලම සම්බන්ධ කරල හදන මේළ පළඳනාව, ඉහේ ඉඳන් පැළඳුවාම දෙපතුලට යන කල්ම වැහෙනවා. ඒ වගේ ශක්තියක් තියෙන කෙනෙකුට හැර වෙනත් කෙනෙකුට ඒ බර දරාගෙන ඉන්න බෑ.

ඉතින් අංගුලිමාල තෙරුණ් වහන්සේට, පෙර කළ පවුවලින් ගැළවෙන්න සාසන උපකාරය ලැබුන ආකාරයත් උන් වහන්සේම කරපු විස්තරයෙන් පැහැදිලි වෙනවා.

යෝ ච පුබ්බේ පමජ්ජිත්වා
පච්ඡා සෝ නප්පමජ්ජති,
සෝමං ලෝකං පභාසෙතී
අබ්භා මුත්තෝව චන්දිමා.

යමෙක් පළමුව ප්‍රමාදයට පැමිණ පසුව අප්‍රමාද වේ ද, හෙතෙම වලායෙන් (වළාකුලින්) මුත් නිසයුරු (සඳ) සෙයින් මෙලොව බබළවයි. යමෙකු විසින් කරන ලද පවුකම් කුසලයෙන් වසනු ලැබේ ද, හෙතෙම වලායෙන් මුත් නිසයුරු සෙයින් මෙලොව බබළවයි. යම් තරුණ මහණෙක් ත්‍රිවිධ ශික්‍ෂායෙහි යුක්ත ප්‍රයුක්ත (යළි යළි යෙදෙන) වේද, හෙතෙම ඒකාන්තයෙන් වලායෙන් මුත් නිසයුරු සෙයින් මෙලොව බබළවයි.

-ථේර ථේරි ගාථා - 213 පිටුව -

උන් වහන්සේගෙ සැනසීමට උන් වහන්සේම දුන්න උපමාව තමයි, අඳුරු වලාකුළු තුලින් සැඟව සිට ඒ වළාකුළු මැඩගෙන එලියට ඇවිත් ලොව බබලවන පසොළොස්වක සඳ. අර අඳුරු වලාකුළුවලට උපමා කළේ, මෙතෙක් කරපු පාප ක්‍රියාවන් සහ ප්‍රමාද වීම. පුන් සඳට උපමා කළේ උන් වහන්සේ පූර්ණ කර ගත් ත්‍රිවිධ ශික්ෂාවෙන් ලැබුන ශාන්තියට, අරිහත් ඵලයට. ඉතින් උන් වහන්සේට කලින් තිබුන ද්වේශය නැති වුන ආකාරයත්, ඉන් පසු ඇති වුන ශාන්තියෙන් නැගුන මෛත්‍රියත් මේ විදියට පැහැදිලි කරනවා.

දිසාපි මේ ධම්මකථං සුණන්තු
දිසාපි මේ යුඤ්ජන්තු බුද්ධසාසනේ,
දිසාපි මේ තේ මනුජේ භජන්තු
යේ ධම්මමේවාදාපෙන්ති සන්තෝ

දිසා හි මේ ඛන්තිවාදානං
අවිරෝධප්පසංසිතං,
සුණන්තු ධම්මං කාලේන
තඤ්ච අනුවිධීයන්තු.

''මාගේ සතුරෝද (මා ඇසූ) ධර්ම කථාව අසත්වා. මාගේ සතුරෝද බුද්ධ සාසනයෙහි යුක්ත ප්‍රයුක්ත වෙත්වා (යෙදෙත්වා). යම් සත් පුරුෂ කෙනෙක් ධර්මයම ගන්වත්ද, මා ගේ සතුරෝද එබඳු මිනිසුන් භජනය කෙරෙත්වා. මාගේ සතුරෝ ක්ෂාන්තිවාදීන්ගේ, මෛත්‍රිය පසස්නවුන්ගේ ධර්මය සුදුසු කල්හි අසත්වා ඒ ද අනුගමනය කෙරෙත්වා.
-ථේර ථේරි ගාථා - 213 පිටුව -

**මේ ශ්‍රී සත් ධර්මයේ ගුණ එහෙමමයි. කෙනෙක් කොච්චර නම් වැරදි කර කර හිටියත්, හේතු වාසනා අනුව මැනවින් ධර්මය අහන්න ලැබුන නම්, ඒ කරුණු අවබෝධ කරගත්ත නම්, කුමන තරාතිරමක හෝ කුමන ජාතියක හෝ ආගමක හෝ කුමන මැරයෙකුට හෝ සිල්වතෙකුට හෝ එයින් සිද්ධ වෙන පරිවර්තනය සුළු පටු නෑ. අංගුලිමාල අරිහතුන් වහන්සේගෙ මේ ගාථාවලින් පැහැදිලි වෙන්නෙ ඒකයි.**

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු සමග ථේර ථේරි ගාථා ඇසුරින් සකස් කළේ:*

**ෆික්රි ඉස්මයිල්**

**පරිගණක ඉංජිනේරු - ගොතටුව**

# ධම්ම පදය තුළින් නිවන් මග

**10 වන කොටස**

ධම්ම පදයේ පාප වර්ගයට අයත් කොටසේ එන පළමු ගාථාව ගැන තමයි මේ විග්‍රහ කරන්නෙ. පාප වර්ගයෙන් කියන්නෙ, කෙනෙක් කරන පින් පවු අනුව මතු භවය සැකසෙන්නෙ කොහොමද, ඒ වගේම ඒවායේ විපාක ලැබෙන්නෙ කොහොමද කියන කාරණා ගැන. බුදුන් වහන්සේ වැඩ හිටිය කාලයේ ඇති වුන සිදුවීම් සහ ඒ ඒ අයට විපාක ලැබුන හැටි අනෙක් ධම්ම පද ගාථා කොටස්වල වගේම මේ කොටසෙත් අඩංගුයි. මේ ගාථාව දේශනා කරන්න මූලික වුනේ දුප්පත් බමුණෙක් සහ බැමිණියක්. මේ දෙන්නටම තිබුනෙ එකම එක සාටකයක්. ඒ කිව්වෙ ගමන් බිමන් යන කොට උඩු කය වැහෙන්න දාන ඇඳුමක්. මේ නැති බැරිකම නිසා එක් කෙනෙක් එළියට යන කොට අනෙක් කෙනා ගෙදර ඉන්නවා. ඉතින් බුදුන් වහන්සේගෙ ධර්ම දේශනා අහන්න එන්න කියල යවන පණිවුඩය මේ බමුණාටත් ලැබුනා. ඒත් දෙන්නටම එකට යන්න විදිහක් නෑ. ඒ නිසා බැමිණිය දවල් වරුවෙ බණ අහන්න යන්නත්, බමුණා රාත්‍රියට බණ අහන්න යන්නත් කතා කර ගත්තා.

මේ විදිහට බමුණා රෑ බණ අහන්න ගිය වෙලාවක බුදුන් වහන්සේ දේශනා කළ ධර්මය අහල මහත් පැහැදීමකට පත් වුනා. කොච්චර පැහැදුනාද කිව්වොත්, ඔහු ළඟ තිබ්බ්ච්ච එකම සාටකය පූජා කරන්න හිතුනා. ඒත් නැවත සිතිවිල්ලක් ආවා, මේක පූජ කළොත් නැවත අපිට එළියට යන්නවත් බැරි වෙයි, ඒ නිසා පූජ කරන්නෙ කොහොමද කියල. ඒත් ශ්‍රද්ධාව මුලට ඇවිත් නැවතත් පූජ කරන්න හිතුනා. ඔය විදිහට වරු තුනක් ගිහින් උදේ වරුව වෙන කොට, නෑ මම මේක බුදුන් වහන්සේට පූජ කරනවා කියල දැඩි තීරණයකට ආවා. එහෙම තීරණය කරල තමන්ට තිබ්බ්ච්ච එකම සාටකය මහත් ශ්‍රද්ධාවෙන් බුදුන් වහන්සේට පූජ කළා. පූජ කළාට පස්සෙ ඉපිල ගිය මහත් සතුටින්, මම දිනුවා මම දිනුවා කියල කෑ ගැහුවා. ඒ වෙලාවෙ එතන හිටපු කොසොල් රජතුමා ඇහුවා, ඇයි අර බමුණා අර විදියට කෑ ගහන්නෙ කියල. කරුණු කාරණා දැන ගත් රජතුමා වටිනා සාටක දෙකක් ඒ බමුණාට තෑගි වශයෙන් දුන්නා. ශ්‍රද්ධාව කොච්චරද කියනව නම්, ඒ සාටක දෙකත් බුදුන් වහන්සේට පූජ කළා. ඔය විදියට ලැබෙන ලැබෙන එක පූජ කළා. අවසානයේ කොසොල් රජතුමා මාලිගාවට ගිහින් මේ බමුණගෙ සත්කාර්ය අගය කරල, හැම එකෙන්ම සාටක 4 බැගින් දෙන සබ්බ චතුෂ්කයක් ලබා දුන්නා.

ඉතින් භික්ෂු සංඝයා අතර මේ බමුණගෙ ක්‍රියාවත්, ඔහුට එවෙලෙම ලැබුන ලාභයත් ගැන කතා වුනා. බුදුන් වහන්සේ ඒ භික්ෂු සංඝයා අතරට වැඩම කරල, කුමක් ගැනද නුඹලා මේ කතා වෙන්නෙ කියල ඇහුවා. ඉතින් භික්ෂුන් වහන්සේලා කතා වුන කාරණය බුදුන් වහන්සේට සැල කර සිටියා. එතකොට උන් වහන්සේ, ඒ බමුණාට දන් දෙන්න සිතිවිල්ල



පහල වුන වෙලාවෙම, ඒ කියන්නෙ පළමු යාමයෙදිම ඒ සාටකය පූජ කළා නම් සියල්ල 16 බැගින් ලැබෙන බවත්, දෙවන යාමයේ පූජ කළා නම් සියල්ල 8 බැගින් ලැබෙන බවත්, නමුත් පූජ කළේ තුන්වන යාමයේ නිසා ඔහුට හැම එකෙන්ම 4 බැගින් ලැබුන බවත් සඳහන් කරල මේ ගාථාව දේශනා කළා.

අභිත්ථරේථ කල්‍යාණේ
- පාපා චිත්තං නිවාරයේ
දන්ධං හි කරෝතෝ පුඤ්ඤං
- පාපස්මිං රමතී මනෝ

සරළ සිංහල තේරුම,

**දාන සීලාදි පින් කිරීමෙහි යුහුසුළු විය යුතුය. සිත පවින් වළකා ගත යුතුය. කවර හෙයින්ද යත්, පින් කිරීමට අලස වන්නහුගේ සිත මසුරු මළ ආදී පවෙහි ඇලෙන හෙයිනි.**

මේ ගාථාවෙන් බුදුන් වහන්සේ භික්ෂුණ් වහන්සේලාට වැදගත් අවවාදයක් දුන්නෙ. දන් දෙන්න, පින් කරන්න හිතෙනව නම්, ඒ මොහොතෙම ඒක කරන්න, පසුවට කල් දාල ඒකෙන් එන විපාකය අඩු කරගන්න එපා කියන එක තමයි ඒ අවවාදය. මේ ගාථාවෙ තේරුම ගත්තත්, ඉක්මනින් යුහුසුළුව ඒ දේවල් කරගන්න කියල තමයි දේශනා කළේ. දැන් මෙතන පාපයක් ගැන කතා කරනවා. කෙනෙකුට හිතෙන්න පුළුවන් පාපයක් වුනේ නැනෙ, තමන් ළඟ තිබුන එකම සාටකය එහෙම නැත්නම් තමන් ප්‍රයෝජනයට ගන්න දෙයක් දෙන්න හිතෙන්නෙ නැති එක පාපයක්ද කියල. එතකොට මෙතන ඇති වුන පව මොකක්ද ?

ඇත්තටම මෙතනදි ඒ බමුණාට ඇතිවුනේ, දෙන්න ගිය දේ වලක්වන සිතක්. අනේ මේක දීල කොහොමද මම එළියට බහින්නෙ ? මමත්වයෙන් මුල් වුන, මගේ කරගත්ත දෙයක් කියන හැඟීම තමයි ආවෙ. දැඩිව අල්ල ගත්ත දෙයක් දෙන්න හිතෙන්න නැති ඒ හැඟීම අයිති වෙන්නෙ ලෝභයට. තමන්ට වැඩක් නැති දෙයක් දෙනව වගේ නෙවෙයි, තමන්ට තියෙන එකම ප්‍රයෝජනවත් දේ දීම හරිම අමාරු දෙයක්. ඇත්තටම එතනදි පාපයට මුල්වෙන හැඟීමක් එන්නෙ. බුද්ධ දේශනාවට අනුව ලෝභය පාප මූලයක්. හැබැයි මෙතන කියන්නෙ අභිද්‍යා කියන දැඩි ලෝභ ස්වභාවය නෙවෙයි, තමන්ට තියෙන ප්‍රයෝජනවත් එකම දේ දෙන්නෙ කොහොමද කියන හැඟීම. ඒකයි පාප මූලයක් කිව්වෙ. ඔතනින් පටන් අරගෙන කිසිම දෙයක් නොදෙන මට්ටමට මනස සැකසෙන්නත් පුළුවන්, මසුරුකමට යන්නත් පුළුවන්, දැඩි ලෝභය කියන පාපකාරී සිතිවිලිවලට මුහුන දෙන්නත් පුළුවන්. ඒකෙන් අපාගත වෙන්නත් පුළුවන්. ඒකයි මෙතනදි ලෝභය පාපයට මුල පටන් ගැන්මක්, එහෙම නැත්නම් අකුසල මූලයක් කියල කිව්වෙ.

දැන් ඒ බමුණා තුන් වන යාමයේදි බුදුන් වහන්සේ කෙරෙහි පැහැදිලා, ඒ එකම සාටකය දෙන්න බලවත් හිතක් පහල වුනා. ඒ වගේම හරිම සතුටකින් ඒක

දෙන්න හිතුනෙ. ජීවමාන බුදුන් වහන්සේ බණ කියන මොහොතක්, උන් වහන්සේගෙ බණ වැටහුන මොහොතක්, ධර්මය දැක්ක මොහොතක්, යමෙක් ධර්මය දකී නම් හේ මා දකී කියන සිද්ධාන්තය වැටහුන මොහොතක්. මා දකී කිව්වෙ, බුදුන් වහන්සේ පුද්ගලත්වයෙන් දකිනවයි කියන එක නෙවෙයි. මහා ගුණස්කන්ධයක් දකින මොහොතක්. ඒක පහළ වුන ඥානයකින්මයි දකින්න ඕන. වෙනත් විදියකින් කියනව නම්, නුවණින් දැක්ක මොහොතක්. ඒ නුවණින් දකින මොහොත එසේ මෙසේ එකක් නෙවෙයි. ඒත් එක්කම ලොකු සතුටක් සොම්නසක් හිතට එනවා. ඒ නුවණින් දැකල සතුටින් සොම්නසින් ඉන්න වෙලාවක එන සිතිවිලිවලට කියනවා, සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත සිත් කියල. සරලව කියනව නම්, ගුණයක් දැකල ගුණයක පිහිටල හිතේ සතුටින්, අනේ මේ මහා උත්තමයෙකුට නේද මම දන් දෙන්නෙ, ඒ නිසා මේ එකම එක සාටකය වුනත් මම දෙනවා කියන සිතිවිල්ල. මේ පින්වතුන්ටත් එහෙම සිත් පෙලවල් පහල වුන අවස්ථා මතක ඇති. කොටින්ම කියනව නම්, බණ අහන මොහොතක, යම් පින්කමක් ගැන විස්තර කරන මොහොතක, එහෙම නැත්නම් පන්සලේ චෛත්‍යය හදන්න ආධාර එකතු කරන මොහොතක, හරිම සතුටින් හිතෙන්න පුළුවන්, අනේ මම මේකට උපරිමයෙන් ආධාර කරනවා, චෛත්‍යය පින්තාරු කරන්න මම බාර ගන්නවා කියල. ඒ මොහොත ඇත්තටම අවංකව සතුටින් හිතට නැගෙන මොහොතක්, හරිම බලවත් මොහොතක්. ඒ නිසයි බුදුන් වහන්සේ දේශනා කළේ, ඒ පළමු යාමයේදිම උන් වහන්සේට මේ සාටකය පූජ කළා නම් හැම දේම දහසය බැගින් ලැබෙනව කියල. ඒතරම් බලවත් සිත් පෙලක්.

නමුත් ඒ සිතිවිල්ල යටපත් කරගෙන දෙවනුව තවත් සිතිවිල්ලක් මේ බමුණාට ගොඩ නැගුනා, අනේ මේක දීල කොහොමද, මට මේක විතරයිනෙ තියෙන්නෙ කියල. හිතට ලෝභයක් ආවා. මට මොකවත් නැතිවෙයිනෙ කියන හැඟීම මිසක්, මට මේකත් ඕන, තියෙන අනෙක්වත් ඕන කියන හැඟීම නෙවෙයි ආවෙ. මොකද ඒකට හේතුව, එකම එක සාටකය නිසා. මේක දුන්නොත් මට නැති වෙයි, මගේ බැමිණියට නැති වෙයි කියන හැඟීම. නමුත් බුදුන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව අඩුවකුත් නෑ. උන් වහන්සේගෙ මහා ගුණස්කන්ධය ගැනත් දන්නවා. ඒත් මට නැති වෙයි කියන හැඟීම නිසා දෙන්න හිතුනෙ නෑ. මේ ජාතියේ සිතිවිල්ලක් එන්නෙ දෘෂ්ටියෙන් තොරව. එහෙම නැත්නම් දිට්ඨි විප්ප යුක්තව. ඇයි එහෙම කිව්වෙ ? මේ බමුණා බණ අහල පැහැදුන සිතෙන් තමයි සාටකය දන් දෙන්න හිතුවෙ. නැවතත් බුදුන් වහන්සේගෙ ගුණ දැක්ක ප්‍රමාණය, සාසන ගුණය දැක්ක ප්‍රමාණය, ධර්මයේ ගුණ දැක්ක ප්‍රමාණය අඩුවක් වුනේ නෑ. ඒත් දෙන්න හිතුනෙ නැත්තෙ, අනේ මේක මගේ ප්‍රයෝජනයට ගන්න එක නෙ, මේක දුන්නොත් අපිට එකක් නැති වෙයි කියන හැඟීම නිසා මිසක්, ගොඩක් ගහ ගන්න, මට මේකත් ඕන අරකත් ඕන කියන හැඟීම නිසා නෙවෙයි.

උපමාවක් කිව්වොත් මාළු අල්ලන මනුස්සයෙක් ඉන්නවා. මේ මනුස්සය මාළු අල්ලන්නෙ තමන්ගෙ දරුවන්ට කන්න බොන්න දෙන්න. හැබැයි ඒක පාපයක් කියලත් දන්නවා. ඒත් නොකර බෑ. ඒක නොකළොත් දරුවන්ට කන්න බොන්න දෙන්න විදිහක් නෑ. ඒ අය පාරට වැටෙනවා. වෙන කරන්න රස්සාවකුත් නෑ. ඒත් ඒක පාපයක් කියල දැන දැන දෙගිඩියාවෙන් කරනවා. එහෙම නැතිව විනෝදෙට සතුටට නෙවෙයි, කරන්න දෙයක් නැතිකමට. ඉතින් හිතේ සතුටක් නැතුව කරන, කරන්න ඕන නිසා කරන, නොකර බැරිකමට කරන, එහෙම නැත්නම් උපේක්ෂා සහගතව කරන, ඒ වගේම පාපයක් කියලත් දන්න නිසා, මේ ජාතියෙ සිතිවිලි දෘෂ්ටියෙන් තොරයි. එහෙම නැත්නම් දිට්ඨි විප්ප යුක්තයි. තමන් වෙනුවෙන් නෙවෙයි කරන්නෙ, දරු පවුල ජීවත් කරවන්න. මේ ජාතියේ සිතිවිලිවලට දහමේ කියන්නෙ, උපේක්ෂා සහගත දිට්ඨි විප්ප යුක්ත සිත් කියල.

මෙහෙම සිතක් තමයි ඒක සාටක බමුණා කියල ප්‍රසිද්ධියට පත්වෙලා හිටපු ඒ බමුණාටත් පහල වුනේ. ඒ නිසා කලින් පහල වුන දන් දීමේ සිත අභිබවා මේ අකුසල මූල සිත පහල වුණා. හරියට කිරි කලයක් දොවල ගොම බින්දුවක් දැම්ම වගේ වැඩක්. ඉතින් දෙන්න හිතෙනවා, නැවත නොදෙන්න හිතෙනවා. ඔහොම එක වරුවක්ම හිතත් එක්ක දෙවන වරුවත් එනකල්ම සටන් කළා. නැවතත් සිතිවිලි පහල වෙනවා, නෑ මේක දන් දෙන්නම ඕන කියල. නැවතත් අර ගොම බින්දුව දැම්ම වගේ කලින් සිතිවිල්ලෙ බලය අඩු වෙනවා. ඉතින් මේ මොහොත එනකොට සිතේ මුල් අවස්ථාවෙ ඇති වුන සිතිවිල්ලට වඩා බොහෝ අඩු සතුටින් එන සිතිවිලි තමයි පහල වෙන්නෙ. ඒකට හේතුව අර ලෝබ සිතිවිලි නිසා සතුටු සිතේ බලය අඩු වීම. ඒ නිසා තමයි බුදුන් වහන්සේ දේශනා කළේ, අඩුම තරමෙ දෙවනි යාමයෙදි මේ සාටකය පූජ කළා නම් සියල්ල 8 බැගින් ලැබෙනව කියල. ඒ සිතිවිලිවල බලය, මුලින්ම පහල වුන දන් දීමේ සිතිවිලිවලට වඩා හරි අඩක්ම අඩු වෙලා. හැබැයි මෙහෙම කියන්න පුළුවන් ලොව්තුරා බුදුන් වහන්සේ නමකට විතරයි. ඒ උන් වහන්සේට තියෙන ෂඩ් අසාධාරණ ඥාන නිසා. වෙන කෙනෙකුට බාහිරින් බලල කියන්න පුළුවන්, ඉතින් කොයි මොහොතෙ හරි දුන්නනෙ ඇයි අර ලැබිච්ච දේ බාගෙටම අඩු වෙලා ලැබුනෙ කියල.

උපමාවකින් කියනව නම්, හරියට අළුතින් ගත්ත තණ කොළ කපන කතුරක් වගේ. මුලින් හොඳට මුවහත තියෙනවා, දිලිසෙනවා. ඒ වෙලාවෙම තණ කොළ කැපුවොත් කිසිම අමාරුවක් නැතුව කපන්න පුළුවන්. ඊට පස්සෙ මාසයක් විතර යන කොට අර දිලිසෙන ගතිය අඩු වෙනවා, මුවහත අඩු වෙනවා, ටික ටික මළ බැඳෙනවා. දැන් තණ කොළ කැපුවොත් මුලින් වගේ කැපෙයිද? නෑ, ඒත් තණ කොළ කපන්න පුළුවන්. තවත් මාසයක් ගියොත් අර දෙවනි මාසය තරම්වත් කපන්න බෑ. ඉතින් මළකඩ නිසා කලින් තරම් මුවහත් නෑ. අපේ හිතත් ඒ වගේ. දන් දෙන්න මුලින් පහළ වෙන සිතිවිල්ල ශ්‍රද්ධාව නිසාමයි එන්නෙ. ඒක හරිම බලවත්. ටික ටික අර කතුර මළ කෑව වගේ ලෝභයෙන් මළ බැඳෙන්න පුළුවන්. ඒ ලෝභ මළ නිසා ඊළඟට පහල වෙන, දීමේ සිතිවිලිවල බලය අඩු වෙනවා. තණ කොළ කපන කතුර මළ සුද්ධ කරල ගත්තොත් නැවත යථා තත්වයට පත් කරන්න පුළුවන් වගේ, මහත් පරිශ්‍රමයක් දරල හිතේ කෙළෙස් මළත් සුද්ධ කරගෙන නැවතත් අර සිතිවිලි බලවත් කරගන්න පුළුවන්. හැබැයි ඒක ලේසි නෑ. ඒකයි කිව්වෙ යුහුසුළුව, හිතුන මොහොතෙම පින් කරගන්න කියල.

මේ වගේ දෙයක් තමයි ඒක සාටක බමුණාටත් සිද්ධ වුණේ. ලෝභ මළෙන් සිත වැහීගෙන ගියා. දෙවන වරුවෙත් සටන් කළා. නැවත නැවත සිතිවිලි ගොඩ නැගුවා. අන්තිමට, නෑ මේක මම දෙනවාමයි කියල නැගී හිටල පූජ කළා. ඉතින් ඒකෙන් ඇති වුන සතුට නිසාමයි, මම දිනුවා මම දිනුවා කියල කෑ ගැහුවෙ. හැබැයි එතකොටත් වරු තුනක් ගිහින් ඉවරයි. අර 16 බැගින් ලැබෙන්න තිබිච්ච දේ 4 බැගින් ලැබෙන තැනට අඩු වුණා. ඒ නිසා තේරුම් ගන්න ඕන, ලෝභය කියන අකුසල මූලය කොච්චර බලවත්ද කියල. ඒ ලෝභය මහත් ලැබීමක් නැති කරනව වගේම, වැඩි වැඩියෙන් ලෝභ සිතිවිලි පහල වුනොත් අපාගත වීමට පවා බලවත් අභිද්‍යා කියන කොටසට වැටෙන්න පුළුවන්.

ඇත්තටම බැලුවොත්, මේ වගේ සිද්ධිවලට අපි හැමෝම වගේ මුහුණ

# ලෝ සතට කළ අවැඩ අසාධාරණයන්ට වන්දි ගෙවා නිදහස් වෙන හැටි..

මේ සංසාර ගමනේ සැරිසරන ලෝක සත්වයා කරන, කියන, හිතන දේවල් අනුව කර්මානුරූපීව විවිධ අත්බැව්වල විවිධාකාරයෙන් උප්පත්තිය ලබනවා. විටෙක තිරිසන් වෙලා, තවත් විටෙක මනුස්ස වෙලා, තවත් විටෙක දේව අත්බැව්වල ආදී වශයෙන් මේ තිස් එක් තලයේ සැරිසරනවා. මනුස්ස වෙලා ඉපදුණත් දුප්පත්, පොහොසත්, දුශ්චරිත, සුචරිත... ආදී විවිධාකාරයෙන් උපත ලබපු වාර ගණන් කරන්න බැරි තරම් අප්‍රමාණයි. මෙහෙම විවිධ අත්බැව්වල විවිධාකාරයෙන් උපත ලබපු වාර ගණන් කරන්න බැරි තරම් අප්‍රමාණයි කියල බුදුන් වහන්සේ විවිධ අවස්ථාවල පෙන්වා දීල තියෙනවා. එහෙම ඉපදිලා තම තමන් අතින් අන්‍ය සත්වයින්ට විවිධාකාරයෙන් සිදු වුණ අවැඩ අසාධාරණ හිංගි හිංසා, ප්‍රමාණයෙන් බැලුවොත් කෙළවරක් නෑ. කිසියම් අත්බවයක/අත්බැව්වල තමන් අතින් යම් කිසි කෙනෙකුට හිංගියක් හිංසාවක් වුණා කියන්නෙ, තමන් කාට හරි කරපු අවැඩක් අසාධාරණයක්. දස අකුසල් මුල් කර ගෙන කර්මයකින් හෝ කර්ම පථයකින් හෝ අවැඩක් අසාධාරණයක් කළා නම්, විපාක වශයෙන් පාප විපාකයක් විඳින්න සිද්ධ වෙනවා.



විපාකයක් ගෙවිල යන ක්‍රම 2 ක් තියෙනවා. එක ක්‍රමයක් තමයි විඳවලම ගෙවීම. ඒ කියන්නෙ, මොන විදියකින් හරි ඒ කරපු අවැඩට අසාධාරණයට ඒ විපාකය විඳල අවසන් කළාම ලෝක සත්වයන්ට වන්දි ගෙවිල අවසන් වෙනවා. ඊට පස්සෙ ඒ පාප කර්මය නැවත වාරයක් විපාක වශයෙන් එන්නෙ නෑ. අනෙක් ක්‍රමය තමයි සිදු වුණ අවැඩට අසාධාරණයට වන්දි ගෙවල නිදහස් වීම. ඒ කියන්නෙ මෙත් වැඩීමෙන්, සෙත් කිරීමෙන්, සැදැහැ සිතින් සාසනය උදෙසා දාන මාන දීමෙන්, පිං අනුමෝදන් කිරීමෙන්.... ආදී ක්‍රමවලින් වන්දි ගෙවල නිදහස් වෙන්න හැකියාවක් තියෙනවා. වන්දියක් කියන්නෙ මුළු ලෝකයටම තමන් අතින් සිද්ධ වුණ අවැඩක් / අසාධාරණයක්. තමන් අතින් කාට හරි අවැඩක් අසාධාරණයක් සිද්ධ වුණාම, තමන් හිතන් ඉන්නෙ ඒ පුද්ගලයට විතරක් තමන් අතින් අවැඩක් අසාධාරණයක් සිද්ධ වුණා කියල. නමුත් තමන් තුළ දූෂ්‍ය මානසිකත්වයක් ගොඩ නැගුණොත්, ඒ දූෂ්‍ය හිතෙන් නිකුත් වෙන චිත්ත කිරණ ධාරාවන් මුළු විශ්වයටම බලපානවා, මුළු විශ්වයටම විනාසයක් කරන්න

දීල ඇති. භික්ෂූන් වහන්සේ නමක් දානයේ ගුණ කියන කොට, සාසනයේ ගුණ කියන කොට අප්‍රමාණ සතුටක් හිතට එනවා. අනේ මට සිවුරක් පූජ කරන්න ඕන, අට පිරිකරක් පූජ කරන්න ඕන කියල සිතිවිල්ලක් එනවා. ඉතින් පැනල දානයක් බාර ගන්නවා. දන් හැම දේම අවංකව කරන්නෙ. ගෙදර ගියාම මොකද වෙන්නෙ, ඒ අදහසට විරුද්ධව වෙන වෙන සිතිවිලි එනවා. ''ආ ..... ඒක කළොත් පොඩි එකාගෙ පන්තියට සල්ලි ගෙවන්න බැරි වෙනවා. එතකොට අපි ගන්න හිටිය දේ ගන්න බැරි වෙනවා. අපරාදෙ බාර ගත්තෙ, හාල් කිලෝ 10 ක් දෙන්න පොරොන්දු වුනාට 5 ක් වගේ තමයි දෙන්න වෙන්නෙ. 10 ක් දුන්නොත් අනෙක් වැඩ ටික කරගන්න බැරි වෙයි.'' මේක හුඟක් අයට තියෙන පොදු ප්‍රශ්නයක්. නමුත් අර වෙලාවෙ ආපු චිත්ත ප්‍රසාදයට, සතුට වැඩිකමට පොරොන්දු වෙනවා. ඒ මොහොතෙ තමයි නුවණින් කල්පනා කරන්න ඕන. ''හරි මට දෙන්න හිතුන තමයි, ඒත් මට පුළුවන් ප්‍රමාණයක් තියෙනවා, ඒක මම උපරිමයෙන් දෙනවා.'' මෙතනදි බුදුන් වහන්සේ අනේපිඬු සිටුතුමාට දුන්න අවවාදයත්, උපදෙසත් අපිටත් හිතට ගන්න පුළුවන්.

අනේපිඬු සිටුතුමා දන් දීලම මුළු සේසතම නැති වුණා. ඒත් දන් දීමේ සිතිවිල්ල අත් හැරියෙ නෑ. පුළුවන් හැටියට දුන්නා. ඒත් හරිම කනස්සල්ලෙන් හිටියෙ. ''අනේ කලින් වගේ මට ඕන ඕන විදිහට දන් දෙන්න බෑනෙ. තිබ්ච්ච සේසතම ඉවර වුනා. ප්‍රණීතයෙන් දන් දෙන්න විදිහක් නෑ.'' ඔය ජාතියේ සිතිවිලිවලින් පිරිල හිටියෙ. මේක බුදුන් වහන්සේගෙ මහා කරුණා ඥානයට හසුවුණා. ඒ අනුව දානයේ වටිනාකම කියල සිටුතුමාට උපදෙසක් දුන්නා. උන් වහන්සේ සිටුතුමා බැහැ දැකල මෙහෙම ඇහුවා. සිටුවරය ඔබේ නිවසේ පෙර සේම දැනුත් දන් දෙන්නේද ? ස්වාමීනි, එසේය දන් දෙමි, එහෙත් ඒ දෙන්නෙ නිවුඩු හාලේ බත් කාඩි හොදිත් එක්ක. ඉතින් නැවතත් බුදුන් වහන්සේ දේශනා කරනවා, **ගෘහපතිය ඔබ කටුක ලෙස දන් දෙන්නෙමියි නොසිතව, සිතේ ප්‍රණීත බව ඇත්නම් බුද්ධාදීන්ට දෙන දානයක් කටුක නොවෙයි, මන්ද එය අෂ්ටාර්ය පුද්ගලයන්ට දෙන දානයක් නිසා.**

දන් දෙන්නම, ඇප උපස්ථාන කරන්නම පාරමිතා පුරාගෙන ආපු කෙනෙක් නිසා අනේපිඬු සිටුතුමා ඒ විදිහට අධිෂ්ඨාන කරල සියල්ලම දන් දුන්නා. අන්තිමට ඒ පුණ්‍ය සෘද්ධිය නැගිල ඇවිත් කලින්ටත් වඩා සම්පත්තිය වැඩි වුණා.

දන් මෙතනින් පැහැදිලි වෙන කාරණයක් තමයි සිතේ ඇතිවන ප්‍රනීත බව. සිතේ ඇතිවෙන සිතිවිලි ප්‍රනීත, මධ්‍යම සහ හීන කියල කොටස් තුනකට බෙදෙනවා. හීන කියල ගන්නෙ, සිතට එන පාපකාරී සිතිවිලි. මධ්‍යම කියල ගන්නෙ සතුන්ට, දුප්පතුන්ට කන්න බොන්න දෙන්න ඕන කියන මේ ආදී සිතිවිලි. ගුණයක් දැකල, ගුණයක පිහිටල උත්තමයන්ට කරන පූජා සත්කාර, දන් දීම් ආදියට මුල් වෙන සිතිවිලි ප්‍රනීත හැටියට ගන්නවා. අර මුලින් සඳහන් කරපු බමුණගෙ සිතේ ඇති වුන ප්‍රනීත බව ටිකෙන් ටික අඩු වෙලා ගිහින්, ලැබුන විපාක අඩු වුන හැටි පැහැදිලි වෙනවා.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු සමග ධම්මපද පාලිය - පාප වග්ගය ඇසුරින් සකස් කළේ:*

**ෆික්රි ඉස්මයිල්**
**පරිගණක ඉංජිනේරු - ගොතටුව**

හේතු වෙනවා. සුළුවෙන් හෝ කෙනෙකුට බනින කොට ඒ අවස්ථාවෙදි ඇති වෙන දූෂ්‍ය මානසිකත්වය මේ විශ්වයටම සාපයක් ගොඩ නගන්න හේතු වෙනවා. ඒ කියන්නෙ, කෙනෙකුට එක වරක් දූෂ්‍ය මානසිකත්වයකින් බැන්නොත්, ඒ බනිනකොට පිටවෙන දූෂ්‍ය චිත්ත කිරණ ධාරාවන් පැතිරිලා මුළු විශ්වයටම අවැඩක් කළා වෙනවා. මේ නිසා එක වරක් කාට හරි ද්වේශ සහගතව බැනීම නිසා ඒකෙ වන්දිය ගෙවන්න ගියොත්, ගෙවල ඉවර කරන්න බැරි තරම් වෙනවා.

ඒ විදියට ලෝකයට කරන අවැඩ / අසාධාරණ, එක දේකට විතරක් බලපාන්නෙ නෑ. පැත්තකින් අපි කන බොන ආහාර පාන පවා දූෂ්‍ය වෙන්න බලපානවා. අපි ඇසුරු කරන පරිසරය දූෂණය වෙන්නත්, විස වෙන්නත් බලපානවා. නමුත් අපිට මේ කිසිම දෙයක් දැනෙන්නෙ නෑ. එහෙම වෙන්නෙ, සාප කරන උදවිය වගේම මෙත් වඩන උදවියත්, සෙත් කරන උදවියත් මේ ලෝකයේ ඉන්න නිසා. මෙත් වඩන, සෙත් කරන උදවියගෙන් ශාන්තියක් විහිදෙන නිසා, අර සාප කරන උදවියගෙ සාපය එක්තරා ආකාරයකින් මැඩ පැවැත්වෙනවා. කෙනෙක් ''ඕකාට හෙණ ගහපං ඕකා හැඳි ගැව්ලාම පලයන්....'' ආදී වශයෙන් කියන කොට, ඒ අවස්ථාවෙදි මහා දූෂ්‍ය අන්දමින් කිරණ පිටවෙනවා. ඒ කිරණ ශක්තිය කොච්චරද කියනව නම්, මේ ලෝකෙ ගිනි අරගෙන විනාස වෙන්න හැකියාව පවා ඒ දූෂ්‍ය කිරණ ශක්තිය තුළ තියෙනවා. ඒ තරම් විනාසයක් කරන්න පුළුවන් බලයක් ඒ දූෂ්‍ය කිරණවලින් විහිදෙනවා.

පොදු ලෝකය තුළ පොදු ප්‍රතිඵලය හැමෝටම භුක්ති විඳින්න වෙන නිසා, දූෂ්‍ය කිරණ සහ සෙත් කිරණවල සම්මිශ්‍රණය මගින් සිදු වන බලපෑම හැමෝටම පොදුවේ විඳින්න සිද්ධ වෙනවා. ඒ කියන්නෙ **ලෝකයට සෙත් පතන උදවියගෙන් සහ ලෝකයට දූෂ්‍ය කිරණ මගින් අවැඩ අසාධාරණ කරන උදවියගෙන් නිකුත් වෙන කිරණවල සම්මිශ්‍රණයේ බලපෑමට සමස්ත ලෝක සත්වයාටම මුහුණ දෙන්න සිද්ධ වෙනවා.** උදාහරණයක් විදියට කෙනෙක් ''හෙණ ගහපං'' කියන කොට, තව කෙනෙක් ''සියලු සත්වයින්ටම යහපතක් වේවා'' කියල පතනවා. මෙහෙම එක් කෙනෙක් සෙත් කරන කොට නැගෙන බලය නිසා, දූෂ්‍ය මානසිකත්වයකින් නැගෙන වස් කැපෙනවා. ඒ නිසා දූෂ්‍ය කිරණවල බලය බොහෝ දුරට මෙල්ල වෙනවා. නමුත් ලෝකයට කළ අවැඩ අසාධාරණය සඳහා සෙත් කිරීමේ කටයුත්තට කවුරු හරි කර ගහන්න ඕන. දූෂ්‍ය කිරණවල විස බිඳෙන්න සෙත් කරන්නම ඕන නිසා, එහෙම සෙත් කරන එකත් ලෙහෙසි පහසු නෑ. ඉතින් සාප කරන උදවියගෙ සාප කපන්න වගේම, ශාන්තිය ගොඩ නගන්න ගියාමත්, එහෙම සෙත් කරන උතුමන් පවා මහත් වෙහෙසට පත් වෙනවා. හැබැයි අර සාප කරල විස කිරණ ලෝකයට පතුරවන උදවියට මේ හැම දේකම වන්දිය ගෙවන්න වෙනවා. මම එක් කෙනෙකුට විතරයි බැන්නෙ, අනිත් අයට බැන්නෙ නෑ කියල කෙනෙකුට කියන්න පුළුවන් වුණාට, ඒ බැනපු එකෙන් තමන් ලෝකයටම අවැඩක් අසාධාරණයක් කළා කියල තමන් දන්නෙ නෑ. ඒකෙන් දස දහසක් සක්වල ඉන්න සියලු සත්වයින්ටම කරදරයක්, අවැඩක් වෙන්න හැකියාව තියෙනවා. ඉතින් ඒ නිසා තමන් දැනුවත්ව හෝ නොදැනුවත්ව හෝ ලෝකයට සිද්ධ කරපු අවැඩ අසාධාරණයට වන්දි තමයි මේ පාප විදියට ගෙවන්නෙ කියල අවබෝධ කර ගන්න බොදුනුවන්ට හැකියාව තියෙන්න ඕන.

මේ ආකාරයට ලෝකයට සිද්ධ වෙච්ච අයහපත් කර්මවලින් මිදෙන්න නම්, ඒ බැන්න පුද්ගලයට හෝ සත්ත්වයාට විතරක් වන්දි ගෙවල හරි යන්නෙ නෑ. ඒ විදියට අවැඩ අසාධාරණ වෙච්ච සියලු ලෝක සත්වයින්ටම වන්දි ගෙවන්න ඕන. එහෙනම් ''සියලු ලෝක සත්වයින්ට යහපතක් ශාන්තියක් වේවා'' කියල පතල මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා කියන සතර බ්‍රහ්ම ගුණයන්ගෙන් යුක්තව මෙත්තා සහගත මනෝ කර්ම, කාය කර්ම, වචී කර්ම හිතෙන්, කයෙන්, වචනයෙන් කියන තුන් ද්වාරයෙන්ම සිද්ධ කළොත්, ලෝකයට සිද්ධ වෙච්ච අවැඩ අසාධාරණයට වන්දි ගෙවන්න පුළුවන්කමක් ලැබෙනවා. එහෙම කළොත් ඒ ශාන්තිය සියලු සත්වයින් කරා විහිදිලා පැතිරිලා යනවා. සාප කිරීමකින් යම් කිසි අවැඩක් අසාධාරණයක් වෙලා තිබුණ නම්, ඒ විදිහට සෙත් කිරීමෙන් ලබන්නා වූ යහපත නිසා යම් දවසක සිදු වුණා වූ අවැඩට, අසාධාරණයට වන්දි ගෙවෙනවා. තම තමන්ගෙන් වෙච්ච අවැඩට අසාධාරණයට ණය ගෙව්වොත් තව දුරටත් ණය කාරයෙක් වෙන්නෙ නෑ. ඒ නිසා මෙත් වඩන ක්‍රමය නිවැරදිව දැන ගන්න ඕන.

ඇතැම් උදවිය මෛත්‍රී කර්මස්ථානය වඩල විවිධ අත්තනෝ මත පටලවා ගෙන, මිථ්‍යා දෘෂ්ටික උදවියට පිං දෙන්න එපා, පිං දුන්නොත් කරදර ඇති වෙනවා, ඒ නිසා සම්‍යක් දෘෂ්ටික දෙවි දේවතාවන්ට විතරක් පිං දෙන්න කියල සාමාන්‍ය උදවියට උපදෙස් දෙනවා. දැන් මෙහෙම කළාම මෙත් වඩනව කියන එක, කොටසකට විතරක් සීමා වෙනවා. **සියලු සත්වයින්ට මෙත් වඩනව කිව්වම, එතැන සම්‍යක් දෘෂ්ටික / මිථ්‍යා දෘෂ්ටික කියල වෙන් කර කර මෙත් වඩන සිරිතක් බුදු දහමෙ නෑ.** සියලු සත්වයින්ටම පොදුවේ මෙත් වඩන්න ඕන. මිථ්‍යා දෘෂ්ටික උදවියට පිං දෙන්න එපා කියන උදවියගෙන් ඒ ඇයි කියල ඇහුවොත්, මිථ්‍යා දෘෂ්ටික උදවිය පිං අරගෙන බලවත් වෙලා අපිට විණ කරයි, සම්‍යක් දෘෂ්ටික උදවියට පිං දුන්නොත් ඒ අය අපිට උදව් කරයි කියල කියනවා. ඒ කියන්නෙ ඒ අය කටයුතු කරල තියෙන්නෙ උදව් ලබා දෙන උදවියගෙන් උදව් ගන්නයි, උදව් නොදෙන උදවියව අයින් කර ගන්නයි විතරයි. එහෙම වාසියට විතරක් පිං දෙන ක්‍රමයක් බුදු දහමෙ නෑ. එහෙම කළාම ඒක බුදු දහමට ගැලපෙන්නෙ නෑ. බුදු දහමෙ මෙත් සිත පතුරවනව කියන්නෙ මුළු ලෝක සත්වයාටම මෙත් පැතිරවීම. ඒ නිසා ඒක පැහැදිලිව නිවැරදිව අවබෝධ කරගන්න බොදුනුවන්ට පුළුවන් වෙන්න ඕන.

මිථ්‍යා දෘෂ්ටික උදවියට පිං දෙන්න එපා කියන දේශකයන්ගෙ ආරම්භය බැලුවොත්, ඔවුන් කිසියම් වූ වෛරයකින් පසු වෙන උදවිය. හැබැයි ඒ ආරම්භය අද ඊයෙම නෙවෙයි, පෙර අත්බවයක වෙච්ච දෙයක් වෙන්නත් පුළුවන්. ඔවුන්ට කර්මානුරූපීව ලෙඩක් දුකක් කරදරයක් ඇති වෙලා දේවාලයකට ගිහින් පූජා වට්ටියක් පූජා කළත්, වැඩේ කෙරුනෙ නැති නිසා තව තවත් දෙවියන්ට කන්නලව් කරල, ඒත් තමන්ගෙ ලෙඩේ සුව වුණේ නැති නිසා ඔවුන් එකෙක්වත් මට පිහිට වුණේ නැහැනෙ කියල එක විදියක වෛරයක් හට ගන්නවා. ඊට පස්සෙ කවද හරි දවසක තමන්ට දේශකයෙක් වෙන්න අවස්ථාව ලැබුණම, අනිත් උදවියට කියල දෙන්නෙත් ඒ දෘෂ්ටියේ ඉඳගෙන. තමන්ට මෙන්න මෙහෙම කරදරයක් ආපු වෙලාවෙ ඔය දෙව්වරු උදව් කළේ නෑ, ඔවුන්ට පිං දෙන්න එපා කියල අනිත් උදවියත් මුලාවෙ දානවා. තමන්ගෙ අත්දැකීම හරිද වැරදිද කියල හොයල බලන්නෙත් නැතුව, ඒ අත්දැකීම එහෙම් පිටින්ම අනික් උදවියගෙ මානසිකත්වයට දානවා. ඒකෙන් කර ගන්නෙ ලොකු විනාසයක් කියල ඒ අය දන්නෙ නෑ.

උදාහරණයක් විදියට බෞද්ධයෝ සම්‍යක් දෘෂ්ටිකයි, මුස්ලිම් උදවිය මිථ්‍යා දෘෂ්ටිකයි කියල සමහර උදවිය වෙන් කරනවා. එක මුස්ලිම් මුදලාලි කෙනෙක්ගෙ කඩෙන් බෞද්ධයෙක් (නාමික) ණයට බඩු ටිකක් ඉල්ල ගන්නවා. ඒ කියන්නෙ ඒ බෞද්ධයා මුස්ලිම් මුදලාලිට ණයයි. ඊට පස්සෙ ඒ නාමික බෞද්ධයා මේ ණය හිතා මතාම ගෙවන්නෙ නැතුව ඉන්න කාලය අතර තුරදී, අර මුස්ලිම් මුදලාලි මියයනවා.

එහෙම මියගිහින් භූතයෙක් වෙලා හරි ඉපදිලා මේ නාමික බෞද්ධයාව දැක්කොත්, අර බෞද්ධයා මට ණයයිනෙ, මේකා මගෙන් මෙච්චර මුදල් ප්‍රමාණයක බදු අරන් ගියා ගෙව්වෙ නැනෙ කියල, දෙන කල් බලාගෙන ඉන්නවා. දැන් මේ නාමික බෞද්ධයා, මිථ්‍යා දෘෂ්ටිකයින්ට තමන් පිං දෙන්නෙ නෑ කිව්වත්, තමන් ඒ මුස්ලිම් මුදලාලිට වෙච්ච ණය ගෙවන්න බැඳිල ඉන්නවා. මුස්ලිම් මුදලාලිත් භූතයෙක් වෙලා හරි බලන් ඉන්නෙ තමන්ගෙන් ගත්ත ණය ගෙවනකල්.

දැන් මේ වගේ සිද්ධියකදි අර නාමික බෞද්ධයගෙ, මිථ්‍යා දෘෂ්ටිකයින්ට තමන් පිං දෙන්නෙ නෑ කියන සිතිවිල්ල නිසා ඒ ණය කවදාවත් ගෙවල ඉවර කරන්න බැරි වෙනවා. ඒ වගේම මුස්ලිම් මුදලාලි මැරිල නෑ කියල හිතුවොත් සහ මේ බෞද්ධ මනුස්සයා මුස්ලිම් මුදලාලිට වෙච්ච ණය මුදල රුපියල් දාහයි කියල හිතුවොත්, සාසනය වෙනුවෙන් උදව් උපකාර කිරීම මේ සසරෙ සිදු වුණා වූ ණය ගෙවා ගන්න තියෙන හොඳ ක්‍රමයක් නිසා, අර බෞද්ධ මනුස්සය මුදලාලිට වෙච්ච රුපියල් දාහක ණය මුදල ගෙවන්නෙ නැතුව පන්සලේ දාගැබ හදන්න රුපියල් දාහක් පූජ කරනවා. මුදලාලි දවසක් මේ බෞද්ධයාව හමු වෙලා තමන්ගෙ ණය මුදල ගැන අහන කොට ඔහු කියනවා, ආ.. ඒ ණය පියවලා කොච්චර කල්ද, මම පන්සලේ චෛත්‍යය හදන්න රුපියල් දාහක් දුන්නනෙ කියල. දැන් සිද්ධ වෙලා තියෙන්නෙ ණය පියවීමක් නෙවෙයි. චෛත්‍යය හදන්න දුන්න රුපියල් දාහෙ පින එකක්. ඒකෙන් මුදලාලිට වෙච්ච ණය පියවෙන්නෙ නෑ. ඒ සඳහා මුදලාලිට වෙනම ණය ගෙවන්න ඕන. එතකොට තමයි ඒ ණයෙන් නිදහස් වෙන්න පුළුවන් වෙන්නෙ. මොකද දැනට තියෙන ලෝක සම්මතයේ ඒ අයගෙ දෘෂ්ටිය අනුව, ඒ වගේ බෞද්ධ ක්‍රමයේ පිනකින් ණය පියවීමක් මුස්ලිම් මුදලාලි බලාපොරොත්තු වෙන්නෙ නෑ.

ඉතින් මේ නිසා යම් කිසි ණයක් ගෙවන ක්‍රමයක් තියෙනවා. පිං දහම් කරල ණය ගෙවන්න පුළුවන් ක්‍රමයකුත් තියෙනවා. අපට නොපෙනෙන සියුම් ලෝකවල ඉන්න උදවියට ඒ ඒ මොහොතෙ අවශ්‍ය කරන ආහාර, ඉඳුම් හිටුම් වගේම ලෞකික දේවලුත් මැවිල යන ක්‍රමවේදයක් තියෙනවා. ඒ නිසා ඒවාට අවශ්‍ය කරන්නා වූ දේවල් ලැබෙන ක්‍රමයක් තමයි මේ බුද්ධ පූජා උපහාර ක්‍රමය. මේ සම්බන්ධව විවිධ උදවියගෙ විවිධ මත තියෙනවා. ඇයි මේ පිළිමවලට ආහාර පූජ කරන්නෙ, පිළිමෙ බත් කනවද, ඇයි පිළිමවලට බෙහෙත් ද්‍රව්‍ය තියන්නෙ, පිළිමෙට ලෙඩ හැදෙනවද... ආදී වශයෙන් මත එල කරන උදවිය තවමත් සමාජයේ ඉන්නවා. නමුත් චේතනාව තුළින් පිං දහම් රැස් වෙන ආකාරය පිළිබඳව ඒ මත ඉදිරිපත් කරන උදවිය දන්නෙ නෑ. චේතනාව මූලික කරගෙන, චිත්ත ප්‍රසාදය මූලික කරගෙන පිනක් ගොඩ නැගෙන හැටි, ඒ සඳහා බුද්ධ කාලයේ උදාහරණ සහිතව පසුගිය 40 වන කලාපයේ ''චිත්ත ප්‍රසාදය මුල් කරගෙන සිදු කරන පූජාවන්ගේ වැදගත්කම'' කියන ලිපියෙන් වැඩිදුර විස්තර කළා.

ඇත්ත වශයෙන්ම කාටවත් දුන්න දෙයකින් කොහොමද තමන්ට ලැබෙන්නෙ කියල දැන ගෙන ඉන්න ඕන. අපි යම් කිසි ලැබීමකට හිමිකාරයො වෙලා ඉන්නව නම්, ඒ කාටවත් දීපු නිසාම විතරක්



නෙවෙයි, අපේ පැවැත්මේ උරුමයත් ඒකයි. මනුස්සයෙක් වෙලා ඉපදුණා නම්, මනුස්සයෙකුට හිමි යම් ආහාරයක් ඇත්ද ඒ පුද්ගලයටත් ඒක උරුම වෙනවා. මනුස්සයෙක් වෙන්න යම් කිසි පිනක් කළා නම්, ඒ පිනේ ඊට අවශ්‍ය සියලු කාරණා, පෝෂණයන් ගැබ් වෙලා තියෙනවා. එහෙම වෙන්නෙ කාටවත් දීපු දෙයක් නිසා නෙවෙයි. ඒ තමයි ප්‍රසන්න චිත්ත ප්‍රසාද මනසේ හැටි. ප්‍රසන්න මනසකින් උපන් උදවියට තමන්ගෙ පිනට හිමි ආහාරය ලැබුණම ඒක උදුර ගන්න, තමන්ගෙ කර ගන්න අනෙක් උදවිය දඟලනවා. මේ නිසා ලෝකෙ තියෙන අනුන්ගෙ දේවල්, තණ්හාව නිසා තමන්ගෙ කියල මනුස්සයො කාලයක් පුරාවට පොදි ගහ ගත්තා. මනුස්සයින්ට ස්වභාවිකව ලැබෙන්න තිබුණ ඒ ලැබීම, එහෙම පොදි ගහ ගත්ත නිසාම පිරිහුණා. දානයක් දුන්නම ලැබෙනව කියල කියන්නෙ, ඒ විදිහට පොදි ගහ ගත්ත දේවල් ආපහු දීල සාධාරණත්වයට පත් වෙන කොට අපේ නියම උරුමය මතු වෙලා ඒම. ඒකට තමයි දීමෙන් ලැබෙනව කියල කියන්නෙ.

මම, මගේ කියල අල්ල ගත්ත ගොඩ තුළ, පොදු පරිහරණයට තියෙන ලෝකයත් තමන්ගෙ කියල තමයි මේ ලෝක සත්වයා හිතා ගෙන ඉන්නෙ. එහෙම අයිතිවාසිකමක් ලැබුනෙ කොහොමද කියල හොයල බැලුවොත්, ඒකත් තමන්ම ගොඩ නගා ගත්ත දෘෂ්ටියක් තුළ ඉඳගෙන තමන් විසින්ම පිරිසක් සමග එකතු වෙලා කවද හරි දවසක සම්මත කර ගත්ත දෙයක්. දැන් මෙහෙම සම්මත කර ගත්තෙ, තිරිසන් සතුන් පවා නිදහසේ ජීවත් වුණ ලෝකය. සියලු සත්වයින්ට පොදු ලෝකය තුළ, මනුස්සයා හැකියාවෙන් බලවත් නිසා, මාන්නයෙන් උස් කර ගත් නිසා අනික් සතුන්ව තුට්ටුවකට මායිම් කරන්නෙ නැතුව, ඒ සතුන්ගෙ අයිතිවාසිකම් පැත්තකට දාල මිනිස්සු විතරක්, මේ කොටස උරුම මට මේ කොටස මගේ කියල වෙන් කර ගෙන සම්මත කරගෙන ඔප්පු තිරප්පු හදා ගත්තා. ඊට අදාළ නීතිත් හදාගෙන රජයකුත් හදාගෙන රජයෙන්ම සම්මත කර ගත්තා. දැන් මෙහෙම සම්මත කර ගත්ත වැඩ පිළිවෙළ දිහා බැලුවොත්, ඇත්තටම සාධාරණය ඉෂ්ට වෙලා නෑ. ලෝක සත්වයාටම පොදු දේ මිනිස්සුන්ට ඕන විදියට සම්මත කර ගන්න මිනිස්සුන්ට අයිතිවාසිකමක් නෑ.

දැන් මේ අසාධාරණය මුලින්ම සිද්ධ කරල තියෙන්නෙ මේ මනුස්සයොම තමයි කියල පැහැදිලියි. අපි මේවා බොහොම සාධාරණව, නීත්‍යානුකූලව දහඩිය මහන්සියෙන් හරි හම්බ කර ගත්ත දේවල් කියල කිව්වට, මේ අසාධාරණය මුලින්ම සිද්ධ කරල තියෙන්නෙත් අපිමයි. හැබැයි ඒක දැන් කඩන්න බැරි ලෝක සම්මතයක් වෙලා ඉවරයි. මේ වෙච්ච දේ දැන ගත්තට, ඒක නැති කරන්න පුළුවන් කමක් අපට නෑ. නමුත් අපි ඉන්න කොටස තුළ යම් කිසි සත්වයෙක්ගෙ/ සත්ව කොට්ඨාසයකගෙ උරුම කොටසකුත් තියෙනව කියල අපි දැන් දන්නවා. ඒ නිසා අපි අපේ කොටස විතරක් අරගෙන ඒ උදවියගෙ කොටස ඒ උදවියට නිදහස් කරන්න ඕන. එහෙම නිදහස් කළාම තමයි අපේ කොටස අරගෙන ඉතුරු ටික දැම්ම වෙන්නෙ. එහෙම දාන කොටස තමයි දානය වෙන්නෙ.

එහෙනම් අපි දැන් අල්ල ☞

ගෙන ඉන්න කොටසේ /ඉඩමේ පෙර සෘෂිවරයෙක් හිටිය නම්, එහෙම නැත්නම් ආර්ය උත්තමයෙක් හිටිය නම්, නිදහස් ලෝකෙ තමන්ගෙ පංගුව කොතනින් හරි ගන්න තිබුණා. කුස ගිනි වෙච්ච වෙලාවක ඕනෑම තැනකින් ගහක ගෙඩියක් කඩා ගෙන කෑමේ නිදහස/හිමිකම තිබුණා. නමුත් වර්තමානයේ එහෙම කරන්න හැකියාවක් නෑ. එහෙනම් ලෝකයේ උතුමන් කියල යම් පිරිසක් ඉන්නවද, ඒ පිරිසට හිමි දේ වැට කඩොළු ගහල කොටු කරල සිදු කරපු ඒ අවැඩ අසාධාරණ, මහා සාපයක් විදිහට එල දෙන්න එක හේතුවක් වුණා. එහෙම අවැඩ අසාධාරණයෙන් ගත්ත ඒ උතුමන්ගෙ කොටස ඒ උදවියට දුන්නෙ නැත්නම් අපි මහා සාප ලද්දෝ වෙනවා. ඒ විදියට උතුමන්ට නොදී කන බොන තාක් කල් සාප වැදිල අපේ සම්පත් විනාස වෙලා ගිහින්, ඉතුරු වෙච්ච ප්‍රමාණයක් තමයි අද අපි භුක්ති විඳින්නෙ. ලැබෙන්න තිබුණ සම්පත්වලින් දාහකට එකක්වත් අද ලැබිල නෑ, පිරිහිලා ගිහින්. හැදෙන ගහකොළ පවා නිසරු වෙලා. ඒවායේ එල දරන තත්වයත් පවා හීන වෙලා. එහෙම වෙන්නෙ, අර උතුමන්ට කරපු අවැඩ අසාධාරණ නිසා.

ඒ වගේම ලෝකයේ සාමාන්‍ය උදවියට හිමි කොටස් පවා තණ්හාවෙන් වෙන් කර ගත්ත කොටස් තුළ තියෙනවා. ඒ ඒ උදවියගෙ කොටස් ඒ ඒ උදවියට ලැබෙන්නෙ නැතිව, ඔවුන් තැනින් තැන ඉන්නවා. ඒ වගේම තිරිසන් සතුන්ට අයිති කොටසත් මනුස්සයන් විසින් වෙන් කර ගත්ත කොටස් තුළ තියෙනවා. මේ විදියට ගුණවතුන්ට කරපු අඩුපාඩු නිසා ඇතිවන සාපයත්, සාමාන්‍ය උදවියට කරපු අහිමි කිරීම නිසා එන සාපයත්, පහත් නීච පුද්ගලයින්ට / සත්ත්වයින්ට කරපු පාඩුව නිසා ඇතිවන සාපයත් කියන මේ සියල්ලම වදිනවා. පහත් නීච කෙනෙකුට අයිති යමක් ගත්තොත්, එකට දහ ගුණයකින් සාප කරන සිරිතක් තමයි පහත් උදවියට තියෙන්නෙ. එහෙම උදවිය තමයි හෙණහුරුගෙ පැත්තෙ උදවිය කියල කියන්නෙ. ඒ නිසා ඔවුන්ගෙ කොටස ඔවුන්ට දීල ඒකෙන් නිදහස් වෙන්න ඕන. ඒ වගේම උතුමන්ගෙ කොටස උතුමන්ට දෙන්න ඕන. අනික් භව භෝග සම්පත්වලින් තමන්ට හිමි කොටස තියා ගෙන ඒ ඒ උදවියගෙ හිමිකම් කොටස් නිදහස් කරන්න ඕන.

මෙහෙම අනිත් උදවියට හිමි කොටස් නිදහස් කරල බෙදල දෙන ක්‍රමයක් පැරණි බොදුනුවො දැන ගෙන හිටියා. වී කරල් කිරි වැදීගෙන එනකොට, අතින් පොඩි කරල වී ඇට ටික අරගෙන නොඉඳුල් කිරිබතක් හදල පළමු අග්‍ර කොටස විදියට බුද්ධ පූජාව තියල නිදහස් වුණා. ඊට පස්සෙ ගොයම් කපන කොට ඔක්කොම කපන්නෙ නැතුව, කුරුල්ලන්ගෙ කොටස විදියට කුරුල්ලන්ටත් කොටසක් ඉතුරු කළා. ඒ වගේම ගොයම් ගෙනියන කොට වැටෙන කරල් ඇහිලුවෙ නෑ. ඒක දුගී මඟී උදවියට එකතු කර ගන්න ඒ අයටත් සුළුවෙන් හෝ කොටසක් වෙන් කළා. කමතෙ ඉඳල වී ටික ගෙදරට ගෙනියන්න කලින් කොටස්වලට බෙදල වෙන් කළා. වැව් අමුණු හදල, කුඹුරු අස් වද්දල දීල උදව් උපකාර කරපු උදවිය දෙව් දේවතාවන් වෙලා උපත ලබල ඉන්න නිසා, දෙව් දේවතාවන්ට ප්‍රති උපකාර වශයෙන් දෙවියන්ගෙ කොටස කියල කොටසක් වෙන් කරල දේව පූජාවක් විදියට දුන්නා. දෙමව්පියන්ට, වැඩිහිටියන්ට, සහෝදර සහෝදරියන්ට, ගුරුවරුන්ට, අසල්වැසියන්ට.... ආදී වශයෙන් යම් යම් කොටස් වෙන් කරල ගිහින් දුන්නා.

මෙහෙම දීල තමන්ට අයිති කොටස විතරක් ගෙවල්වලට රැගෙන ගියා. ලබා ගත් අස්වැන්නෙන් 2/3 ක් විතර පූජ කරල, 1/3 ක් විතර තමන්ට ඉතුරු කර ගත්තා. එදා බොදුනුවො එහෙම බෙදා හදාගෙන නිදහස් කරපු නිසා ක්ෂුද්‍ර ජීවියෙකුගෙන්වත් අස්වැන්නට හානියක් වුණේ නෑ. තමන්ට ලැබුනෙ 1/3 ක අස්වැන්න කොටසක් වුණාට ඒක මහ විසාල අස්වැන්නක් වුණා. ඒ වගේම සතුන්ගෙන් අස්වැන්නට හානියක් වුනේ නෑ. අස්වැන්න ගන්න බෙහෙත් ද්‍රව්‍ය දාන්න ඕනකමක් තිබුණෙත් නෑ. එදා එහෙම පසුබිමක් තිබුණට අද එහෙම නෑ. අනිත් උදවියට බෙදල දෙන, සතුන්ට බෙදල දෙන සිරිත අද බොහොම අඩුයි. ඒ සිරිත් අද ගිලිහිලා ගිහින්. තමන්ගෙ කර ගන්න විතරයි බලන්නෙ. එහෙම තණ්හාවෙන් කටයුතු කළාම, ලැබෙන්න තියෙන අස්වැන්නත් ලැබෙන්නෙ නැතුව යනවා. අස්වැන්න නිසරු වෙනවා. එදා බොදුනුවො ලබා ගත් 1/3 ක කොටසට හිමි අස්වැන්න වගේ අස්වැන්නක් අද සම්පූර්ණ අස්වැන්නෙන්වත් ලැබෙන්නෙ නෑ. එහෙම වෙන්නෙ අසාධාරණයෙන් ගත්ත කොටස් නිදහස් කළේ නැති නිසා. මේ විදියට තමයි එදා තිබ්බච සශ්‍රීකත්වය පිරිහුනේ.

එතකොට අපේ, මගේ කියල බදාගෙන තියාගෙන ඉන්න හැම දෙයක්ම වගේ බොහොම සාධාරණත්වයකින් ලබා ගෙන තියෙන දේවල් නෙවෙයි. ඒ නිසා තමන් දන් දෙන්නෙ තමන්ගෙම සල්ලිවලින්, තමන්ගෙම දේවල්වලින් කියල හිතාගෙන කටයුතු කළොත් ඒකත් වැරදියි. එහෙම අනුන්ගෙ කොටස් තමන්ගෙ කියල වෙන් කර ගත්ත එකේ ප්‍රතිඵලය තමයි දැන් මේ භුක්ති විඳින්නෙ. දැන් මෙහෙම අනුන්ගෙන් අසාධාරණයෙන් ලබා ගත්ත දේවල් ගැන අවබෝධ වෙන කොට, තමන්ටත් ඒකෙන් නිදහස් වෙන්න කටයුතු කරන්න හැකියාවක් තියෙනවා. අනුන්ගෙ දේවල්වලට වැට කඩොළු ගහල වෙන් කරගෙන සම්මත කරගෙන තියෙන නිසා ඒ සම්මතය වෙනස් කරන්න අපට හැකියාවක් නෑ. නමුත් තමන්ට ලැබෙන වැටුපෙන් හැකි ප්‍රමාණයක් දීලා, තමන්ට නිදහස් වෙන්න ක්‍රමයක් තියෙනවා. අර පැරණි බොදුනුවො තමන්ගෙ අස්වැන්න බෙදුව ආකාරයටම තමන්ට ලැබෙන ආදායමත් බෙදල වෙන් කරන ක්‍රමයක් හදා ගත්ත නම්, අවුරුද්දක් ගෙවෙනකොට තමන්ගෙ දියුණුව තුළ ලොකු වෙනසක් දැක බලා ගන්න පුළුවන්. ඒ කියන්නෙ, හේතුවට අනුව ඵලය ලැබෙන හැටි බලා ගන්න පුළුවන්.

යම් කෙනෙකුට මසකට හෝ දිනකට ලැබෙන ආදායම යම් යම් කොටස්වලට බෙදල වන්දි ගෙවල නිදහස් වෙන්න කියල හිතා ගෙන, මේ ආකාරයේ වැඩපිළිවෙලක් පටන් ගන්න පුළුවන්. තමන්ට ලැබෙන ආදායමෙන් අග්‍ර කොටස සාසනය වෙනුවෙන් වෙන් කරන්න පුළුවන්. තමන්ට ලැබෙන වැටුපෙන් යම් කොටසක් සාසනය උදෙසා කියල හිතාගෙන කැටයකට දාන්න පුළුවන්. ඒ වගේම අපි අද ජීවත් වෙන පරිසරය, වැව් අමුණු, මං මාවත් ආදිය දහඩිය මහන්සියෙන් හදල දීල කරපු ඒ උදව් උපකාර නිසා, අදත් අපට ජීවත් වෙන්න මහත් රුකුලක් සපයනවා. ඒ උදව් උපකාර කරපු උදවිය අදත් දෙව් තලවල ජීවත් වෙනවා. ඒ නිසා ඒ උදවිය සඳහා මගේ කෘතෝපකාරය කියල ඒ උදවියටත් කොටසක් වෙන් කරනවා. තමන් හැදූ වැඩූ අම්මට තාත්තටත් කොටසක් වෙන් කරනවා. තමන්ට උගන්වපු, මග පෙන්වපු ගුරුවරුන්ටත් කිසියම් කොටසක් වෙන් කරනවා. එහෙම වෙන් කරල එකතු වෙන්න තියල බොහොම ගෞරවයෙන්, අනුකම්පාවෙන් ඒ උදවියට ලබා දෙන්න පුළුවන්. මේ වගේ තමන්ට ලැබෙන ආදායමෙන් වෙන් කරල තමන්ට ලැබෙන කොටසේ නිදහස් භුක්තිය පටන් ගත්ත නම්, වැඩිකල් යන්න කලින් ඒ පුද්ගලයට කිරි ඉතිරෙන්න, දියුණු වෙන්න පටන් ගන්නවා. දානය කිව්වෙ මේකට තමයි (දා + ණය) ණය වෙච්ච දේවල් දාන්න ඕන. ණය වෙච්ච දේවල් දාන්නෙ නැතුව තියා ගෙන හිටියොත් නිදහස් වෙන්න බෑ. දැන් මෙහෙම ක්‍රමයක් හදා ගත්තම ණය නැතුව ජීවත් වෙන්න පුළුවන් පසුබිමක් හැදෙනවා. පරිබෝග කළා හෝ නොකළා හෝ, හිමි උදවියගෙ කොටස හිමි

උදව්යට ලබා දීමක් තමයි මෙතනදි ඇත්තටම සිද්ධ වෙන්නෙ.

පිළිමවලට දන් දීල මොනව කරන්නද, ඕවා කන්න පුළුවන් කෙනෙකුට දෙනව මිසක් පිළිමවලට දන් දීල, වෙච්ච ණයවලින් නිදහස් වෙන්න පුළුවන්ද කියල අහන පිරිසක් අදත් ඉන්නවා. ඒ උදව්යගෙ දැන ගැනීම පිණිස මෙහෙම සඳහනක් කරනවා. බුදුන් වහන්සේගෙන්, ඒ වගේම මහ රහතන් වහන්සේලාගෙන් අපට ලැබුණ ආශිර්වාදය, අපට ලැබුණ යහපත ශාන්තිය වගේම විමුක්තිය සලසා ගන්න අද කාලෙ වෙනකොට ඒකට හේතු කාරක වන ධර්මය පැවතුන හැටි, ඒ මාර්ගය ලැබුණ හැටි, ඒ ධර්මය මතු කරල දුන්න උත්තමයන් යනාදී වශයෙන් සිහි කරගෙන, කරල තියෙන උපකාරය අනන්ත උපකාරයක් වශයෙන් සිහි කරල, එහෙම කරපු උපකාරයට කෘතෝපකාරයක් තමයි මේ බුද්ධ උපහාරවලින් කරන්නෙ. ඉතින් මේ වගේ විසාල උපකාරයක් කරපු එබඳු ගුණ ඇති උතුමන්ට උපහාර පූජාවක් සිද්ධ කරනවා කියන්නෙ මහා චිත්ත ප්‍රසාදයක් නැගෙන පූජාවක්.

බුද්ධ ප්‍රමුඛ මහා සංඝ රත්නයට යමක් පූජ කරන කොට, අපි නොදකින පැති ගොඩක් තියෙනවා. අනාගාමී ඵලයට පත් වෙලා අරිහත්වයට පත් නොවෙච්ච අන්තරා පරිනිබ්බායී කියල ආර්ය උත්තමයන් පිරිසක් ඉන්නවා. කාම රාග, රූප රාග, අරූප රාග කියන මේ රාග තුනම ගෙවල අවසන් නිසා, කාම ලෝකවල උපදින්නෙත් නැතුව, රූප ලෝකවල උපදින්නෙත් නැතුව, අරූප ලෝකවල උපදින්නෙත් නැතුව මාන, උද්ධච්ච, අවිද්‍යා කියන ඉතුරු සංයෝජන තුන ප්‍රහීන කරල නැති නිසා පිරිනිවන් පාන්න විදියකුත් නැතුව ඉන්න කොටසක් තමයි මේ අන්තරා පරිනිබ්බායී කියල කියන්නෙ. (මේ පිළිබඳව දිග විස්තරයක් 37 වැනි කලාපයේ ''අනාගාමී ආර්ය උත්තමයන්ට අදාළ වන අන්තරා පරිනිබ්බායී අවස්ථාව'' නම් ලිපියෙන් විස්තර කරල තියෙනවා) මෙහෙම ගුණ තියෙන උතුමන් අපවත් වුණාම අන්තරාභව කියන අවස්ථාව තුළ ඒ හිටිය ස්වභාවයෙන්ම ඒ අත්බවයට හිමි ආයුස ගෙවිල අවසන් වෙන කල් ජීවත් වෙනවා. අපට නොපෙනුනත් සමාධිගත, අභිඥාලාභී භික්ෂූන් වහන්සේලාට පෙනෙන මේ වගේ පිරිස් අදත් ජීවත් වෙනවා. බුදුන් ප්‍රමුඛ මහා සංඝ රත්නයට කියල පූජ කළාම, උන් වහන්සේලාත් එතැනට වැඩම කරල ඒ දානය ලබා ගන්නවා. උන් වහන්සේලාගෙ කොටස මැව්ල උන් වහන්සේලාගෙ පාත්තරවලට යනවා. යම් අයෙකුට දිව්‍ය/සමාධි පහළ වෙච්ච දවසක මේ සිද්ධිය දැක බලා ගන්න හැකියාව ලැබෙනවා.

මේ විදියට බුදුන් ප්‍රමුඛ මහා සංඝ රත්නය උදෙසා කියල දානයක් දෙන කොට, උන් වහන්සේලාට හිමි කොටසකුත් ඒකෙ ගැබ් වෙනවා. ඒ නිසා ඒ දෙන දානය අපතෙ යන්නෙ නෑ. අපට නොපෙනුනත් උන් වහන්සේලාට හිමි කොටස ලැබෙනවා. ඒ නිසා පිළිමවලට දාන දෙනකොටත්, මේ ආකාරයෙන්ම බුදුන් ප්‍රමුඛ මහා සංඝ රත්නයට පූජා කරම් පූජා වේවා... කියල සිහි කරල දන් දෙන කොට, අපතෙ යන්නෙ නැති බව අවබෝධ කර ගන්න ඕන.



මෙහෙම ලෝකයාට වෙච්ච අවැඩ අසාධාරණයට වන්දි ගෙවන්න බොහොම චිත්ත ප්‍රසාද මානසිකත්වයකින් සාසනය උදෙසා පූජාවක් ක්‍රම දෙකකට සිද්ධ කරන්න පුළුවන්. ඒ සඳහා අත හිත දෙන්න පුළුවන් කෙනාට අවස්ථාවක් ලබා දෙන්න ඕන. ඒ කියන්නෙ දිව්‍ය, බ්‍රහ්ම, මනුස්ස, අමනුස්ස ආදී සෑම සියලු සත්වයෝම මේ පූජාවට සහභාගි වෙලා, තම තමන් සිද්ධ කළා සේ හිතාගෙන අත හිත දී ගන්න කියල ආරාධනා කරන්න ඕන. එහෙම ආරාධනා කළාම, ඒ අවස්ථාව තමන්ට තනියම සිදු කර ගන්න බැරුව හිටිය දිව්‍ය, බ්‍රහ්ම, අමනුස්ස ආදී සත්වයින්ට ඒ උදව්ව ලබා දුන්නම, කොච්චර සන්තෝසයෙන් ඒ පූජාවට අත හිත දෙනවද කියල අපිට පේන්නෙ නෑ. නමුත් ඒ ආරාධනාව නිසා කොච්චර පිරිසක් සහභාගි වෙනවද කියල දිව්‍ය/සමාධි පහළ වුණ උත්තමයෙක් දැක්කොත් එහෙම, ගණන් කරල ඉවර කරන්න බැරි අසීමිත පිරිසක්. ඒ තරමටම අසීමිත පිරිසක් මේ වගේ පූජා සඳහා නොපෙනෙන ලෝකවලින් ඇවිත් සහභාගි වෙනවා. අපි මේ සිද්ධිය නොදැක්කට සමාධිගත, අභිඥාලාභී භික්ෂූන් වහන්සේලා දකිනවා.

මේ වගේ පූජා පවත්වන අවස්ථාවලදි තවත් විවිධ පුදුම හිතෙන දේවල් සිද්ධ වෙනවා. මහ ප්‍රබල යක්ෂයින්ව අලින්ව බඳින තරමෙ දම්වැල්වලින් බැඳල මේ වගේ පූජාවලට සම්බන්ධ කර ගන්න සතර වරම් දෙවිවරු විසින් අරගෙන එනවා. එහෙම දරුණු යක්ෂයින්ව අරගෙන ඇවිත් ඈතින් තියා ගෙන ඔවුන්ට පූජාවට සවන් දෙන්න කියල අණ කරනවා. එහෙම කියන්නෙ, මේ පූජාවන්ට සම්බන්ධ වෙලා පිනක් කර ගනිල්ලා කියන නියෝගයෙන්. එහෙම සම්බන්ධ වෙලා ඔවුන්ට හිමි කොටස ඔවුන් රැගෙන යනවා. නමුත් මේ වගේ සිද්ධි සාමාන්‍ය පෘතජ්ජනයා විස්වාස නොකරන තරම් ප්‍රබලයි. විස්වාස නොකළත් මේ වගේ සිද්ධි සිදුවන බව හැබෑවක්.

තම තමන්ගෙන් වෙච්ච අවැඩ අසාධාරණයන්ට වන්දි ගෙවල නිදහස් වෙන්න මේ විදිහෙ පූජාවක් සිද්ධ කරන කොට, අනන්ත සසර ගමනෙදි තමන්-ගෙන් අවැඩක් අසාධාරණයක්, වරදක් ප්‍රමාද දෝසයක් සිද්ධ වෙච්ච ලෝක සත්වයින් කෙබඳු උපතක කෙබඳු අත්භවයක හිටියත්, මේ වන්දනාමාන පුද පූජාවන්ගෙ පුණ්‍ය ශක්තිය විහිදිලා පැතිරිලා පිහිටා සුඛිත මුදිත වෙත්වා කියල පිං අනුමෝදන් කිරීමත් සිද්ධ කරන්න ඕන.

උන්න මේ උදකං වට්ඨං
යථා නින්නං පවත්තතී
ඒව මේව ඉතෝ දින්නං
පේතානං උපකප්පතී

යථා වාරී වහා පූරා
පරිපූරෙන්ති සාගරං
ඒව මේව ඉතෝ දින්නං
පේතානං උපකප්පතී.

මේ වහින මහා ජලය, වැව් ගංගා පුරව ගෙන ගිහින් මහ මුහුදට වැටෙන්නේ යම් සේද, ඒ ආකාරයටම මිනිස්සු ප්‍රේතයන් හට දෙන දේවල් ඔවුන්ට ලැබෙන බව මේ ගාථාවෙන් කියවෙනවා. වැස්ස දන්නෙ නෑ ඒ වැස්ස මුහුදට යනව කියල. ගංගා දන්නෙ නෑ ඒ ජලය මුහුද කරා රැගෙන යනව කියල. මුහුද දන්නෙත් නෑ වහින වතුර ගංගාවලින් තමන් කරා එනව කියල. මේ වගේ යම් අයෙක් පිං දෙන කොට, දෙන කෙනා දන්නෙ නෑ ඒ පින ඒ

# විවිධාකාර වූ සමාධිවලට හසුවන විවිධ දෑ...

මේ සඟරාව පුරාවටම පළ වූ සමහර ලිපිවල සටහන් වෙච්ච කාරණයක් තමයි සමාධිය කියන වචනය. විශේෂයෙන් විවිධ ඖෂධ වර්ග හෙළිදරව් කරන අවස්ථාවලදිත්, වාස්තු විද්‍යාව, නක්ෂත්‍රය.... ආදී සමහර කරුණු කාරණා හෙළිදරව් කරන කොටත්, නොපෙනෙන ගුප්ත ලෝකය ගැන කියන කොටත්, බෙහෙත් සමාධියට හසු වූ... සමාධියෙන් දුටු... ආදී වශයෙන් ඒ විශේෂ කරුණු ලබාගත් ආකාරය ගැන සඳහන් වුණා.

දැන් කෙනෙකුට ගැටළුවක් එන්න පුළුවන්, මොකක්ද මේ අනෙක් අයට නොපෙනෙන, එක් කෙනෙකුට විතරක් පෙනෙන සමාධිය, ඇයි අනෙක් අයටත් ඒ වගේ දේවල් පේන්නෙ නැත්තෙ... ආදී වශයෙන්. ඒ වගේම මේ වගේ කාරණා අහල තවත් සමහරු කියන්න පුළුවන්, අපිත් ඔය වගේ දේවල් සමාධියෙන් දැකල තියෙනවා, අපිටත් සමාධිය තියෙනවා කියල. හැබැයි ඒ කතාවත් බොරු නෙවෙයි. මොකද සමාධිය කිව්වම එකක් නෙවෙයි, ඒ ඒ ගතිවලට අනුව කෝටි ගණන් සමාධි වර්ග තියෙනවා. ඒ නිසා සමාධියෙන් බැලුවයි, දැක්කයි කිව්වම, තමන්ගෙ ගතියට අනුකූල සමාධියක් තමන්ට එනවා. **සමහර විට තමන්ගෙ ගතිය වනචර නම්, ඒ පුද්ගලයට එන්නෙ වනචර සමාධියක්. එතකොට ඒ සමාධියට එන්නෙත් වනචර අදහස්.** නමුත් ඒ පුද්ගලයගෙන් ඇහුවොත් කියන්නෙ, මටත් තියෙන්නෙ අහවල් ජාතියේ විශේෂ සමාධියක් කියල. හැබැයි ඇත්ත වශයෙන්ම එහෙම එකක් නෙවෙයි තියෙන්නෙ. ඒක විකෘති ස්වභාවයක්මයි. ඒකට එන සමාධියත් විකෘතියි. ඒකෙන් පෙන්වන්නෙ විකෘතියක් මිසක් ප්‍රකෘතියක් නෙවෙයි.



යම් කිසි සමයකට ඇදිල හිටීමයි සමාධි කියන්නෙ. මොන සමයකට හරි ඇදිල හිටියොත් ඒක සමාධියක්. පාප සමයට ඇදිල හිටියොත් පාප සමාධියක්. කුසල සමයට ඇදිල හිටියොත් කුසල සමාධියක්. නිවන් සමයට ඇදිල හිටියොත් ඒක නිවනට හේතු වන සම්මා සමාධියක්. ඉතින් සමාධි කිව්වම, අහංකාර සමාධි තියෙන අය තමයි වැඩිපුරම ඉන්නෙ. අහංකාර උදවියට තියෙන්නෙ අහංකාර සමාධියක්. ඒකෙන් කොච්චරවත් පෙන්වන්නෙ අහංකාර අදහස්. අහං **කියන්නෙ මම. කාර කියන්නෙ කරනවා. මමත්වය කරනවා, මම කියන හැඟීම ලොකු කරනවා කියන එක තමයි අහංකාර කියන්නෙ.** ඒ කියන්නෙ මම කියන කෙනා හරි වැදගත්, උසස්, ලොකු කෙනෙක් කියල උච්ච මානයෙන් හෝ මම අහවලා හා සමානයි කියන සදිස මානයෙන් හෝ මම හීනයි කියන හීන මානයෙන් හෝ තමන්ම නිගමනයකට බහිනවා. ඒ නිසා මමත් සමාධියක ඉන්නෙ කිව්වට හරියන්නෙ නෑ. හරියට නිවැරදි අදහස් එන්න නම්, පිරිසිදු වතුර වගේ පබස්සර මිදං භික්ඛවේ චිත්තං කියන ප්‍රභාෂ්වර සමාධියක් එන්න ඕන. ඒ වගේ සමාධියකින් තමයි යහපත යහපතක් හැටියටත්, අයහපත අයහපතක් හැටියටත් පෙන්වන්නෙ. ඒ අනුව බැලුවොත් තමයි ලෝකයාට යහපතක් කරන්න පුළුවන් වෙන්නෙ. එහෙම නැත්නම් විකෘතියක්.

ඒ වගේම සමහරු තවත් කෙනෙක් අනුකරණය කරනවා. භාවනාවෙන් සමාධි වැඩුවයි කිව්වොත්, අපිත් භාවනා කරනවා, අපිටත් සමාධි තියෙනවා, අපිටත් පේනවා.... ආදී වශයෙන් සමහරු කියනවා. ඒ කතාත් බොරු නෙවෙයි. නමුත් ඒ පේන සියල්ලම යථාර්ථය නෙවෙයි. මොකද ඒ ඒ අයගෙ සමාධියට අනුකූලව තමයි අදහස් එන්නෙ.

බුදුන් වහන්සේ වැඩ ඉන්න කාලෙ එක්තරා අවස්ථාවක අජිත පුද්ගලය කරා යනවද නැත්ද, ඒ පුද්ගලය අනුමෝදන් වෙනවද නැත්ද කියල. ඒ ධර්මතාවය අනුව පින ක්‍රියාත්මක වුනාට, එහෙම ක්‍රියාත්මක වෙන්නෙ ඇයි කියල දන්නෙ නෑ. පින ලබන කෙනා දන්නෙත් නෑ තමන් කරා ඒ පින කොහෙන්ද ආවෙ කියල. ඒ වුණත් ඒ ධර්මතාවය ක්‍රියාත්මක වෙනවා.

මේ වගේ පූජාවක් සිද්ධ කරන කොට තවත් සිහි තබා ගත යුතු කාරණාවක් තමයි, චිත්ත ප්‍රසාදය සහිතව ඒ කටයුත්ත සිද්ධ කරන්න ඕන කියන කාරණය. ඒ වගේම ශ්‍රද්ධා, සීල, ස්‍රැත, ත්‍යාග, ප්‍රඥා කියන කාරණා පහත් ඇතුව තමයි ඒ පූජා සිද්ධ කරන්න ඕන. එහෙම නැතුව, ඔන්න මම නම් ඔක්කොම පූජා ටික දීල ඉවර කළා කිව්වට ඵලක් නැති බව අවබෝධ කර ගන්න ඕන. ඒ කියන්නෙ හේතු ඵල දහමට අනුව ඒ පිළිබඳව විස්වාසයක් තියෙන්න ඕන. බුදුන් වහන්සේ දේශනා කරපු දහම පිළිබඳව විස්වාසයක් තියෙන්නත් ඕන, ශ්‍රද්ධාව තියෙන්නත් ඕන. ඊට අනුකූලව ලබන සැනසුම දකින්නත් ඕන. සිල් ගුණයෙන් එන සීලනය තියෙන්නත් ඕන. ප්‍රඥාවෙන් එන හික්මීම හෙවත් ශික්ෂණය තියෙන්නත් ඕන. ඒ වගේම මේ පූජා කරන කොට අලෝභ, අද්වේශ, අමෝහ ගුණයෙන් යුක්ත වෙන්නත් ඕන. ඊට අනුකූලව ලැබෙන්නෙ මේකයි කියල දැනුවත් වෙලා ඉන්නත් ඕන. ඒ කියන්නෙ, හේතුවට අනුව ඵලය ලැබෙන හැටි මාත්‍රයක් හරි දැන ගෙන ඉන්න ඕන. පරිත්‍යාගසීලී මානසිකත්වය තියෙන්නත් ඕන. ඒ තුළින් හේතු ඵල නියාමය දකින ප්‍රඥාව තියෙන්නත් ඕන. මේ ආකාරයට ඒ කරුණු 5 තියෙන කෙනෙකුට ඒ වගේ පූජාවක් පළමු වතාවට තිව්වත්, ඒකෙන් තමන් කළ අවැඩ අසාධාරණයන්ට වන්දි ගෙවල නිදහස් වෙන්න පළමු පූජාවෙන්ම හැකියාව ලැබෙනවා. ඒ නිසා ශ්‍රද්ධා, සීල, ස්‍රැත, ත්‍යාග, ප්‍රඥා කියන කාරණා 5 සහිතව මේ වගේ පූජාවන් සිද්ධ කිරීමෙන් යහපත් ප්‍රතිඵල ලබා ගන්න පුළුවන් බව බොදුනුවන් අවබෝධ කර ගන්න ඕන.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**ප්‍රසාද් ද සිල්වා**
**ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය**

කේසකම්බලී, මක්ඛලී කෝසාල වගේ පිරිස් කියනවා, බුදුන් වහන්සේගෙ ශ්‍රාවකයෙක් වෙච්ච අහවල් පුද්ගලය මැරිල අපාගත වෙනව අපි දක්ක කියල. නමුත් බුදුන් වහන්සේ දන්නවා, ඒ පුද්ගලය සුගතියේ ගිහින් බ්‍රහ්මත්වයට පත් වුණා කියල. ඉතින් අර විදියට කියපු ඒ අන්‍ය පරිබ්‍රාජකයෙක් එක්තරා විදියකට ඔත්පල වෙලා ඉන්න අවස්ථාවක, අර බ්‍රහ්ම දේවතාවා බුදුන් වහන්සේ ළඟට ඇවිත් මෙහෙම කියනවා. ''ස්වාමීනි, මම අපාගත වුණා කියල ඔය පුද්ගලය මා පිළිබඳව අභූතයෙන් මෙහෙම කියනවා. ඔය දෘෂ්ටිය තියෙන තාක් කල් මනුස්සයට ඔය අසනීපය හොඳ වෙන්නෙ නෑ, ඔය මනුස්සය නිකං විනාස වෙනවා, මම අපාගත වුනේ නෑ.'' නමුත් ඒ මනුස්සයත් දැකපු දේ තමයි ඒ විදියට තමන්ගෙ වැරදි ආකල්පයෙන් කිව්වෙ. හැබැයි ඒ කිව්වෙත් බොරුවක් නෙවෙයි, තමන් දකපු දේ. ඒ පුද්ගලයගෙ තිබ්ච්ච දෘෂ්ටියට අනුව මැවිල පෙනුනෙ බුදුන් වහන්සේගෙ ඒ ශ්‍රාවකයා අපාගත වෙලා ඉන්න බව. එතකොට ඒ මැව්ච්ච එක කිව්ව මිසක් යථාර්ථය දකලවත්, ඇහැට දකලවත් කිව්ව නෙවෙයි. ඇහැට දක්ක නම් හරියට වෙච්ච දේ පේන්න ඕන. ඒ නිසා සමහරු අහවල් දේ සමාධියෙන් පෙනුන කියල කලබල වෙලා කියන්න යනවා. ඒ වගේ අවස්ථාවකදි සමාධි නෙවෙයි, ඉස්සෙල්ලම චිත්ත නිදහස ගැනයි බලන්න ඕන. සමාධි පෙනුන පලියට කලබල වෙලා හරියන්නෙ නෑ. අපිටත් සමාධි, දිවැස් තියෙනව කියල අනිත් අයත් එක්ක කියන්න යන්න සුදුසු නෑ.

බුදුන් වහන්සේ පහාතබ්බ සූත්‍රයෙදි (සංයුක්ත නිකාය 4) පෙන්නුවෙ මොකක්ද, තමන් ළඟ ප්‍රාණ ඝාතය තියෙනවද කියල නිතරම බලන්න කියල. ඒ කියන්නෙ ප්‍රාණ ඝාතය කරන, කරවන, අනුබල දෙන, වර්ණනා කරන ඒ අදහස් තියෙනවද කියල. එහෙම තියෙනව නම් ඒව පහ කරල දාන්න ඕන. ඒක තමයි ආර්ය මාර්ගය කියන්නෙ. ඒ වගේම අදත්තා දානය පිළිබඳ අදහස් තියේ නම් ඒවා පහ කරන්න, කාම මිථ්‍යා චාරය පිළිබඳ අදහස් තියේ නම් ඒවා පහ කරන්න ..... ආදී වශයෙන් මේකයි කළ යුත්ත කියල පෙන්නුවා. නමුත් අද භාවනාව කියල කියන්නෙ ඒකට නෙවෙයි. මොනව හරි සමාධියක් ගන්න බලාගෙන තමයි හුඟක් අය භාවනා කරන්නෙ. කොච්චර හරි බෞද්ධ භාවනා කියල කොහේ හරි ගිහින් කරන්නෙ මොනව හරි සමාධියක්, දිවැසක් ගන්න බලාපොරොත්තුවෙන්. තමන් ළඟ තියෙන දේ බලන්නෙ නෑ. ඒකට අකමැතියි. නමුත් වෙන ක්‍රමයකට සමාධි හොයනවා. එතකොට අර පහාතබ්බ සූත්‍රයෙදි බුදුන් වහන්සේ පෙන්වපු කාරණය අහකට දානවා. මොකද ඒ සූත්‍රය අනුව බැලුවම, මම කොහොමද ප්‍රාණ ඝාතයක් කරන්නෙ, මම ප්‍රාණ ඝාත කරනවද කියල කාගෙන්ද අහන්නෙ, අනුබල දෙනවද, වර්ණනා කරනවද කියල මට කියල දෙන්න කෙනෙක් කොහෙද



ඉන්නෙ .... ආදී වශයෙන් ප්‍රශ්න කරනවා. තම තමන් ගැනම බලන ක්‍රමය දන්නෙ නෑ. නමුත් එහෙම හිතන්න දෙයක් නෑ. ඒක තමන්ටම දැන ගන්න ක්‍රමයක් තියෙනවා. තමන්ගෙ ගුරුවරයා ධර්මයයි කිව්වෙ ඒකයි.



තමා කියන්නෙ අඳුරෙන්, අවිද්‍යාවෙන් හැදිච්ච දෙයක්. ඒ කියන්නෙ අවිද්‍යා අන්ධකාරය. අවිද්‍යා අන්ධකාරය දුරු වෙච්ච ලෝකයක් නෑ. මේ කියන්නෙ මෝහ අඳුර නෙවෙයි, අවිද්‍යාව නිසා එන අඳුර. අවිද්‍යා අන්ධකාරය තියෙන තාක් කල් ලෝකයේ සියලු සත්වයෝ උපදින්නෙ අවිද්‍යාව මුල් කර ගෙන. ධර්මයේ හිටියත්, කොහොම හිටියත් උපදින්නෙ අවිද්‍යාව මුල් කර ගෙන. අවිද්‍යා අන්ධකාරය මුල් කරගත්තු සමාධි තමයි තමාට තියෙන්නෙ. අඳුර කිව්වෙ ඒකයි. මෙතනදි අවිද්‍යාව කියන එකත් කොටස් 23 ක් පෙන්වනවා. අඤ්ඤාණං, අදස්සනං, අනභිසමයෝ, අනනුබෝධෝ, අසම්බෝධෝ, අප්පටිවේදෝ, අසංඝාහනා, අපරියෝඝාහනා, අසම්පෙක්ඛනා, අපච්චක්ඛ කම්මං, දුම්මේජ්ජං, බාල්‍යං ..... ආදී වශයෙන් කියන කොට, අන්න එතන ඉඳන් තමයි බාල සමාධිය එන්නෙ. මේ සියල්ලම අවිද්‍යා සමාධි තමයි. ඒවායින් අවිද්‍යාවෙ සනීභවන කොටසයි, සියුම් කොටසයි දෙවර්ගයම මෙතන තියෙනවා. සියුම් කොටසට එන කොට අලෝභ, අද්වේශ, අමෝහ සමග අවිද්‍යාව යෙදෙනවා. රාග, ද්වේශ, මෝහ ක්ෂය කරන කොට අවිද්‍යාව බිඳෙනවා. අවිද්‍යාව නොබින්ද අයටත් සමාධි තියෙනවා. ඒ අතර අලෝභ, අද්වේශ, අමෝහ සමාධිත් තියෙනවා. **අලෝභ සමාධියක් තියේ නම් ඒ පුද්ගලයට තවත් කෙනෙකුට පරිත්‍යාග කරන දේවල් මැවීමේ හැකියාවක් ලැබෙන්න පුළුවන්. අද්වේශ සමාධියක් තියේ නම්, ශාන්තියට හේතු වන යමක් ලෝකයාට දෙන්න පුළුවන්. අමෝහ සමාධියක් තියේ නම් දහම කියා දෙන්න පුළුවන්.** මේ තුනට අනුකූලව සසර වඩපු ගති අනුව තමයි හොඳ සමාධි එන්නෙ. ඒ වගේම ලෝභ සමාධියක් තියේ නම් කෙනෙකුට දෙන්න හිතෙන්නෙ නෑ. එතකොට තමන්ට තනියෙන් ගොඩ ගහ ගන්න හිතිල පිරිහෙනවා. ද්වේශ සමාධියක් තියේ නම් දවන, පුච්චන අදහස් එනවා. මෝහ සමාධිය කියන්නෙ මේ දෙකෙන් එකතු වෙච්ච ඒවා. ඒ කියන්නෙ ලෝභ - මෝහ, ද්වේශ - මෝහ.

ඒ නිසා යථාර්ථය හොයන්න ඕන තමන්ගෙන් නෙවෙයි, ධර්මයෙන්. ධර්මය තේරුම් ගන්න ඥාන සම්ප්‍රයුක්ත නම්, ධර්මයට අනුකූලව හොයන්න නම්, තමන් ඒවා කරනවද කියල බලන්න, පාණාතිපාතා භික්ඛවේ අධම්මෝ පාණාතිපාතා වේරමණී ධම්මෝ අධම්මෝච භික්ඛවේ වේදිතබ්බෝ ධම්මෝච යථා ධම්මෝ යථා අත්ථෝ තථා පටිපජ්ජී තබ්බන්තී කියල මේ විදියට පෙන්වනවා. ඒ නිසා මේ ධර්මයයි, මේ අධර්මයයි කියල හොයන්නෙ ධර්මය තුලින්මයි. ඒක නුවණින් තේරුම් ගන්න ඕන. එතනදි තමන් ධර්මයක පිහිටන්න ඕන. තමා කියල පෙන්වන්නෙ අඳුරු දෙයක්. අවිද්‍යාවෙන් හට ගත්තු හිත, කය නිසා ඒක කොහොමත් තමා තමයි. ඒ නිසා ඇත්ත මොකක්ද කියල තමන්ගෙන් අහල හරි යන්නෙ නෑ. ප්‍රඥාවෙන් ගොඩ නැගිච්ච දේකින්මයි අහන්න ඕන. එතකොට ධර්මයෙන් තමයි අදහස එන්නෙ.

බුද්ධිය ගෝචර කරන ධර්මය තමයි වෙනත් විදියකින් කියනව නම් බුද්ධ ධර්මය කියන්නෙ. එතකොට ☞

හරි අදහස එනවා. ඒ අනුව හොයා ගෙන තමයි මොකක්ද තමන් කළ යුත්ත, නොකළ යුත්ත, ඉවත් කළ යුත්ත කියල දැන ගන්නෙ. ඒක කොහේවත් පොත් පත්වල නෑ. නුවණින් දකල තමන්ගෙ මනස සුද්ධ වුනාට පස්සෙ සමාධිය හදා ගන්න පුළුවන්. එතකොට නැවතත් බිහි වෙන්න, සසර සැරි සරන්න තියෙන අදහස් නැති වෙනවා. මම කවුරු වෙන්නද ? කොහේ යන්නද ? මොනව කරන්නද ? මොන තානාන්තරයක් ගන්නද ? මේ විදියට අදහස් එනවා. අනිච්ච, දුක්ඛ, අනත්ත නැති ලෝකයක් තිබුණ නම්, එහෙම වුනාට කමක් නෑ. නමුත් ලෝකයේ ඉන්න සියල්ලම අනිච්ච, දුක්ඛ, අනත්ත ගොඩවල් නම් ඒ අතරින් මම කවුරු වෙන්නද ? ලෝකයේ තියෙන හැම තැනක්ම අනිච්ච, දුක්ඛ, අනත්ත නම් මම කොහේ යන්නද ? සියලු තානාන්තර අනිච්ච, දුක්ඛ, අනත්ත නම් මම මොන තානාන්තරයක් දරන්නද ? ලෝකයේ ඉන්න සියලු පිරිස අනිච්ච, දුක්ඛ, අනත්ත නම් මම කවුරු ඇසුරු කරන්නද ? කවරෙක් වෙන්නද ? කරන සියලු ක්‍රියාවන් අනිච්ච, දුක්ඛ, අනත්ත නම් මම මොනවා කරන්නද ? කතා කරන සියලු දේවල් අනිච්ච, දුක්ඛ, අනත්ත නම් මම මොනවා කතා කරන්නද ? හිතන සියල්ලත් අනිච්ච, දුක්ඛ, අනත්ත නම් මම මොනවා හිතන්නද ? දහම වැටහුණා නම් මේ අදහස් එනවා. ලෝකයට අයිති දෙයක් තියේ නම් ඒවා හිතන්න, කියන්න, කරන්න දෙයක් නෑ කියල අදහස් එනවා.

එතකොට මම හිතන්නෙ, කියන්නෙ, කරන්නෙ නැත්ද ? හිතනවා, කියනවා, කරනවා. නිවන සඳහා යමක් කළ යුතුද, කිව යුතුද, සිතිය යුතුද ඒ දේ කරනවා, කියනවා, හිතනවා. මට විතරක්ද ? මට විතරක් කර ගත්තොත් ඇත්ද ? නෑ, ලෝකයාටත් යමක් කළ යුතුද, ඒ දේ කරනවා. හැබැයි ඒ හොඳ නිසා නෙවෙයි, ඒවත් අනිච්ච, දුක්ඛ, අනත්ත ගොඩවල්ම තමයි. නමුත් මඩ වළට වැටිච්ච කෙනා ගොඩ පැත්තට තියෙන මඩට අඩිය තිය තියා ගොඩට එනව වගේ, අඩිය තියන්න වෙන්නෙ මඩට. හැබැයි ඒ ගොඩ පැත්තට තියෙන මඩට. මේ විදියට අපිත් නිවන පැත්තට යන්න පහසු වෙන විදියට, පහසු තැනකට එන්න ඕන. ඒ විදියට ඇවිත් අන්තිමට එතනටත් ඇලෙන්නෙ නැති තැනකට එන්න ඕන. හැබැයි එතනට එනකල්ම ඇලෙන ගැටෙන ලෝකය තුලින්මයි යන්න වෙන්නෙ. මේ ක්‍රමයට යන පුද්ගලයන්ගෙ හිත ඒ ඒ මට්ටමට ප්‍රභාෂ්වර නම්, ඒ ඒ මට්ටමට ඒ පුද්ගලයට පෙනෙන දේවල් සුද්ධ ඇතිව පේනවා. හරි වැරදි දෙපැත්ත ඒ ඒ මට්ටමින් වෙන් වෙලා පේනවා. ඒකෙන් ලෝකයාට යහපතක් කරන්න පුළුවන් නම්, ඒ මට්ටමින් කරන්න පුළුවන්.

දැන් කෙනෙකුට ගැටළුවක් එන්න පුළුවන්, හොඳයි එහෙනම් නිවැරදි සම්මා සමාධියක් වැඩුවමත් ඇයි හැමෝටම ඒ වගේ බේත් ඖෂධ වර්ග ආදිය සමාධියට එන්නෙ නැත්තෙ කියල. ඒ වගේ දෙයක් කෙනෙක්ගෙ සමාධියට නැගෙන්නෙ, ලෝක සත්වයා කෙරෙහි කරුණාවෙන් මෛත්‍රියෙන් යහපතක් කරනව කියල අදහස් අරගෙන, ඒ විදිහට සසර පුරුදු පුහුණු කරල තිබුනොත් විතරයි. ඒ කියන්නෙ සත්වයින්ට මොනව හරි ලෙඩක් හැදුනම, ඒක කොහොම හරි සුවපත් කරන්න ඕන කියන අදහසක් ඇවිත් ඒ අනුව කටයුතු කරල තියෙන්න ඕන. ඒක මුල් කර ගෙන වඩපු හිතක් තියෙන්න ඕන. සසර පුරුද්ද ඇදිල එන්නෙ වඩපු හිතෙන්. වැඩිච්ච මට්ටමට පුරුද්ද ඇදිල එනවා. ඊට අනුව හිතන, කියන, කරන තරමට ඒ පුරුද්දත් වැඩි වෙනවා. එතකොට ඒක ක්‍රමයෙන් වර්ධනය වෙනවා. හිත වැඩෙනව කියන්නෙ ඒකයි. මොනව හරි කෙළෙස් දුරු වෙනවා. එහෙම නැත්නම් යටපත් වෙනවා. එතකොට තමයි ඒකට අදාල සමාධිය වැඩෙන්නෙ. කරුණා ගුණය මුල් කර ගෙන තමයි ඒක වැඩෙන්නෙ.

හැබැයි එහෙම කෙළෙස් දුරු වෙච්ච පළියට හැමෝටම බේත් සමාධියක් එන්නෙ නෑ. මොකද ඒකට අර වගේ සසර පුරුදු පුහුණු කරගත්තු දේ තියෙන්නත් ඕන. එතකොට ලෝභ, ද්වේශ, මෝහ සමාධි තියෙනවා. ඒ වගේ සමාධියකට කවදාවත් මේ වගේ බේත් ඖෂධ ආදී දේවල් ඇදෙන්නෙ නෑ. ඒවාට ඇදෙන්නෙ ලෝභ සහගත, ද්වේශ සහගත, මෝහ සහගත දහම්. ඒ ඒ සමාධි ගතිවල හැටියට ඊට ගැලපෙන්නා වූ ගති රුව තමයි නැගෙන්නෙ. සමහර අයට ද්වේශ සහගත සමාධි තියෙනවා. එතකොට දවන්න, පුච්චන්න, වනසන්න හිතෙනවා. ඒවාට ගැළපෙන පැති ඇදිල එනවා. ඒ නිසා සමාධියක් තිබුණ කියල උඩ පැන්නට හරි යන්නෙ නෑ. ඒක හරි භයානකයි. මොකද සම්මා සමාධි විතරක් නෙවෙයි මිථ්‍යා සමාධිත් තියෙනවා.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# ඒ ඒ මොහොතෙ දැනෙනා සැප මායාව

| | |
|---|---|
| සිත කය හැම විටම ඉල්ලයි ලොවේ | සැපා |
| දීමට නොහැකි නම් වන්නේ දුකකි | අපා |
| සිතුමට නොහැකි නම් එය මෝ අඳුර | කපා |
| හොඳ යැයි ගතොත් ලොව දුක දෙයි සැපය | පපා |

| | |
|---|---|
| අවිදුව නිසා දුක හට ගන්නේ | මෙහෙමයි |
| කාමය යොදා පුරවන්නේ එම | අඩුවයි |
| පිරෙනා විටදි අඩු වන්නේ හැඳු | දුකමයි |
| අඩුවන දුකට ලෝ සත රැවටෙති සැප | යැයි |

**පබැඳුම: ජගත් විදානපතිරණ - අත්තිඩිය**

| | |
|---|---|
| ගොඩ නැගු දුකෙහි අඩු වීමට සැප | කියතී |
| සැපයක් කොහිද මායාවක් නම් | පවතී |
| මේ ටික නොදත් ලෝ සත සසරෙහි | දුවතී |
| සැප පෙන්වලා දුක දෙන බව නොම | දනිතී |

| | |
|---|---|
| බොහො කල් සසර ආවේ මේ ටික | කරමින් |
| දුක් විඳ විඳා ගොඩ නැගු සැප හති | දමමින් |
| බුදු හිමි මෙත් සිතින් සත හට දෙසු | දහමින් |
| දැන ගති දකිති ලෝකය කුමටද | දරමින් |


| | |
|---|---|
| පෙර පිං කුසල් වේ නම් මෙය | වැටහෙනවා |
| බැඳෙනා මොහොතෙ සිහියෙන් හිඳ | වළකනවා |
| මේ කය තිබෙන තුරු දිය යුතු දෙය | දෙනවා |
| ඉඳුරන් සංවරයි සසරට සමු | දෙනවා |

**අභයරතනාලංකාරය - 43**

**සාසන න්‍යායේ බරපතලකම පෙන්වන කතා වස්තුවක් ........**

# තිස් අවුරුද්දක් තිස්සේ සිල් රැකලත් සතර අපාගත වුනු සැමියා සහ බිරිඳ

*(පසුගිය කලාපයෙන් - අද්භූත වූ අමනුෂ්‍ය කරදර නව ගුණ බලෙන් දුරු කළ හැටි...)*



**- වහරක අභයරතනාලංකාර හිමි**

මනුස්සයෙක් වශයෙන් ජීවත් වෙලා ඉඳෙද්දි කරන කියන කටයුතුවලින් යම් කිසි දෙයක් උපාදාන කර ගත්තම, මරණින් මතු ඇති වන මහා දුක් ගින්න ගැන මීට පෙරත් සාක්ෂි සහිතව කරුණු ඉදිරිපත් කළා. ඒ සම්බන්ධයෙන් අභයරතනාලංකාර හිමියන් ලබපු අත්දැකීම් කිහිපයකුත් අභයරතනාලංකාරය තුළින් ඉදිරිපත් කළා. ඒ වගේම සමහර උදවිය මැරෙන තුරාවටම හැම පෝයකටම සිල් අරගෙන ලෝක සම්මතයේ හොඳ උපාසකයෙක්, උපාසිකාවක් විදියට සමාජය ඉදිරියේ ගරු නම්බු නාම ලබල, අන්තිමට මරණින් මතු දුක්ඛිත තත්ත්වයට පත් වෙච්ච අවස්ථා ගැනත් මීට පෙර කරුණු ඉදිරිපත් කළා. අභයරතනාලංකාර හිමියන්ට දැන ගන්න ලැබුණු තවත් ඒ වගේ විශේෂ සිදුවීමක් තමයි මේ හෙළිදරව් කරන්නෙ.

මම ගිහි වතක ඉන්න කොට එක්තරා අධ්‍යාත්මික ශක්තියක් තිබ්බ්ච භික්ෂූන් වහන්සේ නමක්, උන් වහන්සේටම දැන ගන්න ලැබිච්ච සිදුවීමක් මාත් එක්ක ප්‍රකාශ කළා. දැන් උන් වහන්සේ ජීවතුන් අතර නැතත්, ඒ සිද්ධියට අදාල කරුණු කාරණාවල තියෙන සුවිශේෂත්වය අද ඉන්න උදවියටත් බොහොම වැදගත් නිසා ඒ පිළිබඳ දැනුවත්වීම වටිනවා. මේ සිද්ධිය මට කියපු ඒ හාමුදුරුවො දවසක් එක්තරා ගමක පොදු දානයකට වැඩියලු. ඒ ගමේ ඉන්න අය දානෙ දීල පුණ්‍යානුමෝදනාවක් එහෙම කළාට පස්සෙ, ඒකට සහභාගි වෙච්ච ඒ ගමේ ගෙදරක පිරිසක්, මියගිය තමන්ගෙ අම්මයි තාත්තයි ගැන මේ හාමුදුරුවන්ගෙන් ඇහුවලු. ඒ මියගිය අයට දරුවො දහ දෙනෙක් හිටියා. ඒ අය අතරින් කිහිප දෙනෙක් තමයි මේ විදියට ඇහුවෙ. අපේ අම්මයි තාත්තයි අවුරුදු තිහක් තිස්සෙ සිල් සමාදන් වුණා, දැන් ඒ අයගෙ තත්ත්වය මොකක්ද කියල මේ දැන් ඉන්න උප්පත්තිය ගැන තමයි ඇහුවෙ. අම්ම ගැරඬි සිල් රැකල තියෙනවා, තාත්ත පිඹුරු සිල් රැකල තියෙනවා කියල මේ හාමුදුරුවො උත්තරයක් දුන්නලු. දැන් ඉතින් මේ ගෙදර උදවියට මේක මහ ප්‍රශ්නයක්. මොකද ඒකට හේතුව ඒ වෙලාවෙ ඒ හාමුදුරුවො කිව්වෙ නෑ. ඒ නිසා මේ අය නැවතත් ඒ හාමුදුරුවන්ගෙන් ඇහුවලු, අවුරුදු 30 ක් තිස්සෙ සිල් රැක්ක අයට එහෙම වෙන්නෙ කොහොමද ඒක ඔප්පු කරන්න කියල. මාස 5 - 6 ක් යන කොට ඔප්පු වෙයි කියල මේ හාමුදුරුවො උත්තරයක් දුන්නලු.

ඔහොම කාලයක් යන කොට, එක අවස්ථාවක මේ ගෙදර අයගෙ වත්තට පිඹුරෙක් ඇවිත් ඒ ගෙදර උදවියම එකතු වෙලා ඒ සතාව මැරුවලු. එදාම ඒ ගෙදර ළමයෙකුට (මියගිය අයගෙ මුණුබුරෙකුට) යම් කිසි කෙනෙක් ආවේස වෙලා කියල තිබුණලු, තොපි දන්නවද තොපි මැරුවෙ කවුද, ඒ තොපේ තාත්ත කියල. ඒ පාර ගෙදර අය ඇහුවලු, එහෙම කියන්නෙ කොහොමද කියල. තොපේ අම්ම ඉන්න තැන බලාගන්න ඕන නම් අර උඩහ තියෙන බට පඳුර බලපන් කිව්වම, ගෙදර උදවිය එතැනට ගිහින් බලන කොට ඒ වත්තෙ උඩහ තිබ්බ්ච බට පඳුර ගැරඬියෙක් වෙලාගෙන ඉන්නවලු. මේක හරි පුදුම සිද්ධියක් කියල ඒ ගෙදර ළමයෙකුට අර හාමුදුරුවො මීට මාස කීපයකට පෙර කියපු කතාව මතක් වෙලා, දැන් ඉතින් මොකද කරන්නෙ කියල ඇහුවම, ආවේසයෙන්ම කිව්වලු, ගෙදර ඔක්කොම එකතු වෙලා මීනී පෙට්ටියක් හදල මැරිච්ච තාත්ත ගෙනියන විදියටම ඒ පිඹුරුව පෙට්ටියට දාල ගරුසරු ඇතිව වළලපියව් කියල. ඉතින් ඒ ගෙදර උදවියත් ඒ කියපු විදියටම පෙට්ටියක් හදල, තාත්ත නැතිවුණා කියල අර මැරිච්ච පිඹුරුව නැවතත් ගෙනිහින් වළ දැම්මලු.


එතකොට මේ කතාව මාත් එක්ක කියපු ඒ භික්ෂූන් වහන්සේට යම් කිසි දිවැසක් වගේ හැකියාවක් තිබිල එහෙම කිව්ව වෙන්නත් පුළුවන්. එහෙම නැත්නම් ඒ හැකියාව වෙනත් විවිධ ක්‍රමවලින් එන්නත් පුළුවන්. උදාහරණ විදියට චාතුර් මහා රාජික දිව්‍ය ලෝකයෙන් පාලනය වන විවිධ භුමාටු දේවතා කොටස් ඉන්නවා. ඒ අයටත් යම් කිසි ආකාරයක දිවැසක් තියෙනවා. එහෙම අය සමහර විට මනුස්සයො ඇසුරට ඇවිත් තමන්ගෙ ඥාතීන්ට සම්බන්ධ වුනාම, ඒ වගේ අයටත් අර වගේ හැකියාවන් ලැබෙනවා. හැබැයි ඒකටත් යම් කිසි අධ්‍යාත්මික හේතුවක් තියෙන්න ඕන. එතකොට ඒ අය මාර්ගයෙන් දිවැස් තියෙන අයට වගේ යම් යම් දේවල් කියන්න පුළුවන්. ඒ වගේ වෙලාවට සමහර විට කෙනෙක් හිතන්න පුළුවන්, ඇත්තටම ඒ පුද්ගලයට දිවැස් තියෙනව කියල. නමුත් එතකොට දිවැසකින් නෙවෙයි කියන්නෙ. අර වගේ දෙවන පාර්ශවයක් ඒ පුද්ගලයගෙ කිරණ වළල්ලට සම්බන්ධ වුනාම ඒ කිරණ ශක්තියෙන් තමයි සාමාන්‍ය අයට නොපෙනෙන දේවල් දකින්නෙ, විවිධ ශබ්ද අහන්නෙ. ඒක ධ්‍යාන අභිඥාවක් හෝ දිවැසක් නෙවෙයි. ඒකත් එක්තරා කර්ම විපාකජ සෘද්ධියක්, එහෙම නැත්නම් පුණ්‍ය සෘද්ධියක්. තව කෙනෙක්ගෙ සම්බන්ධයෙන් තමයි එහෙම දකින්නෙ, අහන්නෙ. තවත් කෙනෙක්ගෙ සම්බන්ධයක් නැත්නම් ධ්‍යාන ලබල දිවැස්, දිවකන් පහළ කර ගන්න ඕන. ඉතින් මේ වගේ විවිධාකාර ක්‍රමවලින් නොපෙනෙන ලෝකය අහන්න, දකින්න පුළුවන්.


දැන් මේ කතාවෙන් අපට ගන්න වැදගත් කාරණා කිහිපයක් තියෙනවා. පිඹුරු සිල් කියන්නෙ, සිල් අරගෙන ☞

හොඳට එළිවෙන කල් බුදිය ගෙන ඉඳල ගෙදර යෑම. ගැරඬි සිල් කියන්නෙ, සිල් අරගෙන අනුන්ට ගරහමින් ආඬපාලි කියමින් අනුන්ගෙ ඇද පළුඳු හොය හොයා ඉඳල ගෙදර යෑම. ඒ කියන්නෙ සිල් පද ටික නිකං සමාදන් වෙනවා. ඊට පස්සෙ ඔළුව උස්ස උස්ස වට පිට අයගෙ ඇද පළුඳු හොයනවා. හරියට ගැරඬිය වගේ. ඒකට තමයි ගැරඬි සිල් කියන්නෙ. වෙනත් විදියකින් කියනව නම්, මේ පිඹුරු සිල් සහ ගැරඬි සිල් කියන අවස්ථා දෙකේදීම, පින්වතුන් විසින් සැදැහැ සිතින් දෙන දානය අරගෙන ප්‍රමාද වෙන විදියට වැඩ කර ගන්නවා. අනුන් දෙන දානය අරගෙන එහෙම කළාම, ඒක ගෙදර ඉඳගෙන සිල් සමාදන් වෙනවට වැඩිය භයානකයි. මොකද කෙනෙක් මේ වගේ අවස්ථාවක දානය දෙන්නෙ සාසන මාර්ගය රකින්න. නමුත් ඒක කරන්නෙ නැතිව අර වගේ පිඹුරු සිල්, ගැරඬි සිල් තමයි මේ දෙන්නම අවුරුදු 30 ක් තිස්සෙ රැකල තිබුණෙ. ඒකෙ විපාකය තමයි මළාට පස්සෙ ආවෙ.

එතකොට බුද්ධ සාසනය තුළ සිල් වතක් සමාදන් වෙච්ච කෙනෙකුට පින්වත් පිරිස් දානය පූජා කරන නිසා, එදාට තමන්ට වෙනම තනියෙන් දානය හදා ගන්න බෑ. ඒ නිසා එදාට ඒ දෙන දානයෙන් යැපෙන්න ඕන. එහෙම දානය ගත්ත නම් ඒ සිල් වතත් හරියට රකින්න ඕන. බුදුන් වහන්සේගෙ දේශනාවෙ තියෙන්නෙ, ණය නැති වෙන්න නම් මොහොතක් හෝ හරියට තේරුම් අරගෙන දහම් මග අනුගමනය කළ යුතු බව. අච්චරා සංඝාත වග්ග සූත්‍ර සිය ගණනාවකම මේ කාරණය පෙන්වා තියෙනවා. අසුරු සැණක් ගහන මොහොතක් හරි මෙත් සිත හෝ අනිච්ච සංඥාව හෝ අසුභානුස්සතිය හෝ දස අනුස්සති හෝ වැඩුවොත් ඒ ණයින් නිදහස් වෙනවා. ඒ නිසා ඒ කාලය තුළ සාසන මාර්ගය රැක ගෙන ඉන්න ඕන. කෙටියෙන් කියනව නම්, මොහොතක් හරි බණ අහල තේරුම් අරගෙන ඉන්න ඕන. ඒ සඳහා එක බණ පදයක් හෝ අර්ථවත්ව ධර්මානුකූලව තේරුම් ගත්ත කෙනෙක් වෙන්න ඕන. එහෙම නැත්නම් තේරුම් ගන්න උත්සාහ කරන්න ඕන. එහෙම නැතිව වෙන වෙන දේවල් කරල හරි යන්නෙ නෑ.

යම් කිසි විදියකට නොදන්න කෙනෙක් ඉන්නව නම්, මම දන්නෙ නෑ කියල හරි යන්නෙ නෑ. දන්නෙ නැත්නම් අනෙක් වැඩ පැත්තකට දාල දැන ගන්න උත්සාහයක් හරි කරන්න ඕන. එහෙම උත්සාහ කළොත් ඒකත් හරි. එක බණ පදයක් හරි අර්ථය, ධර්මය දැන ගෙන තෝර ගත්ත නම් ඒක මොහොතක් හරි අනුගමනය කරන්න ඕන. එහෙම කළොත් ඒ පුද්ගලය තමන් ගත්ත දානයට ණය නෑ. එහෙම නැතිව නිකම්ම බලාගෙන හිටියට හරියන්නෙ නෑ. නාම මාත්‍රයක් තිබුණත් හොඳ නිසා නිකම් බලාගෙන හිටියත් නරක නෑ. නමුත් ණය පියවෙන්න නම් අර විදියට කටයුතු කරන්න ඕන. හැම කෙනෙක්ම නිවන් දකින්න තියෙන අසූ හාරදාහක් තොටුපළවල්වලින් එකම මගට හෙවත් ආර්ය අෂ්ඨාංගික මාර්ගයට බහින්න, එයින් එක තොටුපළක්වත් හොයා ගන්න උත්සාහ කරන්න ඕන. නිවනට යන එක මගක් හරි අඩු තරමින් තෝර ගෙන ඒ දැකපු මග අනුගමනය කරන්න





ඕන. එතකොට ඒ පුද්ගලය ගත්තු දානෙට ණය නෑ. එහෙම නැත්නම් හරි භයානකයි. ඒ නිසා නිකං සුදු රෙද්දක් ඇඳගෙන සිල් පද ටික කිව්වට හරි යන්නෙ නෑ.

මේ වගේ තවත් සිදුවීමක් මම ගිහි කාලෙ සාසන වත් පිළිවෙත් සිදු කරමින්, පින්වත් පිරිස ඒ කටයුතුවල යොදවන කොටත් අත් දකින්න ලැබුණා. එක පෝය දවසක එක්තරා උපාසක අම්ම කෙනෙක් සිල් සමාදන් වෙන්න ආවා. හැබැයි මාන්නයක හැටි කියන්නෙ, ඒ උපාසක අම්ම අනිත් අයත් එක්ක සිල් ගත්තෙ නෑ. අංශු මාත්‍රයක හරි ධර්මාවබෝධයක් තිබුණද කියල බලා ගන්න පුළුවන් හොඳ අවස්ථාවක් තමයි මේ. මේ කාලයක් සිල් ගත්තු උපාසක අම්ම කෙනෙක්. හැබැයි මෙතනට ආවෙ සිල් ගන්න නෙවෙයි, තමන්ගෙ විශේෂත්වය පෙන්වන්න. මම ඉතින් පිරිසට සිල් පද ටික දුන්නම මේ උපාසක අම්ම කියනවා, මම එක සැරයක්වත් සිල් සමාදන් වුනේ නෑ, මම ඒ අයත් එක්ක සිල් ගන්නෙ නෑ කියල. මම ඇයි කියල ඇහුවම, මම දස සිල් ගන්නෙ ඒ අය අට සිල්නෙ ගන්නෙ ඒ නිසා මට වෙනම සිල් දෙන්න කිව්වා. දැන් මේ ප්‍රසිද්ධියේ අනෙක් පිරිස ඉදිරියේ සිල් ගන්න තමයි ඉල්ලන්නෙ. ඉතින් මම සිල් පද ටික කියාගෙන ගියා. නච්ච ගීත වාදිත විසූක දස්සනා වේරමණී, මාලා ගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූස නට්ඨානා වේරමණී කියල සිල් පද 2 ක් තියෙනවා. එතනින් මාලා ගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූස නට්ඨානා වේරමණී කියන්නෙ වෙනම කොටසක්. එතනින් තමයි ඒ සිල් පද 2, දෙකට කැඩෙන්නෙ. ඒක දෙකට කඩල ඊළඟට ජාත රූප රජත පටිග්ගහනා වේරමණී කියන සිල් පදයත් එක්ක තමයි 10 ක් වෙන්නෙ.

දැන් ඉතින් මම නච්ච ගීත වාදිත විසූක දස්සනා වේරමණී කියල සිල් පද 2, දෙකට කඩල කියන කොට, මේ උපාසක අම්ම එතනින් සිල් පදය කඩන්නෙ නැතිව, මාලා ගන්ධ විලේපන ... වශයෙන් ඔක්කොම එකට කියාගෙන ගියා. මම කිව්ව ඉතින් සිල් පදය වෙනම හරියට කියවුනේ නැනෙ, ඒ නිසා දස සිල් වෙන්න නම් නැවත සැරයක් ඕක කොටස් 2 කට වෙන් කරල සමාදන් වෙන්න කියල. එහෙම කියල මම නැවතත් පද වෙන් කරල කිව්වා. දැන් මේ උපාසක අම්ම නැවතත් මාලා ගන්ධ විලේපන ධාරණ ... කියල අර කලින් විදිහටම දිගටම කියාගෙන ගියා. මම කිව්වා, වැරදියි වැරදියි නවත්වන්න කියල. දැන් ඉතින් උපාසක අම්ම උඩ බලනවා. ඉන්න පිරිසත් ඔක්කොම හිනා වෙන්න පටන් ගත්තා. දැන් මේ උපාසක අම්මට හරි ලැජ්ජයි. දස සිල් සමාදන් වෙනව කියල කිව්වට සිල් පද 10 වත් වෙන් කරල කඩා ගන්න දන්නෙ නෑ. එතකොට මාන්නයක් තමයි එතන තිබුණෙ. මාන්නය පෙන්වන්න ඇවිත් අන්තිමට පහත් තත්ත්වයට පත් වුණා.


ඉතින් මම කිව්වා, ඔච්චර ඕන නෑ එක පදයක් හරියට සමාදන් වෙලා රකින්න කියල. ඒ නිසා පාණාතිපාතා පදය සමාදන් වෙන්න පටන් ගන්න කිව්වා. ඊට පස්සෙ මම ඇහුවා මොකක්ද සමාදන් වෙච්ච පදය කියල. දැන් මේ උපාසක අම්ම උඩ බලාගෙන සියල්ලම ඉදිරියේ හොඳටම ලැජ්ජාවට පත් වෙලා. එක සිල් පදයක් රකින්න බැරිව 10 ක් රකින්න ගිහින්, දැන් එතන හිටපු පොඩි ළමයි පවා කෑ ගහන්න පටන් ගත්තා, මම කියන්නම් මම කියන්නම් පළවෙනි සිල් පදය කියල. දැන් මේ උපාසක අම්ම දුක් වෙනවා. මම ඉතින් ඒ ළමයින්ට ඒක කියන්න කිව්වෙ නෑ. මොකද එහෙම වුනා නම් මේ උපාසක අම්ම තවත් අපහසුතාවයට පත් වෙනවා. අන්තිමට මේ පළවෙනි සිල් පදය සිංහලෙන් තේරුම් ගන්න කියල මම ඒක මේ විදියට විග්‍රහ කරල දුන්නා.

''ජීවිතාන්තය තෙක් ඒ රහතන් වහන්සේ පර පණ නැසීමෙන් වෙන්ව, පර පණ නැසීම අත හැර, බහා තැබූ දඬු මුගුරු ඇතිව, බහා තැබූ දූල් උගුල් ආයුධ ඇතිව, පාපයට ලැජ්ජා ඇතිව බිය ඇතිව, දයාවට පැමිණ සියලු ප්‍රාණ භූතයන් කෙරෙහි හිතානුකම්පාවෙන් වාසය කරන්නේය. උන් වහන්සේ අනුගමනය කරන මමද පර පණ නැසීමෙන් වෙන්ව, පර පණ නැසීම අතහැර, බහා තැබූ දඬු මුගුරු ඇතිව, බහා තැබූ දූල් උගුල් ආයුධ ඇතිව, පාපයට ලැජ්ජා ඇතිව බිය ඇතිව, දයාවට පැමිණ සියලු ප්‍රාණ භූතයන් කෙරෙහි හිතානුක-ම්පාවෙන් වාසය කරන්නේය. මේ මාගේ පළමු වන සික්ඛා පදයයි.''

මම මේ විදියට කියල ඉස්සෙල්ලම එක සිල් පදයක් සමාදන් වෙලා, එකේ ඉඳන් ඉගෙන ගන්න කියල කිව්වා. දැන් ඉතින් බොහොම ලැජ්ජාවෙන් බලාගෙන ඉන්නවා. මම කිව්ව ඉතින් සිල් පදය කියන්න තියා තවම තේරුම් ගන්නවත් සිහියක් නැනෙ, ඔය වගේ සිල් ගන්න එපා, සිල් ගන්නව නම් හොඳට එක පදයක් තේරුම් අරන් එකේ ඉඳන් රකින්න පුරුදු වෙන්න කියල. මෙහෙම කිව්වට පස්සෙ, අනේ මට වෙච්ච දෙයක් කියල බොහොම දුක් වුනා. මෙන්න මේ විදියට මාන්නයට සිල් ගන්න උදවිය සමාජයේ ඉන්නවා. මාන්නයට සිල් ගන්න ගිහින් අන්තිමට තමන්ම අපහසුතාවයට පත් වෙනවා. ඉතින් මේ වගේ නොදැන, මාන්නයෙන් කරන වැඩ මහ භයානකයි. තමන්ට ලැජ්ජා වෙන්න වෙනවා. ඒ දෘෂ්ටියේම හිටියොත් මරණින් මතු දුක්ඛිත තත්ත්වයට පත් වෙන්න සිද්ධ වෙනවා.

ඒ වගේම අර පළමුවෙන්ම සඳහන් කරපු කතාවෙන් තවත් වැදගත් කාරණයක් පැහැදිලි වෙනවා. යමෙක් එක අත්බැවක ඉඳල මැරිල චුති -පටිසන්ධි වෙලා තවත් අත්බැවක උපන්නම, වැඩිපුරම මතකයට එන්නෙ ආසන්නම මිනිස් අත්බවයේ උපාදාන වෙච්ච චිත්තජ රූප හෝ කර්මජ රූප. ඒවත් කර්ම ශක්තියෙන්මයි එන්නෙ. චුති - පටිසන්ධි





වුනත් ඒ ආසන්නම මිනිස් අත්බවයේ චිත්තජ රූප තවමත් මැකිල නෑ. සතර අපායේ හුඟක් පහළට ගියොත් තමයි ඒ මතකය මැකිල යන්නෙ. එහෙම නැත්නම් ආසන්න අත්බවයක තිරිසනෙක් වෙලා උපන්නත්, එතැනින් නැවතත් මැරෙන-කොටම ඒ තිරිසන් අත්බැවේ චිත්තජ රූප නෙවෙයි මතකයට එන්නෙ, ආසන්නම මනුස්ස අත්බැවේ චිත්තජ රූප. ඒ නිසා සතෙක් මැරුනමත් එක පාරටම මිනිස් අත්බවයක හිටපු තැනකට තමයි හිත හිටින්නෙ. එහෙම හිත හිටල තමයි ඒ මනුස්ස වෙලා ඉඳෙද්දි කරපු කුසල් අකුසල් අනුව දෙවෙනි වතාවට මොකක් හරි එකකට හිත ගිහින් උපාදාන කරගන්නෙ. ඒකත් එක්තරා රහසක්. හැබැයි හුඟක් අය හිතන් ඉන්නෙ, සතෙක් වෙලා උපන්නොත් ඒ සතාගෙ හැඩරුවම එනව කියල. නමුත් ඒක එහෙම වෙන්නෙ නෑ. ඒක තමයි විශේෂත්වය.

උදාහරණයක් විදියට මනුස්සයෙක් මැරිල චුති-පටිසන්ධි වෙලා බල්ලෙක් උපන්නොත්, ඒ තිරිසන් බලු ස්වරූපය මනසෙ රැඳෙන්නෙ නෑ. කවද හරි මනුස්ස ස්වරූපයෙන් ඉඳල කරපු කියපු දේකට තමයි හිත හිටින්නෙ. මිනිස් වෙලා හිටපු ආසන්නම අත්බවයක, මිනිස් නුවණට වැටෙන චිත්තජ රූප තමයි මනසෙ රැඳෙන්නෙ. දෙවියෙක් වුනත් එහෙමයි. හැම වෙලේම ආසන්නම මිනිස් අත්බවක චිත්තජ රූප තමයි හිතේ ඇඳෙන්නෙ. දේව රූපයක හෝ වෙනත් තිරිසන් වෙලා හිටපු අවස්ථාවක රූපයක් නැගෙන්නෙ නෑ. බ්‍රහ්ම වුනත් එහෙමයි. චුත වෙන කොට ඒ හිතේ තිබ්ච්ච මනුස්ස රූපයකින් තමයි ඉස්සෙල්ලම සංඥාව එන්නෙ.

හැබැයි ඒ සංඥාව ආවට ඒක අල්ලන්නෙ නෑ, උපාදාන කරන්නෙ නෑ. එතන ඉඳන් මොනවද කරල තියෙන කුසල් අකුසල්, ඒකෙන් එකක් තමයි ඊළඟට ඇදිල එන්නෙ. ඒකත් හුඟක් අය නොදන්න රහසක්. මොකද ඒක දකින්න නම් චුතූපපාත ඥානය පහළ වෙන්න ඕන. සත්වයින් චුත වෙන හැටි, බිහි වෙන හැටි, ඒ වෙලාවට මොකද වෙන්නෙ කියල ඒ ඥානයෙන් දකල තියෙන්න ඕන. හැබැයි මෙතනදි තත්පරයකින් කෝටි ලක්ෂයකින් එකක් විදිහට උපමා කරල පෙන්වන චුති - පටිසන්ධි කියන අති සූක්ෂම චිත්තක්ෂණ අවස්ථා 2 දකින්නෙ අනාවරණ ඥානය තියෙන බුදුන් වහන්සේ විතරයි. අනිත් අයට ඒ අවස්ථා දකින්න බෑ. චුත වෙන හැටි බිහි වෙන හැටි විතරයි අනික් අයට දකින්න පුළුවන්. නමුත් ඒක දකින්නෙ නැති අයට මේ කාරණය හරියට තෝර ගන්න බෑ.

මේකට උදාහරණයක් දහමෙ සඳහන් වෙනවා. බුදුන් වහන්සේ වැඩ ඉන්න කාලෙ හිටපු තෝදෙය්‍යා කියන බමුණා මැරිල ගිහින් බල්ලෙක් වෙලා ඉපදුණා. බල්ල වෙලා බුදුන් ☞

වහන්සේට බුරන්න ගත්තම, උන් වහන්සේ ඒ බල්ලට ආමන්ත්‍රණය කළේ, තෝදෙයිය තෝ එදා බුරල බල්ලෙක් වුණා, අද බුරල උඹ අවීචියට යනව කියල. මෙහෙම කිව්වම ඒ බල්ලට ලැජ්ජ හිතුණා. එතකොට උන් වහන්සේ උඹට බල්ල කියල නෙවෙයි කතා කළේ, එදා මිනිස් වෙලා හිටපු තෝදෙයියා කියන නමින්. තිරිසන් සතාට වුනත් කෙලින්ම මතකයට නැගෙන්නෙ පෙර හිටපු මිනිස් අත්බැව. මොකද බලු අත්බැවෙන් කතා කළාට බලු අත්බැව මනසෙ රැඳෙන්නෙ නෑ. මනුස්ස අත්බැවක් හැර වෙන කිසිම අත්බැවක් මනසෙ රැඳී හිටින්නෙ නෑ. කොයි විදියකින් හරි මිනිස්ව ඉඳල කරපු එකක් මතක් වෙලා තමයි ඊළඟ අත්බැව අල්ල ගන්නෙ. මොකද මිනිස්ව ඉඳෙද්දි තමයි අත්බැවක් ලබන සංඛාරයක් ගොඩ නැගෙන්නෙ. සතෙක් වෙලා ඒක කරන්න බෑ. සතෙක් වුනාට පස්සෙ විඳින්නෙ ඒකෙ විපාකය. සතෙක් තවත් සතෙක් මැරුවොත් ඒකෙ විපාකය එතනදි නෙවෙයි එන්නෙ. මනුස්ස වෙලා ඉඳෙද්දි කරපු විපාකයක් තමයි ආවත් ඇදිල එන්නෙ. ඒක තමයි මිනිස් අත්බැවක තියෙන විශේෂත්වය.

මොන විදියක පවක් හෝ පිනක් කළාම ඒක ජනක කර්මයක් වෙන්න නම් මිනිස් අත්බැවක ඉඳල කරපු එකක්ම වෙන්න ඕන. ඒ කියන්නෙ මිනිස් වෙලා ඉඳෙද්දි හිතපු, කියපු, කරපු දෙයක්. එතනිනුත් කරපු කියපු දෙයක් විශේෂයි. ඒ නිසා මිනිස් වෙලා කරපු කියපු දේකින්ම තමයි ඊළඟ අත්බැවක් හදන්නෙ. මොන අත්බැවක හිටියත් ඒකෙන් එන විපාක තමයි අනික්වා සියල්ලම. ඒ අත්බැවෙන් මැරෙන කොට නැවත වාරයක් උපදින්න නම්, පෙර මනුස්සයෙක් වෙලා ඉඳෙද්දි කරපු කියපු දෙයක්ම ඇදිල එන්න ඕන. එතකොට විශේෂයෙන්ම ඇදිල එන්නෙ ආසන්නයේම හිටපු මිනිස් අත්බැවක කරපු කියපු දෙයක්. එහෙම එකක් ඇදිල ආවට පස්සෙ ඒකට හිත ගිහින් තමයි දෙවනුව ඊළඟ අත්බැවට හිත යන්නෙ. එතනදි ඉස්සෙල්ලම ඇදෙන්නෙ ආසන්න කර්මයක්. ආසන්න කර්මයක් නැත්නම්, නිතර පුරුදු පුහුණු කරපු ආචින්න කර්මයක් ඊළඟට ඇදෙනවා. ඒකත් නැත්නම් අපරාපරීය කර්මයක් ඇදෙනවා.

ඒ නිසා තමයි සම්පූර්ණ ලෝක විනාසයක් සිද්ධ වුනාට පස්සෙ, සියලු ලෝකවල හිටපු සියලු සතුන් ආභස්සර බ්‍රහ්ම ලෝකයේ ඉපදිලා නැවතත් අලුත් ලෝකයක් පටන් ගන්න කොට, ආභස්සර බඹ ලොවේ බ්‍රහ්මත්වයේ ඉඳන් චුත වෙලා ඉස්සෙල්ලම එන්නෙ මිනිස් අත්බැවකට. මිනිස් අත්බැවක ඉඳෙද්දි කරපු දෙයක්මයි ඇදිල ඇවිත් එතනදි ඉස්සෙල්ලම උපාදාන වෙන්නෙ. ආභස්සර බ්‍රහ්ම ලෝකයේ ඉඳල පල්ලම් බහින කොට සියල්ලම මිනිස් බවට පත්වෙන්න හේතුව, ඉස්සෙල්ලම මනුස්ස සංඛාරයක්ම ඇදිල ඒම. ඒක හොඳ සංඛාරයක්. එහෙම නැතුව බඹ ලොවින් චුත වෙලා එක පාරටම තිරිසන් වෙන්නෙ නෑ. මොකද තිරිසන් අත්බැවක චිත්තජ රූපයක් මතකයේ රැඳෙන්නෙ නෑ. සතෙක්ගෙ චිත්තජ රූපය ඇදෙන්නෙ නෑ, මිනිස් වෙලා හිටපු අවස්ථාවක චිත්තජ රූපයක කුසල් අකුසල් තමයි ඇදෙන්නෙ.

මේ කුසලයක් හෝ අකුසලයක් ඵල දෙන්න නම් ජනක කර්මයක් වශයෙන් මිනිස්ව ඉඳලම කරපු එකක් වෙන්න ඕන. ඒ නිසා එතනින් මැරිල චුත වෙන කොටම භවය තුළ තිරිසන් ස්වරූපයක් උපාදාන වෙන්නෙ නෑ. තිරිසන් ස්වරූපය එන්නෙ විපාකයට. උපාදාන කරන්නෙ හැම වෙලේම මනුස්ස රූපයක්. සතාට ඒ වෙලාවෙ උපනිශ්‍රය වෙන්නෙ, අනුශය වශයෙන් තිබ්ච්ච දේකින් මතුවෙලා ආපු, මිනිස්ව ඉඳෙද්දි කරපු අපරාපරීය කර්මයක්. ඒ අනුශය තමයි නැගිල එන්නෙ. අනුශය විදියට රැඳිල තිබුණාට, අනුශයෙන් උපදින්නෙ නෑ. අනුශය රැඳී හිටල නැගී හිටියොත් තමයි උපදින්නෙ. අනුශය නැගී හිටින්න නම්, මතකය පෙර කරපු කර්මයක් අරන් යන්න ඕන. ඒ නිසා මතු උපදින්න හේතු විය යුතු ජනක කර්මයක් එන්න නම් මිනිස් අත්බැවක කරපු කියපු දේකට හිත හිටින්න ඕන. එතකොට ඊට පෙර අන්තිම මනුස්ස අත්බැවේ වඩපු එකක් තමයි ඉස්සෙල්ලම ඇදෙන්නෙ. එතනට ගිහින් ඒ හිතෙන් අල්ලන්න එකක් නැත්නම් තමයි ඊටත් පෙර එකක් අල්ල ගන්නෙ. ඒක සාමාන්‍ය අය දකින්නෙ නැති රහසක්. සතෙක් වෙලා කොච්චර කල් හිටියත්, ඒ ආසන්නයේ හිටපු මිනිස් අත්බැවටම තමයි හිත යන්නෙ. එතන ඉඳල ඊළඟට තියෙන එක තමයි උපාදාන කරන්නෙ.

උදාහරණ විදියට පාරිලෙයිය වනයේ හිටපු ඇතා බුදුන් වහන්සේට දන් දෙන කොට චිත්ත ප්‍රසාදයක් ඇති වුණා. හැබැයි ඒ වෙලාවෙදි ඒ දන් දීමේ කටයුත්ත උපනිශ්‍රයක් වුනා විතරයි. ඒ උපනිශ්‍රය වෙන්න මතක් වෙලා ඇදිල ආවෙ, පෙර මනුස්ස වෙලා ඉඳෙද්දි කරපු දෙයක්. මැඩියෙක් මණ්ඩුක කියන දිව්‍ය පුත්‍රයෙක් වුනේ බුදුන් වහන්සේගෙන් බණ අහමින් ඉඳල. නමුත් කෙනෙකුට හිතෙන්න පුළුවන්, එතකොට තිරිසන්ගත මැඩියෙක් වෙලා බුදුන් වහන්සේගෙන් බණ ඇසීමද ඊළඟ අත්බැවට යොමු වෙන්න හේතු වුනේ කියල. ඒක නෙවෙයි. ඒ බණ ඇහෙන සංඥාවට හිත තියාගෙන හිටියා. ඒ සංඥාවට හිත තියන්න හේතුවත් පෙර මනුස්සයෙක් වෙලා ඉඳල කරපු කියපු දෙයක්. එතකොට බණ ඇසීම උපනිශ්‍රය වුනා විතරයි. ඒත් එක්කම මතක් වුණා, මනුස්සයෙක් වෙලා ඒ වගේ බණ අහපු හැටි, වතාවත් කරපු හැටි. ඒ අවස්ථාවෙදි තමයි එතනට හිත හිටියෙ. මනුස්සයෙක් වෙලා හිටපු කාලයක ඒ වගේ අවස්ථාවක් මතක් වෙලා ඒක උපනිශ්‍රය වෙලා තමයි දෙව් වුණේ. නමුත් ඒ කාරණය වරද්ද ගත්තු සමහරු හිතනවා, මැඩියෙක් වෙලා බණ අහල දේවත්වයට පත් වුණා කියල. හැබැයි එහෙම වෙන්නෙ මේ විස්තර කරපු ක්‍රමවේදයට අනුව.

මේකට තවත් හොඳ සාක්ෂියක් ත්‍රිපිටක ධර්මයේ තියෙනවා. සැරියුත් මහ රහතන් වහන්සේ සච්ච විභංග සූත්‍රය දේශනා කරන වෙලාවෙ, බ්‍රහ්මයො ඇවිත් බොහොම සංවරව නිස්කලංකව ඒ බණ අහගෙන හිටියා. එතකොට උන් වහන්සේ හිතනවා, මේ අයගෙ තියෙන සංවරකම කොච්චරද කියල. මේ අවස්ථාවෙ බුදුන් වහන්සේ ඍද්ධියෙන් එතනට වැඩම කරල අහනවා, සාරිපුත්ත ඔබට හිතෙන්නෙ ඒ බ්‍රහ්මයො සංවර වෙලා තියෙන්නෙ කොයි කාලෙද කියල. ඔය බ්‍රහ්ම වෙලා තිබ්ච්ච සංවරකමක් නෙවෙයි, මනුස්ස වෙලා හිටපු කාලයක වඩපු සංවරත්වය තමයි තියෙන්නෙ කියල බුදුන් වහන්සේම ඒ කාරණය පැහැදිලි කළා.

දැන් මෙතනදි වැදගත් කාරණයක් මතු වෙනවා. සංවරත්වයක් හෝ ලබන්නෙ මිනිසත් වෙලා හිටපු කාලයක තිබ්ච්ච සංවරත්වයකින්. ඒකම තමයි මැරිල චුති-පටිසන්ධි වෙන කොටත් ඇදිල එන්නෙ. එදා හිටපු තත්ත්වය උපනිශ්‍රය කර ගෙන නැවතත් මිනිස් අත්බැවකට හෝ වෙනත් සුගති අත්බැවකට යනවා. ඒ නිසා තමයි සතෙක් වෙලා උපන්නොත් එහෙම නැවතත් ගොඩ එන්න හරි අමාරු වෙන්නෙ. මොකද උපනිශ්‍රය ලබන කොට සතෙකුට දහම් උපනිශ්‍රයක් ලැබෙන්නෙ කලාතුරකින්. ඒකට මේ වගේ බුද්ධ සාසනයක්ම පවතින්න ඕන. එහෙම නැත්නම් සත් පුරුෂ සංසේවනය උපනිශ්‍රය විදියට ලබන්න ඕන. එහෙමත් නැත්නම් ආර්ය උත්තමයෙක් ඉන්න තැනක ඒ සතා උපදින්න ඕන. ඒ වගේ මොකක් හරි වාසනාවක් ලබන්න ඕන. ඒ නිසා මනුස්සයො ආශ්‍රිතව ඉන්න සතුන්ට ඒ වාසනාව ලැබෙනවා. හැබැයි එතනින් වන ගත වෙලා මනුස්ස ඇසුර නැති වුනොත්, නැවතත් හොඳ පැත්තට ලේසියෙන් උපනිශ්‍රයක් ලැබෙන්නෙ නෑ. ඒ නිසා කැලේ ඉන්න සත්තු අනාථයෙන් අනාථයි. කප තියෙන කල් උන්ට මිනිස්

ඇසුරක් ලබන්න අමාරුයි. කැලෙන් කැලේටම යනවා. එතනදි බොහෝ කොටම උපනිශ්‍රය වෙන්නෙ මනුස්ස වෙලා ඉඳෙද්දි කරපු වනචර වැඩක්. වනචාරී කියන්නෙත් කැලෑ ගතිය කියන එක. මිනිස් වෙලා හිටපු කාලයක කරපු වනචර වැඩක් තමයි ඇදිල එන්නෙ. මනුස්සයෙක් වෙලා ඉන්න කොට කරපු ඒ වගේ පහත් වැඩක් ජනක කර්මයක් වෙලා ඇදිල ඇවිත් නැවතත් තිරිසන් වෙලා උපදිනවා. හැබැයි මිනිස් ආශ්‍රයේ හිටපු සතෙක් එක පාරටම කැලෑවට යන්නෙත් නෑ. ඉස්සෙල්ලම එන්නෙ මනුස්සයින්ගෙ ඇසුර ලබන්න පුළුවන් සතෙක් වෙලා.

ඒ වගේ අර පළවෙනි කතාවෙදි, ඒ මරපු පිඹුරත් එතනින් චුති-පටිසන්ධි වෙන කොට, ඉස්සෙල්ලම ඊට පෙර හිටපු මිනිස් අත්බැවට තමයි හිත ගියේ. ඒ නිසා තමයි තමන් පෙර හිටපු ගෙදර ළමයෙකුට ආවේස වුණේ. එතකොට ඒ පෙර තමන්ගෙ දරුවො කියලත් දන්නවා. කෙනෙක් මැරෙන කොට බොහෝ අවස්ථාවල ගන්ධබ්බ තත්ත්වයට තමයි ඉස්සෙල්ලම පත් වෙන්නෙ. අන්න ඒ පරිවර්තනයත් එක්ක තමයි ඒ ගන්ධබ්බ අවස්ථාව ඒ ගෙදර ළමයෙකුට ආවේස වෙලා මේ වගේ කතාවක් කිව්වෙ. එතකොට ඒ පිඹුර මැරෙන වෙලාවෙ නැවතත් පෙර හිටපු වගේ මිනිස් ගන්ධබ්බ තත්ත්වයට තමයි පරිවර්තනය වෙලා තියෙන්නෙ. ඒ අවස්ථාවෙදි ක්ෂණිකවම චුති-පටිසන්ධි වෙලා ගන්ධබ්බ තත්ත්වයට පත් වෙන්න පුළුවන්. එහෙම වුනොත් මිනිස් ගන්ධබ්බ ස්වරූපය මොහොතකින්ම එනවා. හැබැයි මරණ වෙලාවෙදි උපනිශ්‍රය වෙලා උපාදාන වුනේ තිරිසන් ගතියක් නම්, මනුස්ස ගන්ධබ්බයෙක් විදියට එහෙම ඉන්න පුළුවන්කමක් නෑ. එතකොට ඒ තිරිසන් ගති ලක්ෂණයට අනුරූපීව අලුත් තිරිසන් භවයකට චුති-පටිසන්ධි වෙනවා. පටිසන්ධිය ලබන කොට ඒ ජාතියේ තිරිසන් ගන්ධබ්බයෙක් බවට පරිවර්තනය වෙලා ඒ ජාතියේ සතෙක් උපදිනවා. ඒ සතා මැරෙන කොට නැවතත් ආසන්නම මිනිස් අත්බැවක වඩපු හොඳ හෝ නරක සංඛාරයක් තමයි ඇදිල එන්නෙ. ක්ෂණයකින් ඊට අදාල ගති ලක්ෂණයක් ඇදිල ඇවිත් ඒක උපාදාන කර ගෙන ඒකෙන් චුති-පටිසන්ධි ලබල ඒ ජාතියේ ගන්ධබ්බයෙක් බවට පත් වෙනවා. භවයක් මාරු වෙන කොට ඒ වගේ චුති පටිසන්ධියක් වෙනවා.

මේකට තවත් හොඳ උදාහරණයක් අපේ පැරණි කතාවක සඳහන් වෙනවා. එක්තරා ස්ත්‍රියකට තමන්ගෙ ස්වාමි පුරුෂයගෙ මල්ලි හොර සැමියෙක් වුණා. ඇය තමන්ගෙ සැමියත් එක්ක පවුල් කනවට වඩා සැමියගෙ මල්ලිත් එක්ක පවුල් කෑම තමයි වඩාත්ම ප්‍රිය කළේ. ඉතින් තමන්ගෙ සැමියා ඒකට බාධාවක් නිසා, මේ මිනිහ ජීවත් වෙලා ඉන්න කල් අපට නිදහසේ ඉන්න නෑ, ඒ නිසා සැමියව මරමු කියල මේ ස්ත්‍රිය ඒ හොර සැමියට යෝජනා කළා. තමන්ගෙ අයිය නිසා ඒ හොර සැමියා ඒ කතාවෙන් කුපිත වුනත්, නැවත නැවතත් මේ ස්ත්‍රියගෙ ඇවිටිල්ල නිසා අන්තිමට ඒකට එකඟ වුණා. දෙන්නම එකට එකතු වෙලා මේකට උපක්‍රමයක් යෙදුවා. දවසක් තමන්ගෙ සැමියා මහන්සි වෙලා රෑ වෙලා ගෙදර ආපු වෙලාවක, හොඳට නාගෙන එන්න කියල, කවදාවත් නැති විදියට ආදරෙන් කතා බහ කරල, දිය සළුවක් සබන් කෑල්ලක් එහෙම දීල පිටත් කරල යැව්වා. ඉතින් මේ මනුස්සයත් ඒ කතාවට මුලා වෙලා, අද කවදාවත් නැති විදියට මට මගේ බිරිඳ ආදරෙයි මට හරි සන්තෝසයි කියල, තමන්ගෙ බිරිඳ ගැනම හිත හිතා නාන්න ගියා. අර උපක්‍රමයට අනුව ඒ අතර මග රැක ගෙන හිටපු තමන්ගෙම මල්ලි පොල්ලකින් ගහල මේ මනුස්සයව මැරුවා.

දැන් අර මනුස්සයෙක් වෙලා ඉඳෙද්දි බිරිඳට තිබ්බ්ච ආදරය, ලෙන්ගතුකම, දැඩි බැඳීම නිසා මළාට පස්සෙ බලු පැටියෙක් වෙලා ඉපදිලා මේ ස්ත්‍රිය පසුපසින්ම ඇඟ ලෙව කකා ආවා. ඇයි මගෙ පස්සෙන්ම එන්නෙ කියල හොයල බලද්දි, අර තමන්ගෙ පෙර හිටපු සැමිය කියල සැක කරල ඒ බල්ලවත් මැරුවා. ඊට පස්සෙ නැවතත් ගැරඬියෙක් වෙලා කකුලෙ පැටලි පැටලි ඒ ස්ත්‍රිය පසු පසම ආවා. කාලයක් යද්දි ඒත් තමන්ගෙ පෙර ස්වාමියා කියල සැක කරල මේ ස්ත්‍රිය ඒ ගැරඬියත් මැරුවා. ඊළඟට ඒ ස්ත්‍රියට දාව දරුවෙක් වෙලා උපන්නා. ඒ දරුවට ජාති ස්මරණ ඥානය පහළ වුණා. දැන් දරුවා උපන්නට පස්සෙ, අර පෙර අත්බැවේ මේ ස්ත්‍රිය තමන්ගෙම මල්ලිට කියල තමාව මැරෙව්වනෙ කියල ඒ කතාව මේ දරුවගෙ මතකයට ඇදිල ආවා. ඒ නිසා දැන් තමන්ගෙ අම්ම වුනත් ඒ ස්ත්‍රිය ළඟට එන කොටම මහ හයියෙන් බයේ විලාප තියන්න පටන් ගත්තා. හොයල බලන කොට මේ දරුවට මතක් වෙනවා, මේ ස්ත්‍රිය තමන්ගෙ පෙර අත්බැවේ කරපු ප්‍රෝඩාව. ඊට පස්සෙ ඒ දරුවා ලොකු මහත් වෙලා පැවිදි වෙලා අරිහත් ඵලයට පත් වුණා කියලත් කතාවක් තියෙනවා. මොකද අර සිද්ධිය නිසා ස්ත්‍රීන් පිළිකුල් කළා. මේ ස්ත්‍රීන් කියන්නෙ මෙහෙම ජාතියක්නෙ කියල විවාහයකට හෝ ස්ත්‍රීන් ඇසුරට කැමති වුනේ නෑ. ඒකෙන් තමයි කලකිරිල පැවිදි වෙලා ධර්මාවබෝධය ලැබුව කියන්නෙ.

දැන් එතකොට මෙතනදි ඉස්සෙල්ලම බල්ල මැරුවම ඊළඟට උපාදාන වුනේ බල්ල වෙලා ඉඳෙද්දි කරපු දෙයක් නෙවෙයි, පෙර මනුස්ස වෙලා ඉඳෙද්දි කරපු දෙයක්. නැවත සැරයක් ගැරඬියෙක් වෙලා ඒ ස්ත්‍රිය පිටිපස්සෙන් එන්න හේතු වුනේ, ඒ ස්ත්‍රියට ස්වාමි පුරුෂයා වෙලා හිටපු මිනිස් අත්බැවේ ඇයට ඇලුම් කරමින් වෙලිල හිටියත්, ඇයගෙ ආදරය අහිමි වෙලා ක්‍රියාත්මක කරපු ගැරහීමයි ඇඬියාවයි කියන ගති ලක්ෂණ. ඊළඟ අවස්ථාව විදියට ඒ චිත්තජ රූප ඇදිල ආවා. ඉස්සෙල්ලම මනුස්සයගෙ තිබ්බ්ච මොනව හරි බලු ගතියක් ආවා. ඊට පස්සෙ ස්ත්‍රිය වෙලාගෙන වැළඳගෙන ඉන්න බැරි වීම නිසා ගැරහීමයි, ඇඬියාවයි කියන ගති ලක්ෂණය ඇදිල ආවා. ඒ කියන්නෙ හොර සැමියා එක්ක එකතු වෙලා තමන්ට හිරිහැර කරදර කරපු නිසා ඊට විරුද්ධව ගරහපු හැටි, අඬපු හැටි මතකයට ආවා. ඒකෙන් තිරිසන් වුණා. තමන්ට මේ මොනවද වෙලා තියෙන්නෙ, ඇයි මෙහෙම ඉන්නෙ, සසර හේතු... කියන මේ එකක්වත් ඒ තිරිසන් අවස්ථාවෙදි තේරෙන්නෙ නෑ. මොකද තිරිසන් කියන්නෙ අහේතුක අවස්ථාවක්.

අන්තිමට ඒ ස්ත්‍රියට දැඩිව ආදරය කරපු, ගරහපු අඬපු කර්ම ශක්තිය ගෙවුනට පස්සෙ මනුස්සයෙක් වෙලා උපදින්න හේතු වන කර්මයක් ඇදිල ආවා. ඒ වෙලාවෙදි ඒ තිරිසන් මානසිකත්වය ඇරිල යනවා. මනුස්ස වුනාට පස්සෙ පෙර අත්බැව්වල වෙනස පේන්න පටන් ගත්තා. ජාති ස්මරණ ඥානය පහළ වෙලා තමයි ඒ පෙර සිද්ධි දකින්න ලැබුණේ. ඒක ධ්‍යාන ලබල ගන්න දෙයක් නෙවෙයි, කර්ම විපාකජ ඍද්ධියක්. එතකොට නුවණ වැඩුණා. ඒ නිසා තමයි අරිහත්වයට පත් වෙන්නත් පුළුවන් වුණේ. එතකොට මේ හැම අත්බැවකම උප්පත්තියට හේතු වුනේ මිනිස් වෙලා ඉඳෙද්දි වඩපු සංඛාරයක්මයි. සතා වුනත් පස්සෙන් එන්න හේතුව ඒකයි. හැබැයි මිනිස් ඇසුරින් හුඟක් ඈතට ගියා නම් නැවතත් මනුස්සයෙක් වෙන්න ලේසියෙන් බෑ. නමුත් ඉතින් මේ වගේ කාරණා අද වෙන කොට බොහෝ කොටම සැඟවිලා තියෙන්නෙ.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

සටහන
**නීතිඥ චන්දන සිරිවර්ධන**

# ඔබ තවම නොදුටු සතර පෙර නිමිති....

මහල්ලෙක්, ලෙඩෙක්, මළ මිනියක්, පැවිදි රුවක් ..... මේ කාරණා 4 පද වශයෙන් බොහෝ දෙනෙකුට කට පාඩම්. මොකද පොඩි කාලෙ ඉඳන්ම දහම් පාසල්වල, පාසල් පෙළ පොත්වල සිදුහත් කුමාරයා දුටු සතර පෙර නිමිති කියල මේ 4 උගන්වනවා. මේ කාරණා 4 දකල උන් වහන්සේ ගිහි ගෙයි කල කිරිල තපසට ගියයි කියලත් කියනවා. ඒ ඉගෙන ගත්තු ඒව එහෙම්ම කට පාඩම් කර ගෙන ආව මිසක්, ඇත්තටම ඒක එහෙම වෙන්නෙ කොහොමද කියල නිකමටවත් හිතල බලන්න කල්පනා වුනේ නෑ. දැන් මේ කාරණා 4, සතර පෙර නිමිති කියල මේ විදියට කිව්වම මතුවෙන ගැටළු කිහිපයක් තියෙනවා. විමර්ශනාත්මකව බැලුවම තමයි ඒ ගැටළු මතු වෙන්නෙ. මහල්ලෙක්, ලෙඩෙක්, මළ මිනියක්, පැවිදි රුවක් කියන මේ කාරණා 4 ම හෝ අඩු ගානෙ ලෙඩෙක්, මහල්ලෙක් කියන කාරණා 2 වත් උන් වහන්සේ ඊට පෙර දකල තිබුනෙ නැත්ද? ලෙඩ වෙච්ච අය, මහළු වෙච්ච අය ඒ කාලයේ ඒ නුවර හිටියෙ නැත්ද?

හොඳයි බෝසතාණන් වහන්සේ සක්විති රජ කරන බලාපොරොත්තුවෙන්, පිය රජතුමා මේ කාරණා 4 උන් වහන්සේට මුණ ගැසීම මුරකාවල් යොදල වැළැක්වුවයි කියල හිතුවොත්, එතකොට ඒ රටේ අනිත් මිනිස්සුවත් මේ කාරණා 4 දැක්කෙ නැත්ද? ඒ වගේම අද කාලයේ මේ කාරණා 4 ප්‍රසිද්ධ වෙලා තිබිලත්, අද ජීවත් වන බෞද්ධයෝ / අබෞද්ධයෝ මේ කාරණා 4 දකින්නෙ නැත්ද? එතකොට බෝසතාණන් වහන්සේ දැක්ක සතර පෙර නිමිති නෙවෙයිද අනෙක් අය මේ කාරණා හතරෙන් දකින්නෙ? අනෙක් අයත් ඒ කාරණා 4 ඒ විදියට දැක්ක නම්, බෝසතාණන් වහන්සේ හිතපු විදියට ඒ අයට හිතෙන්නෙ නැත්තෙ ඇයි? මේ වගේ ප්‍රශ්න ගණනාවක් මේ කාරණා 4 විමසා බලද්දි පැන නගිනවා. දහම සැඟවිලා පද මාලාව විතරක් කට පාඩම් කර ගෙන එන කොට මේ වගේ ගැටළු මතු වෙනවා. එහෙනම් ඒ සැඟවුනු දහම ඔස්සේ තමයි මේ කාරණා 4 ට විසඳුම් සොයන්න වෙන්නෙ.




දැන් මේ සතර පෙර නිමිති දැක්කෙ බුදුන් වහන්සේ නෙවෙයි, බුදු වෙන්න පෙර හිටපු සිදුහත් බෝසතාණන් වහන්සේ. එතකොට අද උගන්වන්නෙ උන් වහන්සේ මේ කාරණා 4 දැක්කා, අනෙක් අය දකල නෑ කියල. නමුත් අද ජීවත් වෙලා ඉන්න 1000 ක් දෙනා අරගෙන මේ 4 දකල තියෙනවද කියල ඇහුවොත්, කතා 2 ක් නෑ ඒ සියලු දෙනාම දකල තියෙනව කියල කියයි. මොකද මේ 4 අවස්ථාවම අදටත් සුලබයි. මහළු වෙච්ච අයත් ඕන තරම් සමාජයේ ඉන්නවා. ලෙඩ වෙච්ච අයත් ඕන තරම් ඉන්නවා. ඒ අතර තමන්ගෙ ඥාති හිතමිත්‍රාදීනුත් ඕන තරම් ඉඳල ඇති. මැරිච්ච අය සමහර වෙලාවට එක පොදියට සිය දහස් ගණන් බලාගන්න පුළුවන්. පැවිදි වෙච්ච උදවියත් විශේෂයෙන් බෞද්ධ රටවල සුලබ දසුනක්. එතකොට මේ 4 දුලබ කාරණා නෙවෙයි. හැබැයි මේ කියන කාරණා 4 දැක්කට, සතර පෙර නිමිති නම් ඒ 1000 දෙනාම දකල නෑ. නමුත් බෝසතාණන් වහන්සේ එදා දැක්කා. දැන් මේ කාරණය ඔය විදියට කිව්වොත්, අද ඉන්න අය හොඳටම පැටලෙනවා මොකක්ද ඒ බණ කියල.

**එතකොට අනිත් අය නොදැක්ක, බෝසතාණන් වහන්සේ විතරක් දැක්ක සතර පෙර නිමිති මොනවද ?** එක්කො දෙවියො මවපු ඒවාද ? මේ වගේ විවිධ ප්‍රශ්න දාන්න පුළුවන්. මොකද පොත්වල සඳහන් වෙන විදිහට, සිදුහත් බෝසතාණන් වහන්සේට මේ සතර පෙර නිමිති මුණ ගැසීම පිය රජතුමා විසින් වැළැක්වුවයි කියනවා. සමහර විට ඒ කාරණය ඇත්ත වෙන්න පුළුවන්. මොකද පුරෝහිත බමුණො කියල තිබුණෙ, මේ හතර දකල ඒකාන්තයෙන්ම උන් වහන්සේ ගිහි ගෙය හැර යනව කියල. ඒ නිසා ඒ විදිහට ඒ නිමිති මුණ ගැසීම වළක්වන්න ඇති. එතකොට ඒ එවපු නිමිති 4 දෙවියො මවපුව වෙන්නත් පුළුවන්. හැබැයි මවල වුනත් එව්වෙ දිව්‍ය ලෝකෙ සතර පෙර නිමිති නෙවෙයි, මේ මනුස්ස ලෝකයේම හැමෝටම මස් ලේ ඇහැට පේන්න තියෙන සුලබ නිමිති 4 ක්. බෝසතාණන් වහන්සේ උයන් කෙළියට යන අවස්ථා 4 කදි තමයි මේ අවස්ථා 4 එව්වයි කියන්නෙ. එතකොට පළවෙනි වතාවට මහල්ලෙක් දකල කලකිරිල නැවතත් හැරිල රජ මාළිගාවට ගියා. ඊළඟට දෙවෙනි වතාවට යන කොට ලෙඩෙක් දකල කළකිරිල හැරිල නැවතත් ගියා. ඔය විදිහට තුන් වන අවස්ථාවෙදි මළ මිනියක් දකල කලකිරිල ආපසු මාළිගාවට ගිහින්, හතර වෙනි අවස්ථාවෙදි පැවිදි රුවක් දකල තමයි ගිහි ගෙය හැර යන්න තීරණය කළායි කියන්නෙ.

හොඳයි දෙවියො මවල දුන්න එකක් වුනත්, අද ඉන්න කෙනෙක් දැක්කොත් ඒත් ඒ පුද්ගලය සතර පෙර නිමිති නම් දකල නෑ. දැක්ක නම් මොකද වෙන්නෙ? මෙහෙම ඉන්න බෑ. හැබැයි එහෙම දැක්ක නම් ඒක ප්‍රඥාවෙන් දකින්න ඕන. **ප්‍රඥාවෙන් දැකීම එකක්, අවිද්‍යාවෙන් දැකීම තව එකක්.** අවිද්‍යාවෙන් හට ගත්තු මේ නාම රූප ධර්ම පොදියෙන් මහල්ලෙක් දකින්න පුළුවන්. එහෙම දැක්ක කියල කෙනෙක් කියන්නත් පුළුවන්. ඒ කොහොමද? කොණ්ඩෙ ගිහින් තට්ටෙ

පැදිලා, කොණ්ඩෙ පැත්තක් ඉදිල, රැවුල පැහිල කටේ දත් නෑ, ඇස් පේන්නෙ නෑ, කන් ඇහෙන්නෙ නෑ, කොන්ද කුදු වෙලා අත පය රැළි වැටිල වෙව්ලනවා, ඇට කෝටු මතු වෙලා වෙව්ල වෙව්ල එහාට මෙහාට විසි වෙනවා, හැර මිටියක් අරගෙන යනවා, පාර පේන්නෙත් නෑ..... මේ ජාතියේ කෙනෙක් මම දැකල තියෙනව කියල කෙනෙක් කියන්න පුළුවන්. ඒ කාරණය මේ ලෝක සම්මත බෞද්ධයෝ විතරක් නෙවෙයි ඉස්ලාම්, කතෝලික, හින්දු, වෙනත් ඕනම ආගමක් අදහන අයත් දකිනවා.

හැබැයි බෝසතාණන් වහන්සේ ප්‍රඥාවෙන් දැකපු මහල්ලා ඔයිට වැඩිය වෙනස් කෙනෙක්. බාහිර පෙනුමෙන් වෙනස් කියන එක නෙවෙයි මේ කියන්නෙ, බාහිරින් දැකල ගත්ත අදහසයි වෙනස් වෙන්නෙ. ඒ නිසා උන් වහන්සේ දැකපු මහල්ලා ගැන රථාචාර්යවරයාගෙන් මෙහෙම ප්‍රශ්න කරනවා. අද අපි මෙච්චර තරුණ වෙලා හිටියට ඔය තත්ත්වය අනාගතයේ අපිටත් එන්නෙ නැත්ද? අපි ඕකෙන් මිදිලද ඉන්නෙ? නෑ ස්වාමීනි අපිත් අනාගතයෙ ඔය තත්ත්වයට පත් වෙනවා. එහෙනම් අපි අද සන්තෝසයෙන් ඉන්නෙ අපි තරුණයි කියල? මොකක්ද අපිට සන්තෝස වෙන්න ලැබිල තියෙන්නෙ? ඒකාන්ත-යෙන් අපිත් ඔය තත්ත්වයට පත් වෙලා අපේ කයත් ඒ විදියෙ වෙනව නම්, අපිට අද මොකක්ද කියන්න තියෙන්නෙ අද අපි තරුණයි කියල? මේ තරුණකමෙන් වැඩක් තියෙනවද?



අන්න දැන් අර සැපයක් කියල හිතාගෙන හිටපු එක වැඩක් නැති දෙයක් කියල දැක්කා. ඒ දැක්කෙ මොකෙන්ද? අනාගතයේ මෙබඳු දේට පත් වෙන්නා වූ කයක් තියාගෙන, දැන් මම මෙහෙමයි කියල කිව්වට ඒක මොන තරම් මෝඩ කමක්ද කියල දැක්කා. ඒ තමයි ප්‍රඥාවෙන් දැකීම. අන්න ඒ දැකීමට මහල්ලා දැක්ක කියල කියනවා. නමුත් අද ඉන්න 1000 දෙනෙක් අරගෙන ඒ 1000 දෙනාම මහල්ලෙක් දකින කොට ඔය අදහස ආවද කියල ඇහුවොත්, ඇවිත් නෑ. ඒ අය මහල්ලෙක් දකින්නෙ කොහොමද? අර බලපන්කො යන හැටි කියල පෙළක් අය කොක් හඬ ගාල හිනා වෙන්න පුළුවන්. ''අරෑට පාරෙ යන්නත් බෑ මරගාතෙ, ගෙවල්වලට වෙලා ඉන්නෙ නැතිව වෙන මිනිහෙකුට පාරෙ යන්නත් නෑ, වාහනයකට යන්නත් නෑ, අනිත් සැරේ හැප්පිලා මළොත් මිනිස්සුත් අමාරුවේ...'' පෙළක් අය මේ විදියට හිනා වෙවී බැන බැන යනව මිසක් මහල්ල දැකල නෑ. දැක්ක නම් අර විදියට දකින්න ඕන. එහෙම නැත්නම් ඒ වගේ මහල්ලෙක් දැකල, අනේ අපොයි පවු කියන අයත් ඉන්නවා. හැබැයි එහෙම කිව්වත් අර විදිහට ප්‍රඥාවෙන් මහල්ල දකින්නෙ නෑ. නියම විදිහට දකින්න නම්, තමාත් සමග සංසන්දනය කරල බලන්න ඕන. ''මේ මහල්ලත් පෙර කාලෙක මම වගේ හොඳ තරුණයෙක්. දැන් මහළු වෙලා. මමත් මතු කාලෙක මේ තත්ත්වයට පත් වෙනවා. මමත් ඒ තත්ත්වය ඉක්මවල නෑ.'' එහෙම තමයි දකින්න ඕන. ලෙඩෙක්, මළ මිනියක් දැක්කත් ඒ වගේ හිතන්න ඕන.

ඊළඟට ලෙඩෙක් දැකල බෝසතාණන් වහන්සේ රථාචාර්ය-වරයාගෙන් ඒ ගැන අහනවා. අර කවුද? ලෙඩෙක්. ඉතින් අපිත් ඔහොම ලෙඩ වෙනවද? ඇයි නැත්තෙ? අපිටත් ලෙඩ හැදෙනවා. කොයි මොහොතෙ ලෙඩක් හැදෙයිද දන්නෙ නෑ. එතකොට කොයි මොහොතක හෝ ලෙඩ වෙන කයක් අරගෙන අපි නිරෝගි කියල මොකෙන්ද මේ ඉන්නෙ? මොන නිරෝගි කමක්ද අපිට තියෙනව කියල අපිත් උදම් අනන්නෙ? මේ තාවකාලික නිරෝගි කමක්නෙ! දැන් තව මොහොතකින් ලෙඩ වෙන්නත් පුළුවන්. ඉතින් මෙහෙම ලෙඩ වෙන කයක් තියාගෙන අපි මොකක් ලැබුව කියන්නද? මොකක්ද අපිට ලැබිල තියෙන වැදගත් දේ ? මේ තමයි ප්‍රඥාවෙන් දැකීම. ලෙඩා නියම විදියට දැක්ක කියන්නෙ ඒකයි. තමනුත් ලෙඩ වෙන බව ප්‍රඥාවෙන් දකින්න ඕන.

එතකොට සාමාන්‍ය පෘතජ්ජන-යෙක් ලෙඩෙක් දකින්නෙ අවිද්‍යාවෙන්. එක්කො, අපිටත් ඔය ලෙඩේ බෝ වෙයි, ඉන්න හොඳ නෑ කියල එතනින් පැනල යන්න පුළුවන්, පිළිකුල් කරන්න පුළුවන්. එහෙම නැත්නම් ආ..... ලෙඩ්ඩු, ඕක සාමාන්‍ය දෙයක්නෙ කියල නිකං ගානකට නැතිව කියන්න පුළුවන්. තමන්ගෙත් කවුරු හරි ලෙඩ වෙලා රෝහල් ගත කරල සනීප වෙලා ගෙදර ගෙනාවත්, දැන් ඒ පුද්ගලයට මේ විදිහෙ ලෙඩ්ඩු මෙච්චර ගණනක් හිටියනෙ කියල මතක් වෙන්නෙ නෑ. නමුත් එහෙම ලෙඩ්ඩු මස් ලේ ඇහැට දැක්කා. ඒක නිකම්ම දැකීමක් විතරයි. නමුත් යමෙක් ඒ දිහා බලාගෙන ඉඳල මෙහෙම හිතන්න පුළුවන්. ''දැන් වයසට ගිහින් ලෙඩ වෙලා තියෙන්නෙ මේ මගේ ශරීරය වගේ ශරීරයක් තිබුණ කෙනෙක්නෙ! මගේ ශරීරයත් ඒ තත්ත්වය ඉක්මවා ගිහින් නෑනෙ. කවද හරි මමත් මෙහෙම ලෙඩ වෙන්න පුළුවන්. මේ ශරීරයට විතරක් නෙවෙයි, මගේ ශරීරයටත් ඒ වගේ ලෙඩ ඇඳේ ඉඳගෙන දුක් විඳින්න වෙන්න පුළුවන්. එහෙම දෙයක් මට වෙන්න බැරිද? පුළුවන්නෙ. ඉතින් ලෙඩ වෙන ශරීරයක් අරගෙන මමත් මේ ලෝකෙ මොන සුන්දරත්වයක්ද, ආස්වාදයක්ද හොයන්-නෙ?'' මේ විදිහට හිතුව නම්, පෘතජ්ජනයෝ අවිද්‍යාවෙන්, හිතනවට වැඩිය වෙනසක් නැත්ද ? අර වගේ නිකම්ම ලෙඩෙක් දකින්නෙ නැතිව මේ විදිහට සිහි කළා නම්, ඒවං උපසංහරති කියන, එසේ උපමා සංසන්දන-යෙන් දහම් දකින්න පුරුදු වෙනවා. බෝසතාණන් වහන්සේත් ඒක තමයි කළේ. උන් වහන්සේ ඒක උපරිමයෙන් කළා.

ඊළඟට මළ කුණක් දැකල ඒ ගැන අහනවා. අර මොකක්ද? මළ කුණක්. එහෙනම් අපිත් මැරෙනවා. එදාට අපිත් මළ කුණක් වගේ. ඉතින් ඒ මළ කුණ වගේ තත්ත්වයට අපිත් පත් වෙනව නම්, අද අපි ජීවත් වෙනව කියන්නෙ මොකක්ද? අපිටත් ඒ මරණය ඒකාන්තයෙන්ම උරුම නම්, අපි මේ ජීවත් වෙන එකේ තේරුම මොකක්ද? අපි අද හොඳින් ජීවත් වෙනව කියල සන්තෝස වෙන්න එකක් තියේද? අපි අද මෙතන ඉඳගෙන මොකක්ද මේ හොයන්නෙ? ජීවත් වෙනව කිය කියා මේ කරන්නෙ හිස් වෙහෙසක්නෙ! මරණයට ඒකාන්තයෙන් යන ගමන් ජීවත් වෙන්න හදනවා. මරණය ඒකාන්තයෙන්ම උරුම අපි ජීවත් වෙන්න වැඩ කරනවා. අන්තිමට අපි සියල්ලම හිස් අතින් යනව නේද? එහෙම ජීවිතයක් තුළ අපි මොනවද අල්ල ගන්නෙ? මේ විදිහට මළ කුණක් දැක්කා. හැබැයි ඒ දැක්කෙ ප්‍රඥාවෙන්.

සාමාන්‍ය කෙනෙක් නම් මළ මිනියක් දකින්නෙ කොහොමද? මළ ගෙදරක ගියා නම්, නිකම්ම මිනිය දිහා බැලුවා, ඔළුව පහත් කරල ගෙදර ආවා. කාලයක් ගියාට පස්සෙ ඒ ගැන කතා

කිරීමක්, සිහි කිරීමක්, මතකයක් නෑ. කතා කළත් කතා කරන්නෙ, ඒ පුද්ගලය ජීවත් වෙලා ඉඳෙද්දි කරපු කියපුවා, මළාට පස්සෙ වෙච්ච පාඩුව .... ඔය වගේ දේවල්. මළ මිනියක් කුණු වෙලා තියෙනව පාර තොටේදි දැක්කොත්, පිළිකුල් කරල අහක බලනවා. නමුත් අර විදිහට ප්‍රඥාවෙන් හිතුව නම්, ''මේ මං වගේ ඒ කාලෙ හොඳට හිටපු කෙනෙක්නෙ මැරිල ඉන්නෙ'' මැරිච්ච කෙනා තරුණයෙක් නම් ''මේ මං වගේ කෙනෙක්නෙ මැරිල ඉන්නෙ'' ඔය විදිහට අවස්ථානුකූලව සංසන්දනය කරල බලනවා. ''මටත් මෙහෙම වෙන්න පුළුවන්. මමත් මේ තත්ත්වය ඉක්මවල නෑනෙ මේ ශරීරයත් පෙර මම වගේ හොඳට තිබුණු ශරීරයක්. ඒත් අද මළ මිනියක්. අද මේ හොඳට තියෙන ශරීරය, ඉදිරියේදි මේ වගේ වෙන්න බැරිද ? පුළුවන්නෙ. ඉතින් මරණය ඉක්මවා නෑනෙ ! කොයි මොහොතෙ මැරෙන්න වෙයිද දන්නෙ නෑ. ඉතින් ඒ වගේ ශරීරයක් අර ගෙන මම මේ සුන්දර දෙයක් කියල සිහි කළොත් ඒ වගේ අවස්ථාවක් මට එන්නෙ නැත්ද ?'' ඔය විදිහට දැකපු මොහොතෙ සිහි කරන්න ඕන.

ඊළඟට පැවිද්දෙක් දැක්කද කියල සාමාන්‍ය කෙනෙක්ගෙන් ඇහුවොත්, අපි ඔය ඕන තරම් දැකල තියෙනවා, ඔය සිවුරු දාගෙන යන්නෙ කියල කියන්න පුළුවන්. අන්‍ය ආගමිකයෙක් නම් එහෙම කියාවි. ලෝක සම්මත බෞද්ධයෙක් නම්, අනේ අපේ හාමුදුරුවරු කියල එහෙමත් කියාවි. මේ මොන විදිහට කිව්වත් ඒ අය පැවිද්දෙක් දැකල නෑ. එහෙනම් කොහොමද දකින්නෙ ? ඒ මොකද ඒ කොණ්ඩෙ භුගාගෙන ඉන්නෙ? ඇයි ඒ බොහොම ශාන්ත විදිහට යන්නෙ? ඒ අය ඒ විදිහෙ ධර්මයක් කියල දෙයක් ඇසුරු කරගෙන මොකක්ද ඒ කරන්නෙ? මෙන්න මේ මහල්ලා, ලෙඩා, මළ කුණ කියන තත්ත්වයට පත් වෙන ලෝකයේ ස්වභාවය දැකල, මේ කයට එහෙම වෙනව කියල දැකල, එහෙම කයක අසාරත්වය දැකල, එහෙම කයක් යලි යලි ගොඩනැගෙන හේතුව හොයල, ඒකෙන් නිදහස් වෙන්න යම් කිසි ක්‍රමයක් තියෙනවද, ඒක අනුගමනය කරල මිදෙන අය තමයි මේ පැවිදි කියන්නෙ. දැන් ඉතින් මම මොකද කරන්නෙ? මාත් ඒක නේ කළ යුත්තෙ ! එහෙනම් මමත් එතනටයි යන්න ඕන. හැබැයි ඒක හොඳ නිසා යනව නෙවෙයි. එතනින් ගිහින් මේ දුක් ගොඩින් මිදෙන්නයි යන්නෙ.

මෙන්න මේ අදහස ආවනම්, ඒ පුද්ගලයා පැවිද්දෙක් දැක්ක වෙනවා. මේ කිව්වෙ ප්‍රඥාවෙන් දැකීම. සිදුහත් බෝසතාණන් වහන්සේ දැක්කෙත් ඒ විදිහට. එතකොට අර කලින් කිව්වෙ ලෝක සම්මතයේ දැකීම. පද නිරුක්තිය ගත්තොත්, පහ වූ විදි නිසා තමයි පැවිදි කියන්නෙ. ගිහි විදි තමයි පහ වෙන්නෙ. එහෙම නැත්නම් පැහැපත් විදි කිව්වත් ගැලපෙනවා.

දැන් සාමාන්‍ය උදවිය ගත්තොත් පැවිදි අය කොච්චර නම් දැකල ඇත්ද? ඒත් මතකයේ තියෙනවද? පාරෙ වඩින හාමුදුරුවරු දැකල තියෙනවා. භාවනානුයෝගීව ඉන්න හාමුදුරුවරු දැකල තියෙනවා. සංචාරව වඩින හාමුදුරුවරු දැකල තියෙනවා. බණ කියන හාමුදුරුවරු දැකල තියෙනවා. ඒත් ඉතින් බැලුව ගියා එච්චරයි. ඊට පස්සෙ ඒ ගැන මතකයක්, සිහි කිරීමක් නෑ. කවුරු හරි මතක් කළොත්, මෙහෙම හාමුදුරුවො නමක් දැක්කද කියල, ආ ... ඔව් එහෙම කෙනෙක් නම් දැක්ක කියල උත්තර දෙයි එච්චරයි. මොකද දැක්කෙ අවිද්‍යාවෙන්. එහෙම නැත්නම් අබෞද්ධයෙක් මේ විදිහට දකින්නත් පුළුවන්. ''අයියෝ .... මේ කාල බීල හොඳට විනෝදයෙන් ඉන්න තියෙන කාලෙ සිවුරක් දාගෙන නිකං ඕන කමින් දුක් විඳිනවා.'' සමහර ලෝක සම්මත බෞද්ධයොත් ඔහොම කියනවා. මොකද ඒ අය පෙර නිමිති දැකල නෑ.

එහෙනම් කොහොමද ප්‍රඥාවෙන් දකින්නෙ ? දැන් මහල්ලා, ලෙඩා, මළ කුණ දැක්ක කෙනා මේ විදිහට හිතන්න ඕන, ඒ සඳහා මේ මුල් නිමිති 3 දැකල තියෙන්න ඕන. එහෙම දැක්කෙ නැත්නම් අර විදිහට සිහි කරන්න බෑ. ''ඇයි මේ උන් වහන්සේ පැවිදි වෙලා ඉන්නෙ ? මහළු වෙනවා, ලෙඩ වෙනවා, මැරෙනවා. එහෙම ස්වභාවයෙන් අසාර ලෝකය දැක්කට පස්සෙ තවත් මේ සුන්දර කියන ලෝකෙ ඇලි ඇලී ඉඳල මොකටද ? ඒක දැකල නේද මේ පැවිදි වෙලා තියෙන්නෙ ? ඒ පැවිදි කෙනත් පෙර මං වගේ ගිහිව හිටපු කෙනෙක් නේද ? දැන් අද බලන කොට පැවිදි කෙනෙක්නෙ ! ඉතින් මේ පැවිදි ජීවිතය නේද මේකෙන් මිදෙන්න තියෙන හොඳම ක්‍රමය. මමත් ඒ වගේ වුනානම් කොච්චර හොඳද ?'' ඔය විදිහෙ අදහසක් ආව නම්, සාමාන්‍ය කෙනෙක් දකිනවට වඩා පැහැදිලි වෙනසක් තියෙනවා. එහෙම දැකපු කෙනෙක් සතර පෙර නිමිති යථාර්ථයෙන් දැක්ක වෙනවා. අනෙක් අයත් මේ හතර දැක්කට, එකක්වත් අවබෝධයට ඇවිත් නෑ. ඒ නිසා තමයි 1000 දෙනෙක් අර ගෙන බැලුවත් ඔය අදහස ඇවිත් නෑ කිව්වෙ.

පෙර දකින නිමිත්ත තමයි පෙර නිමිත්ත කියන්නෙ. ඒ කියන්නෙ දහම අනුගමනය කරන්න පෙර මේ හතර දැකල තියෙන්න ඕන. ඒ හතර දැක්කෙ නැති කෙනෙකුට දහම් අවබෝධයට මුල පුරන්නෙ නෑ. බෝසතාණන් වහන්සේ විතරක් නෙවෙයි, නිවන් දකින්න යන හැම කෙනෙක්ම මේ හතර දැකල තියෙන්න ඕන. ඒක දැක්කෙ නැත්නම් නිවන් මග පාද ගන්න හිත හැදෙන්නෙ නෑ. හැබැයි නිකං දැක්කට බෑ. කැලේ ගිහින් බණක් භාවනාවක් කරන්නත් ඒ ටික දැකල තියෙන්න ඕන. මුලින්ම ඇස් දෙකෙන් දැකල, අර විදිහට හිතල පුරුදු වෙන්න ඕන. වැඩිකල් හිතන්න දෙයක් නෑ. සැරයක් දැක්කත් ඇති. ඒ ගැන ප්‍රඥාවෙන් අර විදිහට සිහි කරන්න පුළුවන්. එතකොට ඒ අදහස කවදාවත් මතකයෙන් ඈත් වෙන්නෙ නෑ. කවද හරි ඇදිල එනවා. එතකොට තමයි පැවිද්දෙක් වෙන්න යන පැත්තට හිතක් පහළ වෙන්නෙ. ලොව්තුරා බුදු වෙන්නත් ඔය හතර දැක්ක නම් අනිත් අයත් ඕක දකින්න ඕන.

පොත්පත්වල සඳහන් නොවුනත් ලොව්තුරා බුදු වෙන්න ඉන්න බෝසතාණන් වහන්සේ නමක්, සෝතාපන්න කෙනෙකුට ලැබෙන මූලික දහම් අවබෝධය, ගිහි ගෙය හැර යන්න පෙර අවසන් මොහොතෙ හරි ලබනවා. බෝ මැඩදි තමයි ඉතිරි කාරණා 3 පූර්ණ කරන්න. බෝ මැඩදි කෙළෙස් නසන්නෙ වතාවල් 3 කට මිසක් 4 කට නෙවෙයි. ඒ නිසා පළවෙනි අවස්ථාව ගිහි කාලෙදිම සිද්ධ වෙලා තියෙන්න ඕන. එහෙම නැත්නම් සතර පෙර නිමිතිවලින් 4 වන කාරණය දැක්කට පස්සෙ ගිහි ගෙය හැර යන්න හේතුවක් නෑ. එහෙම යන්න නම්, ප්‍රඥාවෙන් දැකල අවබෝධ කරගත්ත දෙයක් තියෙන්න ඕන. හැබැයි බෝසතාණන් වහන්සේට ඒ විදිහට මූලික දහම් අවබෝධය තිබුණත්, තවදුරටත් පරීක්ෂණ කර ගෙන යනවා. සත්‍යය දැක්ක කෙනෙකුට පරීක්ෂණ කර කර ඉන්න දෙයක් නැති වුනත් ඒ විදිහට දහම් ඇස පහළ වුනාට පසුවත් පරීක්ෂණ කිරීම බෝසත් සිරිතක්, ධර්මතාවයක්. මොකද නැත්නම් අන්‍ය පරිබ්‍රාජකයො කියනවා, උන් වහන්සේ ඔය අපි වගේ හොයල බලල අත්දැකීම් ලබල නෙවෙයි ඔය ධර්මය දේශනා කරන්නෙ කියල. ඒ නිසා තමයි සිදුහත් බෝසතාණන් වහන්සේ අවසන් කාලයේ, ඒ කාලෙ තිබ්ච්ච සියලු ශාස්ත්‍ර වේදයන්, අනික් සියලු දෙනාටම වඩා හොඳින් හදාරල තිබුණෙ. අනික් අයට අර වගේ කතාවක් කියන්න බැරි වෙන්න තමයි එහෙම කළේ.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# වාස්තු විද්‍යාවේ හේතු ඵල සම්බන්ධය දහම් ඇසින් ....

**3 වන කොටස**

වාස්තු විද්‍යාව ගැන කතා කරද්දි, මනුස්සයෙක් වාසය කරන ගෘහයත් සමග කිරණ ලෝකයේ සම්බන්ධයක් තියෙන බවත්, ඒ කිරණ ලෝකයෙන් එන හොඳ නරක කිරණ දෙවර්ගයම ගෘහය හරහා මනුස්සයින්ගෙ කිරණ කයට බලපාන බවත් පසුගිය කලාපයෙන් යම් පමණකට පැහැදිලි කළා. ඒ වගේම මේ කිරණ ලෝකය මනුස්සයින් වාසය කරන තැන්වලට විතරක් නෙවෙයි, අවට පරිසරයේ ගස් කොළං ඇතුළු මුළු වටා පිටාවටමත් බලපානවා. දැන් මේ ඒ ගැන තමයි පැහැදිලි කරන්නෙ.

මේ මුළු විශ්වයම කිරණ පද්ධතියක්. අපේ මේ ශාක පද්ධතිය හැදිල තියෙන්නෙත් ඒ කිරණ පද්ධතියත් එක්ක මිසක් ඒකෙන් අහක් වෙලා නෙවෙයි. මේ ගස් කොළං හැදෙන කොට දැකගන්න තියෙන දෙයක් තමයි, හැම තැනම සියලු ගස් කොළං හැදෙන්නෙ නෑ. ඒ නිසා තමයි හොඳ සරුවට ස්වභාවිකව හැදෙන ගස් කොළං සහ කෘතීමව හදන ගස් කොළං කියල වර්ග 2 ක් තියෙන්නෙ. මේ කාරණය සමාධි ලබපු අයට හොඳට පේන්න තියෙන දෙයක්. ඒ විදිහට සමාධියෙන් බැලුවොත් කොස් චක්‍රය, දෙල් චක්‍රය වගේ වෙනම ගස් චක්‍ර තියෙනවා. සමහර චක්‍ර කොම්බු හැඩයක් ගන්නවා. සමහර චක්‍ර දැති හැඩයක් ගන්නවා. තවත් සමහර ඒවා රවුම්. මේ වගේ විවිධාකාර හැඩ. අන්න ඒ අදාල චක්‍රයට අහු වුනාම ඒ ගස් සරුවට හැදෙනවා. කොස් ගස් හැම තැනම හැදුනට, ඒ කොස් චක්‍රයට අහු වුනොත් තමයි සරුවට හැදෙන්නෙ. ඒ ක්‍රමයට වගා කළොත් තමයි සාර්ථක වෙන්නෙ. ඒ කාරණය බිම ඉඳල බාහිරින් පේන්නෙ නෑ, සමාධියට දර්ශනය වෙන දෙයක්.

උදාහරණයක් විදියට පොල් චක්‍රය කියල එකක් තියෙනවා. ගොඩ බිම ඉඳන් යන කොට අන්තිම කෙළවර මුහුදු තීරයෙදි තමයි පොල් චක්‍රය ලොකු වෙන්නෙ. ඒ නිසා මුහුදු බඩ තීරයේ සරුවට පොල් හැදෙනවා. නමුත් මුහුද නිසා, ලවණ ගතිය නිසා පොල් හොඳට හැදෙනව කියල තමයි අද කියන්නෙ. හැබැයි ඒ දෙක අතර තියෙන හේතු ඵල සම්බන්ධය දන්නෙ නෑ.

එතනදි ඇත්තටම බලපාන්නෙ අර චක්‍රය. භෞතික ලෝකය හැදිල තියෙන්නෙත් ඒ චක්‍රයට අනුව රසායනයන්ගෙන්. නමුත් ඒ හේතුව දන්නෙ නෑ. භෞතික ලෝකය දිහා බලල, යමක් තියෙන නිසයි මේ දේ හැදෙන්නෙ ... ආදී වශයෙන් කියනවා. ඇයි ඒක එහෙම වෙන්නෙ කියන ප්‍රශ්නයට උත්තර නෑ. ඊට අදාල ගුණය පේන්නෙ නෑ. අහේතුක වාදයේ පිහිටපු අය ඒ කාරණය පිළිගන්නෙත් නෑ. නමුත් යමක් හේතු ඇතිවමයි සිද්ධ වෙන්නෙ. එහෙනම් ඒ හේතුවට වෙන ඵලයක් එන්න විදියක් නෑ. ඒ හේතුවට අනුකූල ඵලය ආ යුතුයි.

ලවණ කියන වචනයෙන් කියන්නෙ ළය වණ වෙනව කියන අර්ථය. ළය කියන්නෙ හදවතට, හිතට. ළය වණ වෙනව කියන්නෙ, යම් කිසි කෙනෙක්ගෙ හිතට වණ වෙන ගති ලක්ෂණයක් පැමිණීම. ළයේ තිබ්බච්ච ලයාන්විත ගතිය ඉවත් වෙලා ළය වණ වෙනවා. එතකොට එක්තරා මට්ටමකට සුන්දරව තිබ්බච්ච ලයාන්විත ගතිය තමයි ඉවත් වෙන්නෙ. ඊළඟට එන ළය වණ වෙන මට්ටමට අදාල ශක්තිය තමයි ලවණ කියන්නෙ. ඒ කියන්නෙ අන්තිමට ඊළඟ මට්ටමත් ඉක්මවා යනවා. එතනින් නවතින්නෙ නෑ. මුලින්ම ළය වණ වෙන මට්ටම තියෙන සිතිවිලි ඇවිත් ඒවායින් කතාවට ක්‍රියාවට බැස්සට පස්සෙ, ඒකත් ඉක්මවල තවත් පැත්තකට බහිනවා. එතකොට ඇති වන විස ශක්තියත් පිට වෙලා ගියාම අත පය කුණුවීම්, තුවාල ආදිය එනවා. ඒ විදියට දෙවනුව සාපේක්ෂව ළය වණ වෙන ගතියෙන් පිට වෙන ශක්තියෙන් තමයි ලවණ හට ගන්නෙ.



ළය වණ වෙන්නෙ ලෝභ, ද්වේශ, මෝහ නිසා. ළය වණ වෙන කොට ගැටීමක් තමයි ඇති වෙන්නෙ. නමුත් මුලින්ම තිබුනෙ රාගය නිසා ඇලීමක්. ඒ කියන්නෙ පංච කාමයට ලොල් වීමෙන් සිද්ධ වෙන ඇලීම. ඒ මට්ටමත් ඉක්මවා ගියාම ඒකට අදාල ශක්තිය තමයි පිට වෙලා ගිහින් පහ ලොල් - පොල් විදියට හැදුනෙ. පෙර හිටපු මූලික මිනිස්සුන්ට ලෝභ, ද්වේශ, මෝහ තිබුනෙ නෑ. ඒ නිසා ළය වණ වෙලා තිබුණෙත් නෑ. පසු කාලීනව ආපු ලෝභ, ද්වේශ, මෝහ නිසා ළය වණ වෙන්න ගත්තා. ඇලීම නිසා ගැටීම හට ගත්තා. **ඇලීමේ සහ ගැටීමේ ශක්ති කියන්නෙ ළඟ ළඟ තියෙන ශක්ති 2 ක්. ඒ 2 එකට ඇඳිලා තියෙන්නෙ. ළය වණ වුනාම ඒ ශක්තිය පිට වෙලා ගිහින් ලවණ හැදිල, පංච කාමයට ලොල් වීමේ ලක්ෂණයත් ඉක්මවා ගිහින් ඒකට හිමි ශක්තියෙන් පොල් හට ගත්තා. එතකොට මේ ඇලීමේ ගැටීමේ ශක්තිය ළඟ ළඟ තියෙන ගති ලක්ෂණ දෙකක් නිසා පොල් සහ ලවණ දෙකත් එකට සම්බන්ධයි.** මොකද ගැටීමෙන් තොර ඇලීමක් හදන්න බෑ. ඇලීමක් යම් තැනක හැදුවොත් ඒක රැක ගන්න ගැටීමක් ඒකාන්තයෙන්ම එනවා. සරුසාර පොල් වගාවට ලවණ අවශ්‍යයි කියන්නෙත් මේ හේතුව නිසා. නමුත් අද ඒ කාරණය දන්නෙ නෑ.

ඒ නිසා පොල් චක්‍රයත් ලවණ මට්ටමත් එක්ක තමයි අඩු වැඩි වෙන්නෙ. ළය වණ වෙන හෙවත් ලවණ ශක්තිය නරක දෙයක් වුනාට ඒකත් සාපේක්ෂයි. ළය වණ වෙන්න පෙර මිනිස්සුන්ගෙ ලයාන්විතව තිබ්බච්ච මූලික ශක්තිය නිසා ගස් කොළං තිබුනෙ නෑ. මොකද ඒ ශක්ති විශේෂයන් මනුස්ස ශරීරයේ තිබුණා. නමුත් පසු කාලීනව ඒවා ශරීරයෙන් පිරිහුණා. පිරි ඌන වුනා කියන එක තමයි පිරිහුණා කියන්නෙ. ඒ කියන්නෙ පිරිල තිබ්බච්ච ශක්තිය ඌන වුණා. තවත් විදියකට කියනව නම්, යම් කිසි ආකාරයකට තිබ්බච්ච කටුක තැනින් තවත් පහලට බැස්සම ඒ විදියට සාපේක්ෂව තිබ්බච්ච කටුක ශක්තියක් පිට වෙලා ගියා.

මේකට හොඳ උදාහරණයක් තමයි සුනාපරන්ත දේශයට වැඩම කළ පුණ්ණ හාමුදුරුවන්ගෙ කතාව. ඒ ප්‍රදේශයේ ඉන්න මිනිස්සු බොහොම දරුණු නිසා උන් වහන්සේට ඒ පැත්තෙ වඩින්න එපැයි කිව්වම, ඒ මිනිස්සු බනින්න තරම් දරුණු වුනත් ගහන්න තරම් දරුණු නෑ කියලයි උන් වහන්සේ කිව්වෙ. ඒ කියන්නෙ ඒකත් හොඳ ගුණයක්. ඊළඟට ගැහුවොත් මොකද කරන්නෙ කියල ඇහුවම, ඒත් ඒ මිනිස්සු අත පය කඩල දාන්න තරම් දරුණු නෑ කිව්වා. ඒකත් ඊළඟට සාපේක්ෂව හොඳ ගුණයක්. අතපය කඩල දැම්මොත් මොකද කරන්නෙ කියල ඇහුවම, ඒත් මරන්න තරම් දරුණු නෑ කිව්වා. ඒ නිසා නරක ලක්ෂණයක් වුනත් සම්පූර්ණයෙන්ම නරක නෑ. සාපේක්ෂව හොඳයි. ඒ විදියෙ විවිධ මට්ටම් තියෙනවා. සමහර අය සැරයි, බනිනවා. ඒක හොඳ ගුණයක් නෙවෙයි. නමුත් ගහන්න තරම් නරක නෑ කියන්නෙ හොඳ ගුණයක්. ඒ නිසා ඒ මට්ටමට තියෙද්දි හොඳ ගුණය තවමත් ඉවර නෑ. නමුත් ගහන්න පහර දෙන්න පටන් ගත්තම, බනින මට්ටමත් ඉක්මවා ගිහින් ඒ ශක්තිය පිට වෙනවා. මරනවා කිව්වම ඊටත් වඩා බරපතලයි. එතකොට ගහන මට්ටමට තිබිච්ච ශක්තියත් පිට වෙලා යනවා. ඒ නිසා ඒ ඒ තත්ත්වයන්ට අවශ්‍ය ඖෂධ ශක්තිය ඒ ජාතියේ කටු ගස්වල වුනත් තැන්පත් වෙලා තියෙනවා. ඒ නිසා සියලු කටු ගස් නරක නෑ.

එතකොට සාමය උදුරා දැම්මම සමුද්‍ර වෙනවා. අඳ බව මුසු කළාම මුහුද වෙනවා. අඹ කියන්නෙ හිතවත්කම. ඒ හිතවත්කම දිය කරල දැම්මම දිය + අඹ - දියඹ වෙනවා. මේ එකම අර්ථ තියෙන වචන පටිච්ච සමුප්පන්නව හැදෙන හැටි. මේ හැම එකේම තියෙන්නෙ ලවණ ගතිය. සත්වයාගෙ චිත්ත හේතුවේ ඵලයට අනුකූලව තමයි ඒවා හැදෙන්නෙ. ඒ අනුවම තමයි මේ ගස් වැල් හැදෙන්නෙත්. අපේ ළඟ තිබිච්ච රසය පිට වෙලා ගිහින් ඒ ගතියට යම් කිසි නැගී හිටපු ශක්තියක් තිබුණද, ඒකෙන් ඒක පෝෂණය වෙනවා. ඒ අනුව තමයි එතන ඒ ජාතියෙ ගහක් හැදෙන්නෙ. නැගී හිටපු ශක්තිය ගස් වෙලා, වැළඳ ගත්තු ශක්තිය වැල් වෙනවා. සියලු ගස් වැල් ඔය විදියට තමයි හට ගන්නෙ. අපිට ඕන ගස් වැල් ජාති අපි ප්‍රයෝගයකින් කෘතීමව හදන්න හැදුවට නැවතත් පරණ තත්ත්වයටම යනවා.

උදාහරණ විදියට වී ජාති එකතු කරල එච් 4 බීජී 12 කියල අපි හදාගත්තු මොනව හරි නමක් දානවා. ජාති 2 ක් බලහත්කාරයෙන් දෙමුහුම් කරල කෘතීමව හැදුවට දිගටම පවතින්නෙ නෑ. මේ එච් 4 කියන වී ජාතියේ ඉස්සෙල්ලම කරල් හොඳට හැදෙනවා. දෙවන වතාවට වපුරන කොට එච්චරම නැතත් ටිකක් හොඳයි. තුන් හතර වතාවක් වපුරන කොට සමහර ගස් මහ විසාලයි, සමහර ඒවා පුංචියි, විසමයි. මොකද වර්ග 2 ක් එකතු කරල හැදුවම කාලයක් යද්දි වර්ග දෙකට නැවතත් බෙදිල පැරණි ක්‍රමයටම යනවා. ඒ නිසා හැම වෙලේම දෙමුහුම් වී කියල හදාගත්තු ඒවායේ බීජ දිගටම ඒ විදියට පවතින්නෙ නෑ. නමුත් ස්වභාවික තත්ත්වය බැලුවොත් කොතැනත් ස්වභාවිකව තියෙන ගස් කොළං එක වගෙයි. ඒ ඒ ගති ලක්ෂණ, දේශගුණ කාලගුණ ආදිය අනුව පොඩි පොඩි වෙනසක්කම් උස් පහත්වීම් තියෙන්න පුළුවන්. නමුත් මේ එකම දෙයක් තියෙන්නෙ. හැම රටකම එහෙමයි. සත්ව වර්ගත් ඒ වගෙයි. දෙමුහුම් කරල හදන්න පුළුවන්, හැබැයි කල් යන කොට, තිබුණ වගේ නැවතත් බෙදෙනවා. මොකද ස්වභාවික හේතුවට ස්වභාවික ඵලය. කෘතීම හේතුවට කෘතීම ඵලය. කෘතීම හේතුව නම් නැවත කෘතීමව කරගෙන හදන්න ඕන. කෘතීම හේතුවෙන් ස්වභාවික ඵලයක් හදන්න බෑ. කෘතීම ඵලය තාවකාලිකයි.

දැන් මේ කාරණා ටික සඳහන් කළේ, කිරණ ලෝකයත් එක්ක මේ හැම දෙයකම තියෙන සම්බන්ධය පෙන්වන්න. ඒ අනුව නැවතත් මේ ලිපි පෙළෙන් මතු කරන වාස්තු විද්‍යාව පිළිබඳ කාරණාවලට අවධානය යොමු කළොත්, මනුස්සයො වාසය කරන ගෘහයකටත්, එහෙම නැත්නම් නිවසකටත් මේ කිරණ ලෝකය තමයි බලපාන්නෙ. මේ කිරණ වර්ග ගත්තම මනුස්සයින්ට යහපත් ඵල ගෙන දෙන හොඳ කිරණ වගේම අයහපත් ඵල ගෙන දෙන විස කිරණත් තියෙනවා. ඒ වගේම අමනුස්සයින් ප්‍රිය කරන කිරණ වගේම උන්ට විස කිරණ වර්ගත් තියෙනවා.

මෙතනදි අද බොහෝ දෙනෙක් නොදන්න කාරණයක් තියෙනවා. දැන් තියෙන එක්තරා ක්‍රමයක් තමයි, ස්වභාවයෙන් මැරිච්ච / දිරච්ච ගස්වල කොවුල්, මුල් කැලි ආදිය ගෙනල්ල අලුත් කලාවක් කියල ඒවා සුද්ද කරල ඔප දාල ගෙදර ඇතුලෙ හරි පිට හරි තැනක ලස්සනට කියල තියා ගැනීම. නමුත් මෙතනදි **මළ කොවුලක් කියන්නෙ (මැරිච්ච ගස්වල කොටස්) එක පැත්තකින් අමනුස්සයින්ගෙ වාසස්ථානයක්.** කැලේ තියෙන ගහක් කපල ඔප දා ගැනීමයි, මළ කොවුලක් ඔප දා ගැනීමයි කියන්නෙ කාරණා 2 ක්. මළ කොවුලක් කිව්වම ස්වභාවයෙන්ම මැරිච්ච / දිරච්ච ගහක් හෝ අකුණු ගහල මැරිච්ච ගහක් වෙන්නත් පුළුවන්. නමුත් මේ කාරණා 2 අතර වෙනසක් තියෙන බව මේවා පාවිච්චි කරන උදවිය දන්නෙ නෑ. එතකොට ස්වභාවිකව කැලේ තියෙන ගහක් කපල ලීයක් අරගෙන ඔප දා ගත්තට ඒ විදියෙ අමනුස්ස සම්බන්ධයක් නෑ. නමුත් මැරිච්ච / දිරච්ච ගහකට අමනුස්ස බලපෑම් තියෙනවා. මොකද ඒක අමනුස්සයින්ට ස්වභාවයෙන්ම උරුම වාසස්ථානයක්. ඒවා ගෙදර ගෙනත් තියා ගත්තම ඒ තැන්වල අමනුස්සයින් පැළපදියම් වෙනවා.

ඒ වගේම **යම් කිසි ගහකට හෙණ ගහල මළොත්, ඒ හෙණ ලී ගෙවල්වලට යොදා ගැනීමත් සුදුසු නෑ.** නමුත් අද වෙන කොට ගෙයක් හදන්න ඕන වුනාම කොහේ හරි ලී මෝලකින් ලී ගන්නව මිසක් මේ කාරණා ගැන හොයන්නෙ බලන්නෙ නෑ. යම් කිසි ගහක් හෙණ ගහල මළොත් ඒකත් ලී මෝලකට විකුණනවා. එතකොට ඒක හෙණ ගහපු ලීයක් කියල කියන්නෙ නැතිව, කපල ඔප දාල හොඳ ලී කියල විකුණනවා. ගහකට හෙණ ගැහුවයි කියන්නෙ එතන මොනව හරි සාපයක් සම්බන්ධයි. එහෙම සාපයක් එක්ක හෙණයක් ගහනව මිසක් ගහකට නිකං හෙණ ගහන්නෙ නෑ. එතකොට ඒකෙන් යම් කිසි විස කිරණ ශක්තියක් උත්පාදනය වෙනවා. එබඳු දේකින් සකස් වෙච්ච දේටත් ඒ ශක්තිය බලපානවා. ඒ නිසා ගෙවල් දොරවල් හදන්න ලී ගන්න කොට මේ කාරණය ගැනත් දැනුවත් වෙලා බොහොම පරිස්සමින් තෝර ගන්න ඕන.

ඊළඟට වහළකට යොදන ලී ගත්තමත් කිරි ලී, හර ලී කියල වර්ග 2 ක් තියෙනවා. කොස් වගේ කිරි තියෙන ගස්වල ලී තමයි කිරි ලී කියන්නෙ. ඇට්ටෝනිය වගේ ලී ගත්තම කිරි නෑ. ඒවා හර ලී. වහළකට ලී යොදා ගන්න කොට මේ කිරි, හර ලී වර්ග 2 ක් එකට යෙදීම සුදුසු නෑ. මොකද මේ එකිනෙකට පරස්පර ලී වර්ග 2 ක්. ඒ නිසා **වහළකට ලී යොදන කොට මේ හර, කිරි කියන ලී වර්ග දෙකෙන් මොනව හරි එක ලී වර්ගයයි යොදා ගන්න ඕන.** කිරි නම් කිරි, හර නම් හර. නමුත් අද මේ කාරණයත් හුඟක් අය වරද්ද ගන්නවා.

උදාහරණයක් විදියට මුදුන් ලීයට කොස් ලීයක් දාල, පොල් ලීයෙන් පරාල ගහනවා. දැන් කිරි, හර දෙවර්ගයම එතන තියෙනවා. මෙතනදි මුදුන් ලීය ප්‍රධාන වශයෙන්ම බලපාන්නෙ ගෙදර ප්‍රධානියාට. පරාල බලපාන්නෙ ප්‍රධානියාට ඇඳිලා ඉන්න දූ දරුවො භාර්යාව වගේ අයට. දැන් කිරි ලීයට හර ලී එකතු වුනාම ඒ දෙකේ තියෙන විරුද්ධ භාවය නිසා, ගෙදර ඉන්න ප්‍රධානියා සහ ඇඳිලා ඉන්න අයත් එකිනෙකට විරුද්ධකම් කරන්න පටන් ගන්නවා, ගලපන්න බැරිව යනවා. මොකද ඒ ලී දෙවර්ගයට ඇදෙන්නෙත් ඒ

ජාතියේ පරස්පර කිරණ. එතකොට ඒ කිරණත් ඒ අදාල අයට බලපාල සිතිවිලි එකිනෙකට වෙනස් විදියට තමයි ක්‍රියාත්මක වෙන්නෙ. ඕකට කතාවට කියන්නෙ ගොනයි මීමයි බැන්ද වගේ කියල. මොකද ඇඳුවට ගැළපෙන්නෙ නෑ. ගොනා ගොඩට අදින කොට මීමා මඩට අදිනවා. ඒ නිසා වහළකට ලී දානව නම් මොනව හරි එක ජාතියක ලී වර්ගයක් දාන්න ඕන. සාමාන්‍යයෙන් කොස් ලී වගේ ගත්තම මිල අධික නිසා මුළු වහළටම දාන්න ගියොත් විසාල වියදමක් යන්න පුළුවන්. ඒ නිසා ඇට්ටෝනියා, පොල් වගේ හර ලී යොදා ගන්නව නම් වියදම අඩුයි. හැබැයි වඩාත්ම හොඳ කිරි ලී. මොකද කිරි කියන්නෙ සශ්‍රීකත්වය, පිරිසිදු බව පෙන්වන ලකුණක්.

එතකොට දැනටමත් කිරි, හර ලී වර්ග දෙක මිශ්‍ර කරල හදපු වහලවල් තියේ නම් ඒකෙන් එන දෝසය කැපෙන්න, පසුගිය කලාපයෙන් විග්‍රහ කළ විදිහට රන් රිදී තහඩුවක් මුදුන් ලීය මැදින් තියන්න පුළුවන්. ඒ තහඩුව තනිකරම රත්රන් නම් වඩා හොඳයි. එහෙම නැත්නම් රිදී තහඩුවක් රත්රන් වතුරෙ දාල හෝ රන් රිදී මිශ්‍ර කරල  හදා ගන්නත් පුළුවන්. ඒ විදිහට හදා ගන්න තහඩුව මුදුන් ලීයෙ උඩ හරස් අතට තියෙන දිග ප්‍රමාණයට වඩා දෙපැත්තෙන් අඟල් 1/2 බැගින් එන විදිහට ගත්තම දෙපැත්තට තියල නවන්න පුළුවන්. තහඩුවේ පළල, මුදුන් ලීයෙ උඩ හරස් අතට තියෙන දිග ප්‍රමාණයටම සමානව තමයි ගන්නෙ. උදාහරණ විදිහට ලීයෙ උඩු අතට පළල අඟල් 5 ක් නම් 5 x 6 තහඩුවක් ගන්න ඕන. තහඩුවේ දිග පැත්තෙ තියෙන වැඩිපුර අඟල තමයි දෙපැත්තට අඟල් 1/2 බැගින් නවන්නෙ. අන්න ඒ තහඩුව හරියට මුදුන් ලීයෙ දිග මැනල ඒකෙ හරි මැද උඩ අතට තියල, අර අඟල් 1/2 බැගින් තියපු ප්‍රමාණය දෙපැත්තට නවල ලීයෙ මැදට අහු නොවෙන්න දෙපැත්තෙන් කොන් දෙකටම ටින්ටස් ඇණ දෙක බැගින් ගැහුවම තහඩුව රඳවන්න පුළුවන්.

මෙතනදි විශේෂයෙන්ම ලීයෙ හරි මැදට ඇණ නොවදින්න වග බලාගන්න ඕන. ඒ වගේම ඇණ ගහන කොට ගෙදර කිසිම කෙනෙක්ගෙ කට හඬ අහුනොවෙන්නත් වග බලාගන්න ඕන. ඒ නිසා මේ ඇණ ගහන කටයුත්ත තමන්ට විස්වාස, ඒ ගැන දන්න කියන කෙනෙක් ලවාම කරගන්න ඕන. තහඩුව හරි ගස්සල සම්බන්ධ කරන්න ගෙදර කෙනෙකුට පුළුවන් වුනාට, ඇණ ගැසීම ගෙදර කෙනෙකුට කරන්න බෑ. මොකද ඇණ ගහන කොට තමන්ගෙ ක්‍රියා ශබ්දයත් ඒකට අහු වෙනවා. එතකොට තමන්ට ඒකෙන් ලොකු දෝසයක් එනවා. (කටහඬ අල්ලා ඇණ ගැසීමෙන් එන විපාක / දෝස ගැන මීට පෙර 20 වන කලාපයෙන් විග්‍රහ කරල තියෙනවා.) ඒ නිසා පිට කෙනෙක් ලවා ඇණ ගස්සවන කොටත් ඒ වෙලාවට ගෙදර සියලු දෙනාම ගේ ඇතුලින් ඉවත් කරල ඒ අයට නිහඬව ඉන්න කියල ඒක කරන්න ඕන.  පොඩි ළමයෙක් ඉන්නව නම් සද්ද කරන්න පුළුවන් නිසා ඈතට ගෙනියන්න ඕන. ඉතින් මේ ඇණ ගහන වැඩේට විනාඩි 2 ක් වත් යන්නෙ නෑ. කෙටි කාලයක් ඇතුලත කරන්න පුළුවන්. ඇණ ගහන වෙලාවට විතරයි ඒ විදිහට නිශ්ශබ්දව ඉන්න ඕන වෙන්නෙ. මේ විදිහට තහඩුව තියන ක්‍රමයෙන් වහලයේ තියෙන දෝසවලින් සෑහෙන ප්‍රමාණයක් කැපෙනවා. වහලෙ විශේෂ දෝසයක් නොතිබුනත් ඒ විදිහට තහඩුවක් තිව්වම ඒකත් හොඳයි. හොඳ ශක්තිය ඇදල එන්න ඒක හේතුවක් වෙනවා.

ඒ වගේම ගෙදරක මුදුන් ලීය මනුස්සයින්ගෙ මොළය හා සම්බන්ධ බවත් පසුගිය කලාපයෙන් පැහැදිලි කළා. එතනදි මුදුන් ලීය ඕනවට වඩා කොට වීම



මනුස්සයාගෙ කල්පනා ශක්තියට තදින්ම බලපාන බවත් උදාහරණ සහිතව පැහැදිලි කළා. දැන් ඒ විදියට මුදුන් ලීය කොට වෙච්ච අවස්ථාවක් තිබුනොත්, ඒකට තවත් කෑලි ඈඳල මූට්ටු කර ගන්න පුළුවන්. හැබැයි එතකොට සම්පූර්ණ මුදුන් ලීයටම මූට්ටු 3 ක් එන්නත් හොඳ නෑ. ඒ වගේම මුදුන් ලීයෙ මැදට මූට්ටුවක් එන්නත් හොඳ නෑ. මූට්ටු 3 ක් නැතිව වෙනත් ඕනෑම මූට්ටු ගණනක් ආවට ගැටළුවක් නෑ. ඒකටත් හේතුවක් තියෙනවා. සාමාන්‍යයෙන් ඉස්සර ඉඳන්ම එන සම්ප්‍රදායක් විදියට තුන් පොළකින් බඳින්නෙ මළ මිනියක්, මිනී පෙට්ටියක්. ඒ හැර අනික් කිසිම දෙයක් මූට්ටු 3 ක් එන විදියට බඳින්නෙ නෑ. දර මිටියක් බැන්දත් හතර පොළකින් හෝ දෙපොලකින් බඳිනව මිසක් තුන් පොළකින් බැඳල ගෙනියන්නෙ නෑ. මොකක් හරි ශාස්ත්‍රයක් අනුව, තුන් පොළකින් බැන්දොත් ඒක හිමි වෙන්නෙ අමනුස්සයින්ට. ඉතින් මුදුන්  ලීයට මූට්ටු 3 ක් දැම්මොත් ඒකටත් අමනුස්ස බැල්මක් වැටෙනවා. විශේෂයෙන් මහ සොහොන් දිෂ්ටියට අහු වෙනවා. එතකොට ඒ ලීයත් අමනුස්සයින්ට අයිති වෙනවා. ඒක ඒ ගෙදර ඉන්න අයට හොඳ නෑ. විශේෂයෙන් ගෙදර ප්‍රධානියාට භූත බැල්ම හිටිනවා, නිකං ඔල්මාද වීම් වගේ ඇති වෙන්න පුළුවන්. ප්‍රධානියා නැත්නම් ඊළඟට ඉන්න කෙනාට ඒ බලපෑම එනවා. ඒ විදිහට සියලු දෙනාටමත් ඒ බලපෑම විහිදිලා යනවා. යම් කිසි නරක වෙලාවක් අහු වුනොත් ඒ වගේ මොහොතක ඒ බලපෑම එන්න පුළුවන්. ඒ නිසා ඒකත් බරපතල දෝසයක්. ඒ දෝසය ඉවත් කරන්න තියෙන පිළියම තමයි, එක්කො කොතනකින් හරි කපල තවත් කෑල්ලක් මූට්ටු කිරීම. එතකොට මූට්ටු 4 ක් වෙනවා. එහෙම නැත්නම් පිත්තල කම්බියක් අරගෙන මුදුන් යට ලීයෙ දිග අතට වට රවුමක් ගිහින් ලීයෙ මැදට අහු නොවෙන්න ගැටයක් දාන්න ඕන. එහෙම කළාම ඒක මූට්ටු නැති තනි ලීයක් හා සමාන වෙනවා.

උදාහරණයක් විදියට මුදුන් ලීය අඩි 25 ක් දිග නම්, අඩි 50 කට වඩා දිග පිත්තල කම්බියක් ගන්න ඕන. හැබැයි පිත්තල කම්බිය බොහෝ කොටම කැඩෙන්න බලන නිසා ප්‍රවේසමෙන් කරන්න ඕන. මේ පිත්තලවල විස කිරණ ඇදල විසි කරන මොනව හරි විශේෂ ශක්තියක් තියෙනවා. ඈත අතීතයේ පටන්ම ගෙවල්වල තියන විසාල පහන් ආදිය පිත්තලවලින් හදන්නෙත් ඒ හේතුව නිසා. ඒ විදිහට මූට්ටු 4 ක් එන විදිහට මුදුන් ලීය හදල, එහෙම නැත්නම් පිත්තල කම්බියක් දාල ඒ දෝසය අයින් කරල, ඊට පස්සෙ ඕන නම් අර වගේ තහඩුවක් තියන්නත් පුළුවන්.

ඒ වගේම ගෙයක් හදන කොට කුස්සියත් ගෙට සම්බන්ධ වෙන්න ඕන. නමුත් සමහරු ගෙට දුම් වදිනව කියල කුස්සිය වෙනම පිටින් හදනවා. එතකොට ඒ ගෙදර උදවියට අවශ්‍ය කරන ශරීර උෂ්ණත්වයට බාධා ඇති වෙනවා. ඒකත් දෝසයක්. ඒ නිසා ගේ ඇතුල රත් වෙන්න, ගෙට ගැලපෙන විදියට සම්බන්ධ කරල කුස්සිය හදන්න ඕන. ගේ ඇතුලට සුළුවෙන් හෝ රස්නයක් එන්න ඕන. ස්වභාවිකව තියෙන උෂ්ණත්වය මදි නිසයි එහෙම ඕන වෙන්නෙ. කුස්සිය සම්බන්ධ නැති ගෙවල්වල ඉන්න අයට ශරීර උෂ්ණත්වයට සම්බන්ධ සෙම් ආදී රෝග ඇති වෙන්න හේතු වෙනවා. පිරිසිදුව කියල හදා ගත්තට අන්තිමට වෙන්නෙ ශරීර උෂ්ණත්වය වැඩි කරන, රුධිර ධාතුව රත් කරන තේජෝ ශක්තිය අඩු කිරීම. මොකද උෂ්ණත්වය අඩු වුනාම සෙම වැඩි කරනවා. ඒකත් රෝගයක්. එතකොට රෝගය මොකක්ද කියල හොයන්න බෑ. එහෙම ඇති වන රෝගවලට බේත් කරල හරියන්නෙ නෑ. වාස්තු දෝසය ඉවත්

කරන්නම ඕන.

ඊළඟට මේ කාලෙ වෙන කොට තියෙන තවත් විලාසිතාවක් තමයි, ගෙදරක ජනේලයක් තියන කොට නව නිර්මාණ ක්‍රමයට අනුව කලාත්මක වෙන්න කියල ජනේලය පහළම ඉඳන් උඩට ගැනීම. එතකොට බිම ඉඳන් බැලුවම ජනේලය අඩි 2 ක්වත් උස නෑ. සමහර ගෙවල්වල ජනෙල් එච්චරවත් උසින් නෑ. බිම ඉඳලම පටන් ගෙන. නමුත් ඒක දෝස සහිතයි. අත්තිවාරමේ පටන් අඩු ගානෙ අඩි 4 ක් වත් උඩට බිත්තිය බැඳල එතන ඉඳල තමයි ජනේලයක් තියන්න ඕන. මොකද හුඟක් පහලින් ජනේලයක් තිබ්බොත් එතන අමනුස්සයින්ට සම්බන්ධයක් ඇති වෙනවා. අඩි 4 ක පටන් පහළ ප්‍රදේශය අමනුස්සයින්ට අයිතියක් තියෙනවා. සාමාන්‍ය විදියට බැලුවත්, ගෙදරක දොර ළඟ ඉඳන් බලන් ඉන්න බැරි කෙනෙක් / දුබල කෙනෙක් එහෙම නැත්නම් හොරෙක් ඉන්නව නම්, ඊළඟට ජනේලය අස්සෙන් තමයි බලන්න උත්සාහ කරන්නෙ. අන්න ඒ වගේ දෙයක් මෙතනදිත් සිද්ධ වෙනවා. ප්‍රධාන දොර හෙවත් ඉස්සරහ දොර කියන්නෙ ප්‍රසිද්ධ දොර නිසා ඒ ස්ථානයේ ඉඳන් බලන්න එන්නෙ නෑ බයයි. ඒ නිසා ඒ දොර පහත ඉඳන්ම තිබුණට බලපෑමක් නෑ. නමුත් ඊට අමතරව ජනේලයක් තියේ නම්, ජනෙල් අස්සෙන් එබිකම් කිරීම හොරුන්ගෙ ස්වභාවයක්. අන්න ඒ වගේ ස්වභාවයක් අමනුස්සයින්ටත් තියෙනවා. නමුත් ජනේලය අඩි 4 ක් විතර උඩින් තිබ්බම අමනුස්සයින්ට ඒක අයිති නෑ. පහළ කොටස තමයි උන්ට අයිති. පහළ ඉඳන් ජනේලයක් තිබ්බම අමනුස්සයින්ට එතන ඉඳන් එබිකම් කරන්න ලේසියෙන් පුළුවන්. ඒ නිසා **ජනේලයක් පහතින් තිබ්බොත් ගෙවල්වල අමනුස්ස දෝස වැඩි වෙන්න ඒක හේතුවක් වෙනවා.** නමුත් එහෙම දෙයක් තියෙන බව අද හුඟක් අය දන්නෙ නෑ.

දැන් මේ වගේ යම් කිසි ඉදිකිරීමක් කළාට පස්සෙ ඒකෙ යම් කිසි වාස්තු දෝසයක් ආවොත්, ඒ දෝසය ඉවත් කරන කොටත් එක්තරා ක්‍රම වේදයක් තියෙනවා. විශේෂයෙන් යම් කිසි ව්‍යුහාත්මක වෙනසක් කපල කොටල සිද්ධ කරන කොට හිතුමතේ කරන්න සුදුසු නෑ. ඉස්සෙල්ලම යම් කිසි ආශිර්වාද ශක්තියක් ගැබ් කරල විස කිරණවලින් එන ආපදා නැති වෙන්න ඒ ස්ථානය සකස් කර ගන්න ඕන. ඒකට මේ සඟරාවෙ පෙර කලාපයකින් සඳහන් කළා වගේ දස දිසා බන්ධන පිරිතෙන් සෙත් කරපු සුවඳ දුම් අල්ලල, පහනක් පත්තු කරල, සෙත් පිරිත් කියල, ගෙවත්තට වැලි ඉහල ඒ වගේ මොනව හරි ක්‍රමයකට සුද්ද කිරණක් ඒ වටේට පතුරුවල ඉන්න ඕන. අඩු ගානෙ සුවඳ දුම් අල්ලල පහනක්වත් පත්තු කරල ඉන්න ඕන. එහෙම කළේ නැත්නම් ව්‍යුහාත්මක වෙනසක් කරල යමක් අලුතින් හදන කොට ඒත් එක්කම විස කිරණක් පිට වෙනව වගේ දෙයක් සිද්ධ වෙනවා. උදාහරණ විදියට යම් කිසි දෙයක් එක තැන තැන්පත් කරල කාලයක් තියෙන කොට ඒ තුළ විශාල ශක්තියක් ගැබ් වෙනවා. ඒ වගේ අවස්ථාවක ඒක කඩල එතැනින් ඉවත් කරන කොට විශාල ශක්තියක් පිට වෙනවා. ඒ පිට කරන ශක්තිය සමහර විට විශාල බලයක් ඇති කරනවා. දෝසයක් එන විදියට තැන්පත් කරපු දෙයක් නම් ඒ පිට වෙන ශක්තියත් දෝස සහිතයි. ඒ නිසා ඒක මෙල්ල වන විදිහෙ ශක්තියක් අවට පිහිටුවල තමයි ඒ දෝසය කපන්න ඕන. මේ සම්බන්ධයෙන් වහරක අභයරතනාලංකාර හිමියන් ගිහි කාලයේ ලබපු අත්දැකීමක් තමයි මේ.

''එක්තරා පවුලක භාර්යාවට ඒ ගෙදර තිබ්බච්ච වාස්තු පිහිටීමක් නිසා ඔය වගේ ආපු දෝසයක් ඉවත් කරන්න අවස්ථාවක් ආවා. මම ඇහුවා කුස්සියේ



පෝරණුව ඇතුලෙ වහලට සම්බන්ධ වෙච්ච පරාල තියෙනවද කියල. බලන කොට එහෙම දෙයක් තියෙනවා. එතකොට මොකද වෙන්නෙ, පෝරණුවෙන් පිට වෙන රත් වෙච්ච දුම ඒ පරාලවලට වැදිල ඒ ගෙදර ගෘහණියටත් දෝසයක් එනවා. එහෙම දුම් වදිනව කියන්නෙ ඉහට රස්සනය වදිනවා, රක්ත වාතය ඉහට ගහනවා, නිතර පවතින හිසරදවලට හේතු වෙනවා.

මෙතනදි ගෙයි වහලෙ පරාලයකට දුම් වැදීම විතරක් නෙවෙයි, කුස්සියේ පරාලයක්වත් පෝරණුව ඇතුලට එන්න හොඳ නෑ. අඩු ගණනෙ මැදින් හරස් ලීයක් දාල ඒකට කුරුපා තිබ්බත් ඒකත් බලපානවා. කොටින්ම කිව්වොත් පෝරණුව ඇතුලෙ රීප්පයක් / පරාලයක් වගේ දෙයක් තියෙන්න සුදුසු නෑ. වහලෙ රීප්පයකට පෝරණුවෙන් පිට වෙන දුම් වැදීම සුදුසු නෑ. ඒ වගේ වෙලාවට පෝරණුවෙ ඒ විදිහෙ වහලයක් තියේ නම් ඒක ඉවත් කරල කොන්ක්‍රීට් තහඩුවක් දාන්නත් පුළුවන්. ඉතින් මම කිව්වා, මේකෙන් එන ඒ දෝසය ඉවත් කරන්න නම් පෝරණුව ඇතුලෙ තියෙන ඒ පරාල කපන්න වෙනව කියල. හැබැයි ඒක කැපුවට පස්සෙ කොන් කැල්ලක්වත් පෝරණුවට නිරාවරණය වෙලා තියෙන්න හොඳ නෑ. ඒ නිසා කපල ඉතිරි වෙන කොන් කැල්ලත් සිමෙන්ති දාල කපරාරු කරල වහන්න ඕන. එහෙම නැතිව නිකං කපල ඉවත් කළාට හරි යන්නෙ නෑ. ඉතින් මේ ගෙදර පෝරණුව බලන කොට දෙපැත්තෙන් පරාල 2 ක් ඒ විදියට ගිහින් තිබුණා. ඒ නිසා සෙත් කරපු තෙල් පහන්, සුවඳ දුම් ආදිය පත්තු කරල වට පිටාව හදා ගෙන මිසක් නිකම්ම ඉවත් කරන්න හොඳ නෑ කියලත් මම කිව්වා. හැබැයි ඒ ගෙදර ගෘහ මූලිකයා (ස්වාමියා) එක්තරා විදියකට භෞතික වාදියෙක් වගේ, ඔය සෙත් ශාන්ති ආදී කරණා පිළි නොගන්න විදියට තමයි අඟවන්නෙ. මගෙත් බලයක් තියෙනවා, ඒ බලය ඊට වැඩියි ... ආදී වශයෙන් එහෙම අදහස් තමයි ඔහුට තිබුනෙ. ඒ කියන්නෙ අර සෙත් කරපු තෙල් පහන්, සුවඳ දුම් ආදියෙන් එන ශක්තියට වඩා ශක්තියක් තමන්ට තියෙනව කියලයි මේ කියන්නෙ.

ඉතින් මේ මනුස්සයා මොකද කළේ, මම අර විදියට උපදෙස් දීල ආවට පස්සෙ කියතක්, නියනක් එහෙම අරගෙන අර පරාල 2 රැහැල ඉවත් කරල දැම්මා. පෝරණුව ඇතුලෙ තිබ්බච්ච නිසා ඒක ඇතුළෙ ඉඳන්ම කපල මේ මනුස්සයා පිටි පස්සෙන් බිමට පැන්නා. කොහොම හරි එතන යකඩ ඇණයක් ගහපු ලී කැල්ලක් තිබිල හරියටම කකුල මැදින් ඇනිල අනිත් පැත්තෙන් පසාරු කරගෙන උඩට මතු වුණා. ඊට පස්සෙ මාසයක් විතර ඒකට වෙදකම් කළා. ඉතින් මම ඇහුවා මොකද වුනේ කියල. අර පරාලෙ කපන්න ගිහින් මෙහෙම දෙයක් වුනා කිව්වම මම කිව්වා, කියපු විදියට සෙත් ශාන්තියක් පතුරුවල දෝසය ඉවත් කරපු නැති එකේ මොනව හරි විපාකයක්නෙ ආවෙ කියල. එතකොට බලන්න ඒ දෝසයෙන් නැගිච්ච ශක්තියත් එවෙලෙම බලපෑවා. හැබැයි ඒ ගෙදර නෝනට තිබ්බච්ච ඔළුවෙ කැක්කුමත් ඒත් එක්කම ඉවත් වුණා. දෝසය කැපුනත් අර විදියට ආරක්ෂාකාරීව නොකළ එකේ ප්‍රතිඵල එතනදි ගෘහ මූලිකයට බලපෑවා. ඒ නිසා මේ වගේ දේවල් හිතුමතේට කරන්න හොඳ නෑ. මේ වගේ දේවල් කියන්නෙත් හේතුවක් ඇතුවමයි.''

ඒ වගේම සමහරු කේන්ද්‍ර ආදිය බලල ගෘහ මූලිකයගෙ නමින් ගේ හදන්නෙ නැතිව, වෙනත් වාසනාවන්තයි ☞


# කේන්දරයෙන් පෙන්වන හේතු ඵල දහම ....

**3 වන කොටස**

කේන්දර ගැන විග්‍රහ කෙරෙන පළමු කොටසින් (41 වන කලාපයෙන්) ලග්න 12 ගැන පොදු විග්‍රහයක් ඉදිරිපත් කළා. එතනදි ලැගපු තැන පෙන්වන න්‍යාය කියල හැම ලග්නයකින්ම පෙන්නුවෙ, පෙර අත්බවයේ පොදුවේ අවිද්‍යාවෙන් ගෙන ගිය වැඩපිළිවෙල ගැන. ඒ අනුව ඒ හැම ලග්නයකම ලක්ෂණ විදිහට පෙන්නුවෙ අවිද්‍යාව, මුලාව නිසා කරපු සසර ගමනට හේතු වෙන අසුබ වැඩපිළිවෙලක්. එතකොට කෙනෙකුට හිතෙන්න පුළුවන්, යම් කිසි ලග්නයක් ගත්තම ඒ ලග්නයෙන් උපන් සියල්ලම ඒ වගේ අවිද්‍යා සහගත ගති ලක්ෂණවලින් යුක්තද, ඇයි එතකොට එකම ලග්නයෙන් ඉපදිච්ච අය අතර වුනත් හොඳ නරක දෙගොල්ලොම නැත්ද කියල.

මෙතනදි පළවෙනි කාරණය තමයි ලෝකෝත්තර පැත්තට හෙවත් නිවනට සාපේක්ෂව බැලුවොත්, මේ හැම ලග්නයකින්ම පෙන්වන පෙර අත්බවයේ ලැගපු න්‍යායන් එකක්වත් ලෝකෝත්තර පැත්තට හේතු වෙන දෙයක් නෙවෙයි. මොකද ලෝක සම්මතයේ ලෞකිකත්වය තුළ ඉඳගෙන හොඳයි කියල සම්මත කරගෙන ඉන්න වැඩපිළිවෙලක් ඇත්ද, ඒකත් අවිද්‍යා සහගතයි. උදාහරණයක් විදිහට කෙනෙක් දිව්‍ය ලෝක වගේ සුගතියක් බලාපොරොත්තුවෙන් පින් දහම් කරනවද, නිවනට සාපේක්ෂව ඒකත් අවිද්‍යා සහගත වැඩපිළිවෙලක් නිසා හොඳයි කියන්න බෑ. මොකද ඒකත් සසර ගමනට හේතු වෙනවා. ඒ නිසා මේ ලග්න දොලහෙම ලැගපු න්‍යාය / පෙර කරපු වැඩ පිළිවෙල ගත්තොත් අවිද්‍යා සහගතයි.

හැබැයි යම් කිසි ලග්නයකින් උපන් කෙනෙක් ගත්තම, ඒ පුද්ගලය මේ අත්බවයේ හොඳ නරක සියල්ලම කෙළවර කරල ලෝකෝත්තර පැත්තෙන් අරිහත් ඵලයට පත්වෙන්නත් පුළුවන්. එහෙම නැත්නම් ලෝක සම්මත සමාජයේ සුචරිතවත්, ගුණවත් සත් පුරුෂයෙක් වෙන්නත් පුළුවන්. එහෙමත් නැත්නම් සමාජයට වින කරන දුෂ්චරිත පුද්ගලයෙක්



වෙන්නත් පුළුවන්. ඒ නිසා කෙනෙක් යම් කිසි ලග්නයකින් උපන් පලියටම ඒ ලග්නයේ පොදු ගති ලක්ෂණ අල්ලල ඒ පුද්ගලය නරකයි හෝ හොඳයි කියන්න බෑ. මොකද මේ හැම ලග්නයකම හොඳ නරක දෙපැත්තක් තියෙනවා. හැබැයි ඒක නැණ නුවණින් හරියට තෝරගන්න ඕන. ඒ නිසා තමයි කටක ලග්නයේ පොදු ලක්ෂණය, අවිද්‍යා සහගතව හරස් කැපීම හෙවත් හරහට යෑම කියල විග්‍රහ කළත්, අද කියන විදිහට ලොව්තුරා බුදුන් වහන්සේ කටක ලග්නයෙන් ඉපදුනා කියන කාරණයත්, උන් වහන්සේගෙ ඒ ලෝකෝත්තර වැඩපිලිවෙලට ගැලපෙන විදිහට විග්‍රහ කළේ. ඒ කියන්නෙ උන් වහන්සේ ලෞකික ගමනට හරස් කපල ලෝකෝත්තර මාර්ගයේ ගමන් කළා. කටක ලග්නය ගැන විග්‍රහ කරන කොට, කෙනෙක් මේ අදහස වැරදියට තේරුම් ගන්න පුළුවන් නිසා තමයි ඒ කාරණය වේලපහින්ම (41 වන කලාපයෙන්) විග්‍රහ කළේ. නමුත් කටක ලග්නය විතරක් නෙවෙයි, අනික් සියලු ලග්න ගත්තමත් ඒ හැම එකකම හොඳ නරක දෙපැත්තක් තියෙනවා.

උදාහරණ විදිහට මේෂ ලග්නයේ පොදු ස්වභාවය අවිද්‍යා සහගතව කර්කෂ ජීවිතයක් ගත කරමින් අනුන් හෙළා දමමින් පර්යේෂණය කරපු වැඩපිළිවෙලක් කියල මීට කලින් විග්‍රහ කළත්, ලෝක සම්මතය ගත්තම මේෂ වුන පලියටම නරකයි හෝ හොඳයි කියල කියන්න බෑ. උච්ච, නීච, සම, ස්වක්ෂේත්‍ර කියන ග්‍රහ පිහිටීම් අනුවත් ඒ කාරණය වෙනස් වෙනවා. උසස් වැඩ නම් කළේ, ග්‍රහය උච්චයි. ඒ නිසා එකම ලග්නය ගත්තත්, කෙනෙක් පහත් වෙන්න පුළුවන්, තව කෙනෙක් උසස් වෙන්න පුළුවන්. ග්‍රහය උච්ච වීමෙන් පෙන්වන්නෙ බලවත් කියන එක. හැබැයි නරකටත් උච්ච වෙන්න පුළුවන්, හොඳටත් උච්ච වෙන්න පුළුවන්. එතකොට මේ කාරණය අති සියුම් දෙයක්. ඒ නිසා එකම ලග්නයකින් ☞

කියල කියන, ගෙදර වෙනත් කෙනෙක්ගෙ නමින් ගේ හදන්න පෙළඹිලා තියෙන බවත් පසුගිය කලාපයෙන් සඳහන් කළා. එතනදි යමෙකුට හොඳ නෑ, කාලය හොඳ නෑ ආදී වශයෙන් කිව්වට, ඒ අතරෙදි යෙදෙන සියුම් හොඳ වෙලාවකින් හොඳ පරිසරයක් හැදෙන අවස්ථා තියෙනවා. ගෘහ මූලිකයට වුනත් නරක කාලයක් නම් අන්න ඒ වගේ හොඳ අවස්ථාවක් අල්ල ගන්න පුළුවන්. ඕනෑම කෙනෙක්ගෙ පක්ෂියා රජ වෙන වෙලාවක් තියෙනවා. ඉස්සර කාලෙ ඒ ක්‍රමයට හොඳ නරක බලන ක්‍රමයක් තිබුණා. කෙනෙක්ගෙ කොච්චර නරක කාලයක් වුනත් ඒ ක්‍රමයට සියුම් හොඳ වෙලාවක් තෝර ගත්තම ජයග්‍රහණය ලබන්න පුළුවන්. ඒ ක්‍රමයෙන් අර තියෙන දෝස, අපල ඇත් වෙලා ඒ තෝර ගත්ත කාල මාත්‍රය හොඳ අවස්ථාවක් වෙනවා. සෑම කළු වළාකුළකම රිදී රේඛාවක් තියෙනවා කියන කියමන කාගෙ කියමනක් වුනත් මේ කාරණයට ඒකත් ගැලපෙනවා. එහෙම හරියට තෝර ගන්න මාත්‍රයක කාලය ඒ පුද්ගලයට ජයග්‍රහණය ගෙන දෙනවා. ඒ නිසා අන්න ඒ වගේ ක්‍රමවලින් ප්‍රයෝග සම්පත්තියක් ළඟා කරගන්නවා හැර, හේතු ඵල දහමට අනුව පෙන්වල තියෙන මූල ධර්ම අයින් කරල වැඩ කරන්න ගියොත් පසු කාලීනව නැති කරදරත් එන්න පුළුවන්.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

සටහන
**නීතිඥ චන්දන සිරිවර්ධන**

උපන් දෙන්නෙක් අරගෙන ලග්නයේ පොදු ස්වභාවය අනුව බලල දෙන්නම සමානයි කියන්න බෑ. ඒ හොඳ නරක දෙකත් ග්‍රහ පිහිටීම් අනුව වෙනස් වෙනවා. එතකොට දැන් මේ විග්‍රහ කරන්නෙ කටක ලග්නය හැරුනම ඉතිරි ලග්න එකොලහේ ප්‍රධාන වශයෙන් ලෝක සම්මත හොඳ පැත්ත. මොකද අවිද්‍යා සහගතව ලැගපු මූලික පැත්ත මීට පෙර 41 කලාපයෙන් විග්‍රහ කළා.

ඊට කලින් කටක ලග්නය ගැන කතා කරනකොට කෙනෙකුට තවත් ප්‍රශ්නයක් එන්න පුළුවන්, හැම බුදු කෙනෙක්ම ඉපදෙන්නෙ කටක ලග්නයෙන්ද කියල. සමහරවිට එහෙම වෙන්නත් පුළුවන්, නමුත් එල්ල කරලම කියන්න බැරි, මේ හැම ලග්නයකම ඒ විදිහෙ හොඳ පැත්තකුත් තියෙන නිසා. හැබැයි පොදුවේ එකම ගති ලක්ෂණ තමයි බෝසත්වරුන්ට තියෙන්නෙ. ඒ තමයි ලෞකික මගට හරස් කැපීම. එතකොට සඳුගෙ ආරම්භය තමයි උන් වහන්සේලාගේ ප්‍රධාන කටයුතුවලට යෙදෙන්නෙ. ඉපදෙන්නෙත් පුන් පොහෝ දිනක. බුදු වෙන්නෙත් පුන් පොහෝ දිනක. පිරිනිවන් පාන්නෙත් පුන් පොහෝ දිනක. පුන් පොහොයක් නම් සඳුගෙ සම්බන්ධය තියෙන්න ඕන. ඒ නිසා කටක ලග්නය සම්බන්ධ වෙන්න පුළුවන්. සිදුහත් බෝසතාණන් වහන්සේගෙ පශ්චිම අත්බැව ආරම්භයේදිම ලෞකික වූ සක්විති රජකමට හරස් වුණා. පටන් ගත් තැනම රජ කුමාරයෙක් වෙයි කියල තමයි හුඟ දෙනෙක් කිව්වෙ. බලාපොරොත්තු වුණෙත් එහෙම දෙයක්. නමුත් ඒවා අතහැරල දාල යන තැනටයි වැඩ කටයුතු යෙදුනෙ. ඊට පස්සෙ බුද්ධත්වයට පත් වුනාම සසර ගමනට හරස් වුණා. අන්තිමට පිරිනිවන් පාන අවස්ථාව ආවම භව ගමනට, මතු උපතට හරස් වුණා. මේ විදිහට තුන් පොළම හරස් වුණා.

එතකොට නියම විදිහට බැලුවොත්, මේ තුන් අවස්ථාවටම කටක ලග්නය සම්බන්ධ වෙන්න ඕන. පෙර භවයේ පාරමී ශක්තියෙන් ආවත්, මේ අත්බැව සකස් වුණේ බුදු වෙන්න මිසක් සක්විති රජ වෙන්න නෙවෙයි. ඒ නිසා තමයි සක්විති රජකමට හරස් වුණේ. නමුත් ඒ විදිහට වෙන කුමාරයෙක් උපන්න නම්, සක්විති රජ වෙන්න පුළුවන්. බෝසතාණන් වහන්සේ සක්විති රජකමට හරස් කපාගෙනමයි උපන්නෙ. ඊට පස්සෙ භව ගමනට, කෙළෙස්වලට හරස් කැපුවා. අන්තිමට පිරිනිවන් පානකොට, පංචස්කන්ධයටම හරස් වුණා. ඒ කියන්නෙ ස්කන්ධ පරිනිර්වාණයෙන්. මේ තමයි කටක ලග්නයට සම්බන්ධ ලෝකෝත්තර පැත්තෙ ස්වභාවය. කේන්දරය හදල බැලුවොත් බුදුන් වහන්සේගෙ මේ අවස්ථා තුනටම කටක ලග්නයේ සම්බන්ධයක් තියෙන්න පුළුවන්. උපන් කේන්දරය වගේම බුදු වෙච්ච සහ පිරිනිවන් පාපු අවස්ථාවෙ කේන්දරයත් හැදුව නම් එහෙම සම්බන්ධයක් හොයා ගන්න පුළුවන්.

ඊළඟට මේෂ ලග්නය ගත්තම එළුවෙක්ගෙ ගති ලක්ෂණ තමයි පෙන්වන්නෙ. එළුවගෙ ස්වභාවය තමයි ඕනම කර්කෂ තැනක ගිහින් ජීවත් වෙලා කටයුතු කරල තමන්ගෙ ජයග්‍රහණය ලබාගැනීම. ඒ විදිහට වෙහෙස වෙවී නරකක් කළොත් අයහපතට හිටිනවා. ඒ කාරණය මීට කලින් විග්‍රහ කළා. එතකොට මේෂ ලග්නයෙන් උපන් කෙනෙක් ඒ විදිහට කර්කෂව දුක සේ කටයුතු කරල ජීවිතය ගැට ගහගෙන පින් දහම් කරල, බණ භාවනා කර ගෙන හිටිය නම් ඒක යහපත් පැත්තට හිටිනවා. ලෝකෝත්තර සුවයටත් හේතු වෙනවා. ඒ විදිහට යහපතට කටයුතු කළොත්, හේතු ඵල අනුව කවද හරි මහන්සි නොවී සම්පත්තියක්, ජයග්‍රහණයක් ලබන්න හේතු වෙනවා. මේෂ කුජට අයිති නිසා තරඟකාරීත්වය, සේනා බලය ආදී සියල්ලම යහපත් පැත්තට ලැබෙන්න හේතු වෙනවා. හොඳ විදිහට ක්‍රියාත්මක කළොත් යහපතට, නරක විදිහට ක්‍රියාත්මක කළොත් අයහපතට. පින් පවු දෙක අනුව තමයි ඒ කාරණය තීරණය වෙන්නෙ.

ඊළඟට වෘෂභ ලග්නය සංකේතවත් වෙන්නෙ කිරි ගවයගෙන්. වෘෂභ සිකුරුට අයිතියි. කිරි හරක ආශ්‍රිතව ගොවිතැන් බත් කරල ලබාගන්න කිරි, අස්වැන්න ආදියෙන් ලැබෙන සශ්‍රීකත්වය දාන මාන දීම්, පින් දහම් කිරීම් වගේ යහපත් දේට යොදා ගත්තොත් ඒකෙන් යහපතක්ම ලැබෙනවා. ඒ ලැබෙන සම්පත්තිය සමාජයට අයහපතක් වෙන විදිහට යෙදුවොත් අයහපත් පැත්ත ලැබෙනවා.

මිථුන කියන්නෙ මෛථුනය. ඒ කියන්නෙ ස්ත්‍රී පුරුෂ සම්බන්ධය. ඒකත් අනාචර විදිහට කළොත් එහෙම අයහපත් පැත්තට හිටිනවා. ආචාර ධර්මවලට ගැලපෙන විදිහට ශිෂ්ට විදිහට කළොත් යහපතට හිටිනවා. උදාහරණ විදිහට යහපත් විදිහට සම්බන්ධ වීමෙන් පින් දහම් වගේ යහපත් දේවල් සහයෝගයෙන් සිද්ධ කිරීම තුළින් විශාල සම්පත්තියක් ලබන්න හේතු වෙනවා. ඒක ලෞකික වගේම ලෝකෝත්තර දියුණුවටත් හේතු වෙනවා.

සිංහ ලග්නයෙන් පෙන්වන්නෙ නායකත්වය, අධිපති බව. යහපත් දේකට අධිපති වුනොත් ඒකෙන් තමන්ටත් සමාජයටත් යහපතක්මයි සිද්ධ වෙන්නෙ. උදාහරණ විදිහට යම් කිසි විශේෂ පිංකමක නායකත්වය අරගෙන පිරිස මෙහෙයවල ඒ කටයුත්ත සාර්ථකව නිම කළොත් යහපතටම හේතු වෙනවා. ඒ වගේම හොරු රැළකට නායකත්වය දීල මෙහෙයෙව්වොත් තමන්ටත් අනුන්ටත් අයහපතක්ම සිද්ධ වෙනවා.

ඊළඟට කන්‍යා ලග්නය ගත්තත් දෙයාකාරයි. අවිද්‍යා සගහත පොදු වැඩපිළිවෙල මීට පෙර විග්‍රහ කළා. ලෝක සම්මතයේ හොඳ පැත්ත ගත්තම ලයාන්විත බවක්, යටහත් පහත් බවක් තමයි පෙන්වන්නෙ. ඒ කියන්නෙ දැඩි ගති ඇතිව නැගී හිටින කෙනෙක් නෙවෙයි. සමහරු ඉන්නවා, කවුරුහරි ගැහුවොත් බැන්නොත්, පෙරලා ගහමරා ගන්න යනවා. එතකොට ඒ පුද්ගලයා කන්‍යා ලග්නයට ගැලපෙන්නෙ නෑ. ඒ වගේම සමහරවිට කන්‍යා ලග්නයෙන් උපන් බයගුල්ලොත් ඉන්න පුළුවන්. ඒ වගේ අයත් අනිත් අයට සැඩ පරුෂ වෙන්න යන්නෙ නෑ, යටත් වෙලා ඉන්නවා. ඒ වගේම ඒ ගති ලක්ෂණය අන්‍යයන්ගෙ හිත සන්සුන් කරන්න, චිත්ත ප්‍රසාදය ඇති කරන්න යොදා ගන්න අයත් ඉන්න පුළුවන්. ඒ නිසා ඒ වගේ අයත් අනුන්ට සැඩ පරුෂ වෙන්නෙ නෑ. හැබැයි ඒ බය නිසා නෙවෙයි. මේ තුන් කොටසම කන්‍යා ලග්නයේ ඉන්න පුළුවන්.

දැන් කෙනෙකුට ගැටළුවක් එන්න පුළුවන්, රාජ්‍ය පාලනයට සම්බන්ධ වෙච්ච කන්‍යා ලග්නයෙන් උපන් සමහර නායකයන්ගෙ ස්වභාවය මේකට කොහොමද ගලපන්නෙ කියල. ඒ වගේ රාජ්‍ය නායකයන්ගෙ පොදු ස්වභාවයක් තමයි මොනව හරි පැත්තකින් ජනතාවගෙ හිත ඇද ගැනීමට සමත් වීම. එහෙම හිත ඇදෙන්නෙත් ඒ අයගෙ මොනව හරි ගති ලක්ෂණයක් දැකල. එහෙම නැතිව සියල්ලටම ජනතාවගෙ හිත ඇදෙන්නෙ නෑ. කන්‍යා කියන ලක්ෂණයේ තියෙන වසඟතාවය නිසා තමයි එහෙම වෙන්නෙ. ඒ නිසාම පුද්ගලයා දැක්කම මොනව හරි වසඟතාවයක් පෙන්වනවා, මේ වැඩේට හොඳයි කියල හිතෙනවා. ඒ නිසා කන්‍යා ලග්නයෙන් උපන් අය හොඳට හෝ නරකට රාජ්‍ය නායකත්වයට වුනත් තේරී පත්වෙන්න පුළුවන්. ඒකට විශේෂ හේතුව තමයි, මේ පුද්ගලයා අපිට හොඳයි මොකද බැන්නට බනින්නෙ නෑ, ගැහුවට ගහන්නෙ නෑ, හොඳ ඉවසීමක් තියෙනවා, ඕන දුක් කරදරයක් විඳ දරාගෙන ඉන්නවා කියන ස්වභාවයක් පෙන්වීම. ඒක එක පැත්තකින් කන්‍යා ස්වභාවයක්. දුක් කරදර බොහොමයක් ඉවසන්න පුළුවන්. ඒ ☞

වගේම සමහර බැගෑපත්ව ඉන්න අය දාසයෙකුට හොඳයි කියල ගන්නවා. ඒ වගේ අයට ඒ ගති ස්වභාවයෙන් හොඳ තැනක් ලැබෙනවා.

ඒ වගේම නරක පැත්ත බැලුවොත් මේ විදිහට විග්‍රහ කරන්න පුළුවන්. යම් කිසි විදිහකට ලෝකයට හොඳක් කරනව දැක්කොත් අසාධාරණ කරන්න හොඳ නෑ, යහපතක් කරන්න ඕන කියන අදහසේ මුලින්ම ඉන්නවා. එතකොට මිනිස්සු හිතනවා මේ පුද්ගලයා හරි සාධාරණයි, මොහුට තැනක් දෙන්න ඕන කියල. අන්න එහෙම මිනිස්සුන්ට හිතෙන අදහස් අනුව තමයි වැඩි ජනප්‍රසාදයක් ලැබිල ඒ පුද්ගලය රටක නායකත්වයට වුනත් පත් වෙන්න හේතු වෙන්නෙ. ඒ ආකල්පයන් අනුව ඒ පුද්ගලය කොච්චර හරි ඒකට වශීකෘත වෙනවා. අනිත් අයට ඒ පුද්ගලයා ඒ සඳහා හොඳයි කියල පේනවා. හැබැයි ඒ තැනට පත්වුනාට පස්සෙ, අවස්ථාවෙන් ප්‍රයෝජන අරගෙන ඒක තමන්ගෙ වාසියට විතරක් යොදාගන්න අයත් ඉන්න පුළුවන්.

එතකොට මේ කන්‍යා ලග්නයේ ස්ත්‍රී ගති ලක්ෂණ කියන්නෙ ලෝකයා දකින එක පැත්තක් විතරයි. ඒ නිසා සමහර පිරිමි අයටත් ගැහැණු වගේ කියල කියනවා. ඒ මොනව කිව්වත් ඒ අයට කිසි ගානක් නෑ, නිකන් ඔතැනි විදිහට ඉන්නවා. නමුත් කෙනෙක්ගෙ තියෙන හොඳ ගති ලක්ෂණයක් නිසාත් එහෙම ඔතැනි විදිහට ඉන්න පුළුවන්. හැබැයි ලෝක සම්මතයෙදි ඒක ස්ත්‍රී ගති ලක්ෂණයක් කියල මිනිස්සු තමන්ගෙ දෘෂ්ඨියට අනුව කියන්න පුළුවන්. නමුත් ඒ පුද්ගලයගෙන් ඇහුවොත් ඔබ එහෙම ඉන්නෙ ඇයි කියල, අර දෘෂ්ඨියට ගැලපෙන උත්තරයක් නෙවෙයි ඒ පුද්ගලය දෙන්නෙ.

මම ඔය ගහ මරා ගන්න කැමති නෑ, මම කැමති නෑ රණ්ඩු වෙන්න, මට ඕන සාමයෙන් ඉන්න. මෙන්න මේ වගේ අදහසක ඒ පුද්ගලයා ඉන්නව මිසක් බැරි කමකට නෙවෙයි. සමහරවිට පුංචි ළමයෙක් ගහන්න එන්නත් පුළුවන්. ඒත් ඒ පුද්ගලයා කැමති නෑ ළමයට ටොක්කක්වත් අනින්න. ආදරයෙන් සතුටින් කතා කරන්න තමයි කැමති. නමුත් බල්ල වගේ මටත් නැමුණනේ කියල පොඩි එකා යන්න පුළුවන්. එතකොට ඒ පුද්ගලයට ඕන, කෙනෙක් තරහ කරගන්න නෙවෙයි, හොඳින් තියාගන්න. මේ කන්‍යා ලග්නයේ එක ස්වභාවයක්. නරකට හෝ හොඳට පුද්ගලයෙකුට ආදරය කරල ප්‍රිය මනාප කරල නැඹුරු කරගන්න බලනවා. කන්‍යා ලග්නයෙන් උපන් පුද්ගලයෙක් ඒ ගති ස්වභාවය උපයෝගී කර ගෙන තවත් කෙනෙක් ධර්මයෙන් යහපත් පැත්තට ගත්තොත්, ඒ පුද්ගලයා යහපත් විදිහට කටයුතු කරල ධර්මානුකූල පැත්ත හුරු පුරුදු කරගත්ත කෙනෙක් වෙනවා. දේශපාලනය වගේ පැත්තකින් ගියොත් පාලන අංශයෙන් ලෝකයට ප්‍රිය මනාපයක් පෙන්වල ඒකෙන් නායකත්වයට පත් වෙන්නත් පුළුවන්. දාස මට්ටමින් ඉන්නව නම්, බොහොම හොඳට බැල මෙහෙවරකම් කරල ඒ පැත්තෙන් තැනක් දිනා ගන්න පුළුවන්. එතකොට හාම්පුතාට ඒ පුද්ගලයා ප්‍රියමනාපයි. මේ විදිහට මොනව හරි ලැබිච්ච පැත්තෙන් ප්‍රිය මනාප වෙනවා.

ඊළඟට තුලා ලග්නයෙන් පෙන්වන්නෙ හැම වෙලේම සංසන්දනාත්මකව කිරල මැනල හොයල බලන ගති ලක්ෂණය. බඩු භාණ්ඩ කිරුම් මිනුම් විතරක් නෙවෙයි, සමාජයේ යම් කිසි වැඩ කටයුත්තක් කරන හැම අවස්ථාවකදිමත් මේ ස්වභාවය අදාල වෙනවා. ඒ කියන්නෙ වාසි වෙන විදිහට, වඩාත් ඵල ප්‍රයෝජන ලැබෙන විදිහට තුලනය කරල පිරිස මෙහෙයවල කටයුතු කිරීම. එතකොට ඒකත් සමාජයේ යහපතට හේතු වෙන විදිහට තුලනය කරල තමන්ට ලැබිච්ච අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න පුළුවන්. යම් කිසි තනතුරක් වුනත් තමන්ගෙ පෞද්ගලික වාසි තකා යොදවන්නෙ නැතිව, සුදුස්සාට සුදුසු තැන දීල සුදුසු දේ පොදුවේ හැමෝගෙම යහපතට හේතු වන විදිහට තුලනය කරල යෙදවීමෙන් යහපතට හේතු වෙනවා.

වෘශ්චික ලග්නයෙන් පෙන්වන්නෙ ගෝනුස්සගෙ ගති ස්වභාවය. ඒකත් කූජට අයිතියි. අයහපත් පැත්තට යොදා ගන්න හැටි මීට කලින් විග්‍රහ කළා. කාට හරි කඩු පිහි අරගෙන ගහල මරල හරි තමන් ජයගන්න නුසුදුසු විදිහට ගවේෂණය කළා නම් ඒක තමයි ගෝනුසු කියන ගති ලක්ෂණයේ නරක පැත්ත. ඒ වගේම තමන්ගෙ තියෙන ඒ සැඩ පරුෂ ගති ලක්ෂණය යහපත් පැත්තට යොදා ගන්නත් පුළුවන්. උදාහරණ විදිහට රාජ්‍ය පාලනයෙදි අසත් පුරුෂයන් පාලනය කරල සමාජයේ ජීවත් වෙන යහපත් අයට බියෙන් සැකෙන් තොරව ජීවත් වෙන්න පරිසරය උදා කරල දුන්නොත් ඒක තමන්ගෙත් අනුන්ගෙත් යහපතට හේතු වෙනවා.

ධනු ලග්නයේ සංකේතය තමයි දුන්න. ඒ කියන්නෙ හොඳට සියුම්ව හිතල බලල යමකට හොඳට හෝ නරකට විදින ගති ලක්ෂණය. හොඳ දේට විදල හොඳ දේ විනාස කළොත් ඒක අයහපතට යෙදෙව්ව වෙනවා. ඒ වගේම හොඳට හිතල බලල සැලසුම් කරල සමාජයට වින කරන යමක් විනාස කරන්න ඒ හැකියාව යෙදෙව්වොත් ඒක යහපතට හේතු වෙනවා. උදාහරණ විදිහට රහස් පරීක්ෂණවලට දක්ෂ කෙනෙකුට සියුම්ව හොඳට හිතල බලල ඒක තමන්ගෙ පෞද්ගලික වාසියට, එහෙම නැත්නම් සමාජයට විනාසයක් කරන්න යොදා ගන්නත් පුළුවන්. ඒ වගේම ඒ හැකියාව තමන්ගෙත් සමාජයේත් යහපතට හේතු වෙන දේකට යොදා ගන්නත් පුළුවන්. ඒකත් අර වගේම පිං පවු දෙක අනුව තමයි ක්‍රියාත්මක වෙන්නෙ.

මකර ලග්නය ගත්තම, මමත්ත්වයෙන් මා කරා ඇදී එන වැඩ පිළිවෙලක් තමයි දියත් කරන්නෙ. ඒ කියන්නෙ මමත්ත්වය මුල් කරල, එකතු කරන්න ගොඩ ගහ ගන්න ගියාම ඒක අයහපත් පැත්තට හිටිනවා. හැබැයි සාධාරණ විදිහට තමන්ගෙ හැකියාවෙන් තමන්ට ලැබිය යුතු දේ තමා කරා එකතු කර ගෙන, ඒක අනුන්ගෙත් යහපතට යොදවල පින් දහම් ආදී කටයුතු සිද්ධ කළොත්, මා කරා එකතු කරගත්ත දේ යහපතට යෙදෙව්ව වෙනවා.

කුම්භ ලග්නයෙන් පෙන්වන්නෙ කළ ගෙඩියෙ ස්වභාවය. තමන්ගෙ වාසියට නරක දේවල් කරල හරි හම්බ කරල කළ ගෙඩිය පුරව ගෙන තමන්ට සම්පත්තියක් ලබාගන්න පුළුවන්. හැබැයි ඒක මතු විනාසයට හේතු වෙනවා. ඒ වගේම යහපත් දේවල් කරල එකතු කර ගත්තු පුරව ගත්තු දෙයින් යහපතක්ම සිද්ධ වෙනවා. ඒ විදිහට ලැබිච්ච සම්පත්තිය අනුන්ගෙත් ඵල ප්‍රයෝජනයට යෙදෙව්වොත් ඒක තව තවත් යහපතට හේතු වෙනවා.

ඊළඟට මීන ලග්නයෙන් පෙන්වන්නෙ මාළුවා. සංසාර සාගරයේ පිහිනීමට ඒක උපමා කරනවා. එතනදිත් යහපත් දෙයක් අල්ල ගෙන හොඳ පැත්තට පීනුවොත් යහපතක්ම වෙනවා. ඒකෙන් අවසානයේ ලෝකෝත්තර වූ නිවන් සුවයත් ලබාගෙන ලෝකයෙන් එතෙර වෙන්න පුළුවන්. එහෙම නැත්නම් දිව්‍ය බ්‍රහ්ම ලෝක වගේ සුගතිවලට යන්න පුළුවන්. ඒ වගේම අයහපත් දෙයක් අල්ල ගෙන පීනුවොත් විනාසය කරා යන්න පුළුවන්. මේ විදිහට හැම ලග්නයකින්ම උපන් කෙනෙකුට ප්‍රධාන වශයෙන් හොඳ නරක මුල් කර ගෙන පිහිටන පැති 2 ක් තියෙනවා. ඒ අනුව තමයි ඒ ඒ ගති ලක්ෂණ තීරණය වෙන්නෙ.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

සටහන
**නීතිඥ චන්දන සිරිවර්ධන**

# ආමාශය ඇතුළු බඩ වැලේ තුවාල සහ කොඳු ඇට පෙලේ ආබාධ සුව කරන ප්‍රත්‍යක්ෂ ඖෂධයක්

මහ බඩ වැල ඇතුළු ආහාර මාර්ග පද්ධතියේ කපල ඉවත් කරන්න තරම් බලවත් තුවාලවලින් පීඩා විඳින අයටත්, ඇඟ පත හරවන්න බැරිව තුනටියේ අමාරුකම්වලින් පෙළෙන අයටත් ඉතා වටිනා ප්‍රත්‍යක්ෂ ඔසුවක් තමයි මේ හෙළිදරව් කරන්නෙ. මීට පෙර හෙළිදරව් කළ ආකාරයටම වහරක අභයරතනාලංකාර හිමියන් බේත් සමාධියෙන් හසු කර ගත් මේ ඖෂධයත් ඉතා ප්‍රත්‍යක්ෂ බවට දැනටමත් අත්දැකීම් ලබල තියෙනවා.

ආහාර මාර්ග පද්ධතියේ තුවාල එන්නෙ බොහෝ කොටම මොනව හරි විසක් එක්ක. ඒ විස මේ ඖෂධයෙන් කැපෙනවා. එතකොට කොඳු ඇට පෙළේ රැඳෙන විස හිර වෙලා තමයි ඇඟ පත හරවන්න බැරි වෙන්න කැක්කුම් එන්නෙ. ඒ විසත් ඇදල අරගෙන අන්තිමට බඩ වැලට යවනවා. ඒ නිසා මේ ස්ථාන දෙකේම ඇති ආබාධ සුව වෙන්න මේ ඖෂධය හේතු වෙනවා.



මේ ඖෂධයට යොදා ගන්නෙ වේලපු රත් මල් ග්‍රෑම් 250 ක්, වේලපු රතු හෝ සුදු නෙළුම් රේණු ග්‍රෑම් 250 ක් සහ අමු හීන් උඳුපියලිය ග්‍රෑම් 500 ක්. හැබැයි මේ කිව්වෙ අනුපාතයක්. ඒ කියන්නෙ රත්මල් සහ නෙළුම් රේණු සාමානුපාතිකවත්, ඒ වගේ දෙගුණයක් හීන් උඳුපියළියත් එන විදියට තමයි අනුපාතය ගන්න ඕන. ඒ වගේම රත් මල් සහ නෙළුම් රේණු කියන දෙවර්ගය වේලපුවත්, හීන් උඳුපියළිය අමුවෙනුත් තමයි ගන්න ඕන. මෙතනදි වේලපුව සහ අමුව කිව්වමත් වෙනසක් තියෙනවා. වේලපු එක කොටසක ඖෂධ ගුණය තමයි අමුව තුන් කොටසක තියෙන්නෙ. ඒ නිසා අමුවෙන් ගන්නව නම් වේලපුව වගේ තුන් ගුණයක් ගන්න ඕන. උදාහරණ විදිහට මෙතනදි නෙළුම් රේණු අමුවෙන් ගන්නව නම් ග්‍රෑම් 750 ක් ගන්න ඕන. එතකොට ඒ වෙනස නැති වෙනවා. නමුත් නෙළුම් රේණු අමුවෙන් ගැනීම අපහසුයි. මොකද බලා ඉඳෙද්දි වේලෙනවා. එහෙම නැත්නම් එවෙලෙම කඩපු නෙළුම් මල්වලින්ම ගන්න ඕන. හැබැයි වේලපුවයි අමුවයි කියල මෙතනදි ඖෂධ ශක්තියේ වෙනසක් වෙන්නෙ නෑ. නමුත් මෙතනදි අමු කොටස් 3 ක් වේලුවොත් තමයි එකක ඖෂධ ශක්තිය එන්නෙ. හැබැයි සමහර ඖෂධ සංයෝග කරන කොට වේලපුව : අමුව 1 : 3 අනුපාතයට නෙවෙයි, 1 : 10 අනුපාතයට ගන්න අවස්ථාත් තියෙනවා. ඒ ඒ වර්ගවල හැටියට ඒක වෙනස් වෙනවා. මෙතනදි වේලපු : අමුව ඖෂධ මිම්ම 1 : 3 ක්.

එතකොට ඉස්සෙල්ලම අමු හීන් උඳුපියළිය කොටල වේලල ඉස්ම ටික විතරක් පෙරා ගන්න ඕන. කොටන කොට හොඳට උණු කරල නිවා ගත්තු වතුර ටිකක් දැම්මොත් ඉස්ම ගන්න වඩාත් පහසුයි. මේ උණු කරල නිවා ගත්තු වතුර ගැනීමෙත් විශේෂත්වයක් තියෙනවා. ඇල් වතුරට වායුව සම්බන්ධයි. ඒ කියන්නෙ ඇල් වතුරේ ඔක්සිජන් ඇතුළු වායු මිශ්‍ර වෙලා තියෙනවා. එතකොට මේ ඖෂධ හදන කොට ඇල් වතුර දැම්මොත්, ගුලි හදල වේලන කොට ඒ වායු මිශ්‍රණයත් එක්ක සංයෝග වෙලා මේකෙ තියෙන සියුම් ඖෂධ ශක්තිය පිට වෙලා යන්න පුළුවන්. නමුත් වතුර පැහෙන්න උණු කළාම ඒකෙ තියෙන ඔක්සිජන් ඇතුළු වායුව පිට වෙලා යන නිසා, ඒකෙන් දිය කරල වේළුවම වායුවත් එක්ක යන කොටස පිට වෙන්නෙ නෑ. එතකොට ඖෂධ ශක්තිය ඉතිරි වෙනවා. මේ ක්‍රමය ඒ හදන බේත් වර්ගය අනුව වෙනස් වෙනවා. ඒ නිසා සමහර බේත් වර්ග හදද්දි විතරයි ඒ විදිහට උණු කර ගෙන නිවා ගත්තු වතුර ගන්නෙ. දැන් ඒ විදියට එන ඉස්මෙන් අර රත් මල් සහ නෙළුම් රේණු අඹර ගෙන ඒ එන මිශ්‍රණයෙන් කෝපි ගෙඩි තරමේ ගුලි හදා ගෙන වේල ගන්නවා.

මේ විදියට හදා ගත්තු ගුලි පැය 6 කට එක බැගින්, ඒ කියන්නෙ දවසකට 4 වතාවක් මාස 3 ක් විතර පාවිච්චි කරනවා. ඊට වැඩි කාලයක් පාවිච්චි කළත් කමක් නෑ. මොකද කිසිම අතුරු ආබාධයක් හෝ විසක් නෑ. ඒ වගේ ගුලියක් ගිලල නටවා නිවා ගත්තු හෝ රස්නෙට තියෙන උණු වතුර ටිකක් බිව්වම ප්‍රමාණවත්. ඒ විදියට මේ ගුලි පාවිච්චි කරන කල්ම උණු වතුර තමයි පානය කරන්න ඕන. වෙනත් සිසිල් බීම වර්ග වුනත් පාවිච්චි නොකර ඉන්නව නම් වඩා හොඳයි. නමුත් ඇල් වතුර නැවට කමක් නෑ. කෑම බීමෙන් විශේෂ ප්‍රවේසම් වීමක් අවශ්‍ය නැති වුනත්, මේ බේත පාවිච්චි කරන කාලය තුළ අච්චාරු, බල කරවල වගේ උෂ්ණ ආහාර වර්ග ගැනීමෙන් වළකින්න ඕන. ඒ විදියට මාස 3 ක් විතර පාවිච්චි කරන කොට රක්ත උෂ්ණය, පිත් විස වීම්, අම්ල පිත්ත ප්‍රදාහය ආදිය නිසා ආහාර මාර්ග පද්ධතියේ හට ගත් තුවාලත්, තුනටියේ කැක්කුම් ආදියත් සුව වෙනවා.

සටහන
**නීතිඥ චන්දන සිරිවර්ධන**

# යහපත් දිවියකට

**5 වන කොටස**

සංඛතයන්ගේ උදයංගම, අත්තංගම, ආස්වාද, ආදීනව, නිස්සරණ අවස්ථා තතු සේ දැකීම නිවන් මගක්. තතු සේ කිව්වෙ නියම ආකාරයෙන් දැකීම. නියමයක් නම් වෙනස් වෙන්නෙ නෑ. වෙනස් නොවෙන නියම ආකාරය තමයි සිවු අරිසස් දහම් න්‍යාය, පටිච්ච සමුප්පාද දහම් රටාව. යමක් හට ගත්තා වූ හේතුවක් තියේ නම්, ඒ හේතුව නැවත උදා නොවෙන තත්වයට පත්වීම නිරෝධයයි කියන එකත් මීට පෙර පැහැදිලි කළා. නැවත උදා නොවන තත්වයට පත් කරන්න නම්, උදා වුණ හේතුව දැකල ඒ හේතුව ඉවත් කරන්න ඕන.

මොනවා හරි බීජයක් තියෙනවා. උදාවෙන ශක්තිය ඒ බීජය තුළ ගැබ් වෙලා තිබුණට, පැළයක් උදා වෙන්නෙ නෑ. ඒකට ජලය, පොහොර, පස්, හිරු එළිය, වාතාශ්‍රය ලැබෙන්න ඕන. ඒ වගේ, කර්ම බීජ තිබුණට සුදුසු පරිසරයක් සකස් වුණේ නැත්නම් සංඛතයක් උදා වෙන්නෙ නෑ. ප්‍රරෝහණ ශක්තිය කියන, බීජය පැළවීමට කල් ඉකුත් නොවූ පැළවීමේ ශක්තිය හේතුවෙන්, ජලය කියන පරිසර සාධකය ලැබුණම බීජය මුල් අදිනවා. නමුත් පොහොර, පස්, හිරු එළිය, වාතාශ්‍රය කියන අනෙක් පරිසර සාධක නැති හේතුවෙන් මුල් ඇදපු බීජය මැරෙනවා. ඒ කියන්නෙ උදා වීමට තිබුණ හේතු සාධකවලින් උදා වුණා. හැබැයි උදා වුණ හේතු සාධකවලින් අත්තංගම වෙන්නෙ නෑ. අත්තංගම වෙනව කියන්නෙ, අවශ්‍ය අංග වැඩෙනවා කියන එක. බීජයකට නම් මුල් ඇද්දට පස්සෙ පොහොර, පස්, හිරු එළිය, වාතාශ්‍රය ලැබුණම ඒ හේතුවෙන් ඒ පැළයේ කඳ, අතු, කොළ ආදිය වැඩෙනවා. ඒ තමයි බීජයේ අත්තංගම අවස්ථාව.

කර්ම බීජයක් නම්, පෙර සසරෙදි ප්‍රාණඝාත අකුසල කරල නැති, අනෙක් සත්වයින්ගෙ ජීවිත පැවැත්මට උපකාර කරල තියෙන, දාන ආදී පින්කම් කරල තියෙන හේතුවෙන් තමයි කයක් ගොඩ නගා ගන්න පුළුවන් පරිසරයක් ගොඩ නැගෙන්නෙ. **නිවන් මගට නොපැමිණි සත්වයන් අතරේ ප්‍රාණඝාත අකුසල කර්ම නොකරපු සත්වයෙක් නෑ.** නමුත් ඒ අකුසල විපාක ගෙවුනම තමයි, කරපු පින් දහම් මතු වෙලා සුදුසු පරිසරයක් සකස් වෙන්නෙ.

පැළයක් ගත්තම කිසියම් අවස්ථාවකදි ජලය, පොහොර ආදිය කොච්චර දැම්මත් පැළය වැඩීම සීමා වෙනවා. ඊළඟට මල් හටගන්න පටන් ගන්නවා. දැන් අළුත් අතු, කොළ දානව අඩුයි. මල් පිපිල ගෙඩි, කරල් ආදියත් හට ගන්නවා. ආස්වාද අවස්ථාව උදා වෙලා. දැන් ගහ මගින් උරාගන්න ජලය, පොහොර යොදවන්නෙ ගෙඩි, කරල් මෝරන්න. ඒ හේතුවෙන් ගහේ වැඩීම බාල වෙනවා. ඒ තමයි ආදීනව අවස්ථාව. ආස්වාද විඳීමේ බලාපොරොත්තුව නිසා



ගොඩ නැගුණ ශක්තිය ක්‍රියාත්මක වීම හේතුවෙනුයි සුදුසු පරිසර සාධක ලැබිල ගෙඩි, කරල් හැදෙන ආස්වාද අවස්ථාව උදා වුණේ. ආස්වාද විඳින මට්ටමට සකස් වුණාම, ඒ ශක්තිය ගෙවිල අවසානයි. තව දුරටත් පවත්වාගෙන යන්න ශක්තිය නැති නිසා ටික කලකදි මල් පිපීමත්, ගෙඩි, කරල් හැදීමත් නවතිනවා. මේ තියෙන්නෙ ආස්වාද අවස්ථාවෙ නිස්සරණය හෙවත් නිස්සරණ අවස්ථාවේ උදාවීම. දැන් ගහේ කොළ අතු දිරල ගිහින් ගහ මැරෙනවා. ඒ තමයි සම්මුති මරණය, නැත්නම් නිස්සරණය. සංඛතයක් හැදුනොත් පටිච්ච සමුප්පන්නයි. ආස්වාද විඳීමේ බලාපොරොත්තුව, ඡන්දරාගය, ආස්වාදයට කැමැත්තෙන් බැඳීම හේතුවෙනුයි සංඛත ගොඩ නැගෙන්නෙ.

මේ විදියට අපේ ජීවිතවලත් උදයංගම, අත්තංගම, ආස්වාද, ආදීනව, නිස්සරණ අවස්ථා තියෙනවා. උපතක් ලබන්න හේතුකාරක වන කර්මයක් (ජනක කර්මයක්) හේතුවෙන් විඤ්ඤාණයක් හට ගන්නවා. (සංඛාර පච්චයා විඤ්ඤාණං) මේ විඤ්ඤාණය කියන කර්ම බීජයේ ජාතියක් ගොඩ නැගෙන ශක්තිය තිබුණට, බීජයට මුල් අදින්න ජලය සාධකයක් වුණා වගේ, විඤ්ඤාණයට උදාවීම සක්‍රිය වෙන්න සුදුසු මවු ගැබක කළලයක් ලැබෙන්න ඕන. අඹ ගහක් හැදෙන ආකෘතිය/ සැලැස්ම අඹ බීජය තුළ සකස් වෙලයි තියෙන්නෙ. ඒ කියන්නෙ උදයංගම අවස්ථාව ආරම්භ වෙලා. ජලය ලැබුණම ඒක ක්‍රියාත්මක වෙනවා. මේ වගේ කර්ම විඤ්ඤාණය තුළ උදාවන සංඛතයේ ආකෘතිය ගැබ් වෙලා තියෙන්නෙ. සුදුසු ගැබක කළලයක් සමග සම්බන්ධ වීමෙන් ඒ ආකෘතියට අනුරූප සංඛතය ගොඩනැගීම ආරම්භ වෙනවා, උදයංගම අවස්ථාව සක්‍රීය වෙනවා.

මේ කාරණා හොඳින් විමසල බැලුවම උදයංගම අවස්ථාව කියන එකත්, එක මොහොතක සිදුවීමක් නෙවෙයි. මොහොතින් මොහොත ගෙවී ගෙවී ගොඩ නැගෙන සකස් වීමක්. ඒ ගෙවී ගිය මොහොතක් නැවතත් උදා වෙන්නෙ නෑ. ඒ කියන්නෙ මොහොතක් පාසා සිදුවන සකස් වීම තුළත් මේ අවස්ථා 5 තියෙනවා. මිනිස් දරුවෙක්ගෙ උදයංගම අවස්ථාවෙ මේ අවස්ථා 5 බැලුවොත්, කර්ම විඤ්ඤාණයක් සකස් වීම පෙර භවයෙදි සිදුවීමක්. ඒ අවස්ථාව උදයංගම අවස්ථාව. සුදුසු ගැබක කළලයක් එක්ක සම්බන්ධ වෙලා සළායතන ගොඩනැගීම අත්තංගම අවස්ථාව. දස මසක් ගැබ තුළ හිරවෙලා ඉඳල බිහි වීම ආස්වාද අවස්ථාව. බිහි වෙලා බලාපොරොත්තු වුනේ කැමති හැටියට ආස්වාද විඳින්න. ඒ වුනාට බඩගිනියි, කාටවත් කියන්නවත් තේරෙන්නෙ නෑ. මළ මුත්‍ර පහවුනත් තනියෙන් පිරිසිදු කරගන්න බෑ, කාගෙ හෝ පිළිසරණක් නැතිව කිසිවක් කරගන්න බෑ. දැන් ඒකෙ ආදීනව අවස්ථාව. අවුරුදු දෙක තුනක් ගතවෙලා දැන් තනියම ඇවිදිනවා, තමන්ගෙ වැඩ කරගන්නවා. දැන් උදාවෙලා ඉවරයි. උදයංගමය නිස්සරණයයි. උදයංගමයේ නිස්සරණය දෙවන ප්‍රධාන අත්තංගමයේ උදාවීම වෙනවා. අභිධර්මයට අනුව එක චිත්ත වීථියකත් මේ අවස්ථා 5 ☞

තියෙන බව පෙන්වනවා. කර්ම භවයක් හට ගැනීමට හේතු කාරක වන කර්ම රැස් කළේ නැත්නම් කර්ම විඤ්ඤාණ හැදෙන්නෙ නෑ. විඤ්ඤාණ නැත්නම් පටිච්ච සමුප්පාදය ක්‍රියාත්මක වෙලා භවයක් හැදෙන්නෙ නෑ.

ලෝක සම්මතයේ හැටියට යම් කිසිවක් තතු සේ දැනගන්නව කියන්නෙ, ඒ දේ ගැන විස්තර තොරතුරු දැන ගන්නව කියන එක. බුදු දහමේ සෙවිය යුතු දේ, දැන ගත යුතු දේ කියන්නෙ සිවු අරිසස්, පටිච්ච සමුප්පාදය. සිවු අරිසස්වලින් පෙන්වන්නෙ, මේ දුකයි (දුක්ඛ ආර්ය සත්‍යය), මේ දුකට හේතුවයි (දුක්ඛ සමුදය ආර්ය සත්‍යය), මේ දුක නැති කිරීමයි (දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය), මේ දුක නැති කරන මගයි (දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය). උදයංගම කියන එක මේ හතරට සම්බන්ධ කරල බැලුවම මේ උදයංගමයයි, මේ උදයංගමයට හේතුවයි, මේ උදයංගමය නැති කිරීමයි, මේ උදයංගමය නැති කරන මගයි. අවිද්‍යාවෙන් සංඛාර ගොඩ නැගීම උදයංගමය. උදයංගමයට හේතුව අවිද්‍යාව. උදයංගමය නැති කිරීම කියන්නෙ අවිද්‍යා නිරෝධය. අවිද්‍යාව නිරෝධ කරන මාර්ගය හෙවත් ආර්ය අෂ්ඨාංගික මාර්ගය තමයි උදයංගමය නැති කරන මග.

මනුස්සයෙක් උදාහරණ විදියට අරගෙන බැලුවොත්, පටිසන්ධියෙන් පටන් ගෙන මවු ගැබකට ඇවිත්, මවු ගැබින් බිහි වන තෙක් කාලය උදයංගමය. එතැන් පටන් ගෙන අවුරුදු 16 ක් පමණ යන කල් වැඩෙන කාලය අත්තංගමය. අවුරුදු 16 වයසෙ පටන් ගෙන තරුණ වයසත් පසු කර ගෙන මැදි වයසට යනකල් ආස්වාදය. මැදි වයසෙ පටන් මහළු වයස වෙනකල් ආදීනවය. අවසානයෙදි සිදු වන මරණය තමයි නිස්සරණය. තවත් විදිහකට පහදනව නම්, අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංඛාර හැදිල, ඒකෙන් පටිසන්ධි විඤ්ඤාණය හැදෙන කල් උදයංගම අවස්ථාව. එතැන් පටන් විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාම රූප හැදීම අත්තංගම අවස්ථාව. ඊළඟට නාම රූපවලින් සළායතන හැදිල ස්පර්ශ, වේදනා, තණ්හා හට ගැනීම ආස්වාද අවස්ථාව. ඊළඟට උපාදාන, භව, ජාතිය ඇතිවීම ආදීනව අවස්ථාව. අන්තිමට ජරාවට, මරණයට පත්වීම නිස්සරණ අවස්ථාව. මේ විදිහට විවිධාකාර අවස්ථාවන් අරගෙන මේ කාරණය පහදන්න පුළුවන්. මොහොතක්වත් එකාකාරව නොපවතින සංඛතයක්, කැමති සේ පවත්වා ගෙන ආස්වාද විඳීමේ බලාපොරොත්තුව අත්හැරීමෙන් හෙවත් ආස්වාද විඳීමේ බලාපොරොත්තුව අත හැරීම හේතුවෙන්, ඡන්ද රාගයෙන් ඇස, කන, නාසය, දිව, කය, මන කියන ඉඳුරන්ට ගෝචරවන අරමුණු එක්ක ඇලෙන්නෙ, ගැටෙන්නෙ, මුලාවෙන්නෙ නැතිව, සිතේ කෙළෙස් මළ දුරු කිරීමෙන් උදයංගමය හෙවත් උදාවීම නිරෝධ වෙනවා.

උදාහරණයකින් මේ ටික තෝර ගන්න පුළුවන්. පටි+ඉච්ච+සම+උප්පාද තමයි පටිච්ච සමුප්පාද කියන්නෙ. පටි කිච්චෙ බැඳීම. ඉච්ච කියන්නෙ කැමැත්ත. සම+උප්පාද කියන්නෙ සමාන උපතක්. යම් දෙයකට කැමැත්තෙන් බැඳුනද, ඒ කැමති වූ දේට සමාන උපතක් හට ගන්නවා. බුදුවරු ලෝකයට පහළ වුනත් නැතත් මේ ධර්මය මේ විදිහටමයි, වෙනස් වෙන්නෙ නෑ. බොහොමයක් තැන්වලදි, හැම දේම අනිත්‍යයි, වෙනස් වෙනවා, අනිත්‍ය නිසා දුකයි .... ආදී වශයෙන් අහන්න ලැබෙනවා. නමුත් පටිච්ච සමුප්පාද ධර්මය වෙනස් වෙන්නෙ නෑ. ඒ විතරක් නෙවෙයි, මේ සත් තිස් බෝධි පාක්ෂික දහමම තමයි පෙර ලොව පහළ වූ බුදු පියාණන් වහන්සේලා දේශනා කරල තියෙන්නෙත්, මතු ලොව පහළ වන බුදු පියාණන් වහන්සේලා දේශනා කරන්නෙත්. වෙනස් නොවෙන මේ දහම ලෝක සත්වයාට තෝරා දෙන්නෙ, මතුකර පෙන්වා දෙන්නෙ බුදුවරු ලෝකයට පහළ වීමෙන්මයි. උන් වහන්සේලා මේ තුන් ලෝකය දැනගෙන, දැක ගෙන ලෝක සත්වයා කෙරෙහි අප්‍රමාණ දයානුකම්පාවෙන් මනුස්ස වෙලා ඉපදුන පිරිස විසින් කළ යුතු, නොකළ යුතු දේ, පිළිපදින්න ඕන දේ, බැහැර කළ යුතු දේ (සත් බස - යහපත් දේශනාව) දේශනා කළා.

ඒ සත් බස ඉවත දාල, ආස්වාද මායාවට මුලා වෙලා, යම් කෙනෙක් නොකළ යුතු දේට කැමැත්තෙන් බැඳිල කටයුතු කළොත්, බහ+ලු කියන සංඛාරයට අනුරූප බලු විඤ්ඤාණ හට ගන්නවා. පටිච්ච සමුප්පාද චක්‍රය ක්‍රියාත්මක වෙලා විඤ්ඤාණ පච්චයා නාම රූපං, නාම රූප පච්චයා සළායතනං......... උපාදාන පච්චයා භවෝ කියන ආකාරයට බලු විඤ්ඤාණයෙන් බලු භව හටගෙන, භව පච්චයා ජාති කියන බලු ජාතියේ උපදින්න හේතු කාරක වන කර්ම බීජ සකස් වෙනවා. ඊළඟට සම්මුති මරණයෙන් පස්සෙ බලු කයක් උරුම වෙනවා.

මේ ලෝක සම්මතයේ හරවත් වැඩ කියල කොටසක් තියෙනවා. උදාහරණයකින් පැහැදිලි කළොත් ගහ කොළ, ජලය වගේ සම්පත් සකස් වෙලා තියෙන්නෙ, පොදුවේ සියලු සත්වයින්ගෙ ප්‍රයෝජනය සඳහා. ඒ දේවල් එදිනෙදා ජීවිතය පවත්වා ගෙන යන්න තමන්ට උවමනා පමණට වැඩියෙන් යම් කෙනෙක් පරිභෝජනයට ගන්නව නම්, ඒ හේතුව නිසා අනෙක් සත්වයන්ගෙ පැවැත්මට ඒ දේ හිඟ වෙනවා, ඒ අයට අසාධාරණයක් කළා වෙනවා. උදාහරණයක් විදිහට විසාල ගහ කොළ තියෙන රක්ෂිත කැලෑ කියල කොටසක් වෙන් කරල තියෙන්නෙ, වන සිවුපාදී සතුන්ටත් ජීවත් වීමේ අයිතියක් තියෙන නිසා ඒ සතුන්ගෙත් ප්‍රයෝජනයට. ඒ වගේම එබඳු ස්වභාවික ගහ කොළ සහිත පරිසරයක් තියෙනව නම්, ජල උල්පත් ආරක්ෂා වෙලා පොළොවෙ ජලය රඳා ගැනීමකුත් සිද්ධ වෙනවා, පොළොව සශ්‍රීක වෙනවා. මේ රක්ෂිත වෙන් කරල තියෙන කාරණයේ හරය තේරුම් ගන්නෙ නැතිව, යම් කෙනෙක් මහා පරිමාණයෙන් ඒ ගහ කොළ හෝ සතා සිවුපාවා හෝ විනාශ කරනව නම් ඒකත් හරය කා දැමීමක්.

හරය කා දැමීමේ ක්‍රියාවකට යම් කෙනෙක් කැමැත්තෙන් බැඳිල කටයුතු කළොත්, සම්මුති මරණයෙන් පස්සෙ හරකා කියන ජාතියේ උපදින්න හේතු යෙදෙනවා, උදයංගම වෙනවා. උදයංගමය ආරම්භ වුනේ මිනිස් කය ඇසුරෙමයි. මනුස්ස වෙලා ඉඳල හරකෙක් වෙලා ඉපදෙන්න වෙනව නම්, ඇත්ත වශයෙන්ම දුකක්ද, සැපක්ද ? දුකක්මයි. කැමැත්තෙන් බැඳුනෙ මෙලොවදී සැප විඳින්න. නමුත් උරුම වුනේ දුකක්, අනිච්ච දෙයක්. මේ උදාහරණයේ හැටියට දුක්ඛ ආර්ය සත්‍යය කියන්නෙ, මේ වගේ කැමති නැති ජාතියක් උරුමවීම. රක්ෂිතයක් වෙන් කරපු හේතුව නොදැනීම හෝ දැන දැනත් ගණන් නොගැනීම තමයි (අවිදුවයි, තණ්හාවයි) දුක්ඛ සමුදය ආර්ය සත්‍යය හෙවත් දුකක් උදා වීමට හේතුව. යම් කිසි විදියකින් බුදු බණ අහල වරද වටහා ගෙන, හරය කා දමන වැඩ පිළිවෙල අත හැරීම තමයි දුක නැති කිරීම. ඒ වැඩපිළිවෙල අත හැරීම හේතුවෙන් හරකෙක් වෙලා මතු උපදින්න සංඛාර වැඩෙන්නෙ නැතිව යනවා. එතකොට හරකෙක් උදා වෙන්න කර්ම විඤ්ඤාණ හෝ පරිසරය හෝ සකස් වෙන්නෙ නෑ. ඒ දුකෙන් නිදහස් වෙනවා. මේ තමයි දුක නැති කිරීමේ මග හෙවත් දුක්ඛ නිරෝධ මාර්ගය. උදයංගම වීම නැති කළා. පටිච්ච සමුප්පාදයත්, සිවු අරිසස් දැකීමත් අනුව, මනුස්සයෙක් මරණින් මතු හරකෙක් වෙලා දුක් විඳින්න වෙනවද, ඒ දුක උරුම වුනේ මොන වැඩ පිළිවෙලක් නිසාද, ඒ දුක උදා වෙන එක නතර කරන්න පුළුවන්ද, ඒ කොහොමද කියල දුකක් උදයංගම වීම පිළිබඳව තතු සේ දැන ගන්න පුළුවන්. උදයංගමය නැති කරන පිළිවෙල දැන ගත්ත නම් ඊට පස්සෙ අත්තංගම, ආස්වාද, ආදීනව, නිස්සරණ අවස්ථා නැති කරන වැඩ පිළිවෙලත් ඒකමයි.

☞

අභය කියන වචනයේ එක තේරුමක් තමයි "බය නැති" කියන අදහස. අභය දානයක් දුන්නම අභය ලැබූ සත්වයාට බය නැති වෙනව නම්, ඒක අභය දානයක් වෙනවා. අද අභය දානය ලබන ගවයින්, මුළු ආයු කාලයම ජීවත් වුනත් මැරෙන මොහොතක් එනවා. ඒ මොහොතෙ මරණ බය එනවා. මනුස්සයෙක් හරකෙක් වෙන වැඩපිළිවෙල නතර කළේ සිවු අරිසස් දැකල නම්, ඒ පුද්ගලය සතර අපා බයෙන් සදහටම නිදහස්. මේ පටිච්ච සමුප්පාද දහම් න්‍යාය / සිවු අරිසස් වටහා දුන්නොත් වචනයේ පරිසමාප්ත අරුතින් නියම අභය දානයක් දුන්න වෙනවා. අඹ බීජය ඇතුළෙ අඹ ගහක් හැදෙන්න ඕන කරන ක්‍රම රටාව ගැබ් වෙලා තියෙනවා. අඹ බීජයෙන් කොස් ගහක් හෝ වෙනත් ගහක් හැදෙන්නෙ නෑ. අඹ ගහක්මයි හැදෙන්නෙ. මේ වගේ පුණ්‍ය බීජයකින් පුණ්‍ය විපාකයක්, පාප බීජයකින් පාප විපාකයක්මයි උදා වෙන්නෙ. සංඛාර පුණ්‍ය වේද විඤ්ඤාණ පුණ්‍ය වේ, සංඛාර පාප වේද විඤ්ඤාණ පාප වේ, සංඛාර ආනෙඤ්ඤාභිවේද විඤ්ඤාණ ආනෙඤ්ඤාභි වේ. මේ තමයි දහම් න්‍යාය.

මවු ගැබකට එන විඤ්ඤාණයේ ගති රුව ගැබ් වෙලා තියෙනවා. ධර්මයේ සඳහන් වෙන අහිංසක කුමාරයා, අංගුලිමාල සොරා, අංගුලිමාල රහතන් වහන්සේ කියන මේ අවස්ථා තුන එකම මිනිස් අත්බවයක අවස්ථා අනුව ප්‍රවෘත්ති පටිච්ච සමුප්පාදය ක්‍රියාත්මක වෙලා ගති ගුණයට අදාල ගති රුව මතු වීම පැහැදිලි කෙරෙන හොඳ උදාහරණයක්. සම්මුති මරණින් පස්සෙ ගති රුව වෙනස් වීමත් ඒ ඇසුරෙන් පිළිගන්න පුළුවන් වෙනවා.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**ඩබ්. ඒ. තිළිණවතී**
**විශ්‍රාමික මහජන බැංකු නිලධාරිනී - කඩවත**

# හෙළ බොදු පියුම දහම් සඟරාවේ 43 වන කලාපය සඳහා ශ්‍රමය හා මූල්‍යමය දායකත්වය සැපයූ පිංවතුන්

**ශ්‍රම දායකත්වය** -

♦ ධම්මික සේනාධීර මහතා - නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ ♦ අසංග මංජුල කුමාර මහතා - හෝමාගම ♦ සමන් සිල්වා මහතා - කළුතර ♦ චන්දන සිරිවර්ධන මහතා - අලපලාදෙනිය ♦ ෆික්රි ඉස්මයිල් මහතා - ගොතටුව ♦ එස්.එම්. ජයසේකර මහතා - මාලබේ ♦ ප්‍රසාද් ද සිල්වා මහතා - දෙල්ගොඩ ♦ ඩබ්.ඒ. තිළිණවතී මහත්මිය - කඩවත ♦ සාලින්ද ශ්‍රී ජයවර්ධන මහතා - මාලබේ ♦ පර්ෆෙක්ට් කම්පියුටර් ආයතනයේ කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ ♦ ඉමාෂි මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ♦ නන් අයුරින් දායක වූ පින්වතුන්

**මූල්‍යමය දායකත්වය** -

♦ ආසිරි වනිගරත්න මහතා සහ දීපිකා සන්දනායක මහත්මිය ඇතුළු පවුලේ සැම - මහරගම - රු. 15,000/- ♦ ජයන්ති අත්තනායක මහත්මිය ඇතුළු පවුලේ සැම - මෙල්බන් නුවර, ඔස්ට්‍රේලියාව - රු.13,500/- ♦ ප්‍රියනාත් ආරියරත්න මහතා ඇතුළු පවුලේ සැම - කුරුණෑගල - රු. 10,000/- ♦ සමන් සිල්වා මහතා - කළුතර - රු. 10,000/- ♦ තුසිත නාකන්දල මහතා, සරූපා නාකන්දල මහත්මිය, දෙවින්යා දුව - ගල්කිස්ස - රු. 10,000/- ♦ ශීලා පොඩිමැණිකේ මහත්මිය - ආයුර්වේද රෝහල, මීරිගම - රු.10,000/- ♦ බිනග සමාධිත් පුතා, අජිතා චාමලී මහත්මිය, කපිල සිල්වත්ගේ මහතා - බත්තරමුල්ල - රු.10,000/- ♦ එච්.ඩී. සරිත් මහතා - ගාල්ල - රු.5,400/- ♦ අමිත් හඳුගොඩ මහතා ඇතුළු පවුලේ සැම - අත්තිඩිය - රු. 5,000/- ♦ ගයාන් පුෂ්පික ඉන්ද්‍රජිත් ලොකුමාන්න මහතා, හිරෝෂානි ලොකුමාන්න මහත්මිය, සෙනුත් ලොකුමාන්න පුතා - ගල්කිස්ස - රු. 5,000/- ♦ සොනාලි සමරදිවාකර මෙනවිය - මහරගම - රු. 5,000/- ♦ සුභාෂ් රණසිංහ මහතා - මගලෙගොඩ - රු. 5,000/- ♦ කරගම්පිටිය ශාස්ත්‍රානන්ද පිරිවෙන් විහාරස්ථානයේ සදහම් වැඩසටහනට සහභාගි වන පින්වතුන් - රු. 5,000/- ♦ කරුණා ධර්මසේන මහත්මිය - හෝමාගම - රු.5,000/- ♦ ජනක හපුආරච්චි මහතා ඇතුළු පවුලේ සැම - ගිනිගත්හේන - රු. 3,000/- ♦ කේ.එම්. සමන්ත ප්‍රදීප් මහතා - කඹුරුගමුව, මාතර - රු.3,000/- ♦ ටී.ටී.පී. සිල්වා මහත්මිය - නාගොඩ කළුතර - රු.2,500/- ♦ ඔස්ටින් ප්‍රනාන්දු මහතා - පොල්ගහවෙල - රු. 2,000/- ♦ ජයනාත් සුභසිංහ මහතා - හෝමාගම - රු. 2,000/- ♦ සංජය රණවීර මහතා - මහරගම - රු.2,000/- ♦ රංජනී ජයසූරිය මහත්මිය - මීරිගම - රු.2,000/- ♦ වයලට් වික්‍රමආරච්චි මහත්මිය - කටුබැද්ද - රු.2,000/- ♦ සමන්ත වැලිකල මහතා -පිටිපන, හෝමාගම - රු.2,000/- ♦ අයිරාංගනී තිලකරත්න මහත්මිය - නාවල - රු. 1,500/- ♦ ඩී.ඩී. විතාරණගේ මහතා ඇතුළු පවුලේ සැම - නුගේගොඩ - රු.1,500/-♦ සකුන්තලා ඒකනායක මහත්මිය - බත්තරමුල්ල - රු.1,500/- ♦ ඉන්ද්‍රානි විසාකා ජයසිංහ මහත්මිය - බොරලැස්ගමුව - රු. 1,000/- ♦ දිළිණ අබේසිංහ සහ කවීෂ අබේසිංහ යන පුතුන් - තලවතුගොඩ - රු. 1,000/- ♦ ශ්‍යාමල් බණ්ඩාර මහතා - කුරුණෑගල - රු. 1,000/- ♦ නදීශා හර්ෂනී ලියනගේ මෙනවිය - කළුබෝවිල - රු. 1,000/- ♦ එරංග ලියනගේ මහතා සහ බිසන්තිකා ගුණසේකර මහත්මිය - කළුබෝවිල - රු. 1,000/- ♦ නිහාල් ලියනගේ මහතා සහ චිත්‍රා ශ්‍රෙරු මහත්මිය - කළුබෝවිල - රු. 1,000/- ♦ රුවන් රණසිංහ මහතා - පන්නිපිටිය - රු.1,000/- ♦ ගාමිණී ලියනගේ මහතා සහ නයෝමි ලියනගේ මෙනවිය - නැදිමාල - රු.1,000/- ♦ එස්. ප්‍රසන්න ප්‍රියදර්ශන සිල්වා මහතා - ගල්කිස්ස - රු. 1,000/- ♦ නුවන් යාපා අමරසේකර මහතා - රදාවාන - රු. 1,000/- ♦ සී.එම්.පී.සී. ලක්රුවන් මහතා - කළුතර - රු. 1,000/- ♦ අසංග සෙනරත් අඹගල මහතා - රදාවාන - රු.1,000/- ♦ රත්න පෙරේරා මහතා ඇතුළු පවුලේ සැම - කැස්බෑව - රු. 1,000/- ♦ චන්ද්‍රානි පෙරේරා මහත්මිය සහ ඉසුරු උදාන වික්‍රමසූරිය මහතා - පානදුර - රු.1,000/- ♦ කසුන් තාරක වික්‍රමසූරිය මහතා සහ සිතුමිණි ප්‍රබෝධා මහත්මිය - පානදුර- රු.1,000 ♦ ෂෙහානි බස්නායක මහත්මිය - මත්තෙගොඩ - රු.1,000/- ♦ සුසන්ත උඩුවේරිය මහතා - තලපත්පිටිය - රු.1,000/- ♦ චාමික මධුරංග මහතා - ලෙනගල - රු.1,000/- ♦ විපුල සංජීව මහතා ඇතුළු පවුලේ සැම - හෝමාගම - රු.1,000/- ♦ ඩී. මාලනී මහත්මිය - බෙන්තොට - රු.1,000/- ♦ පී. ඩී. නයනි නිරෝෂිකා මහත්මිය - මීගොඩ - රු.1,000/- ♦ ඩබ්.ඒ. මහින්ද ජයතිලක මහතා - වෙල්පල්ල - රු.1,000/- ♦ සිරිමල් වේරගම මහතා - මීගොඩ - රු.1,000/- ♦ අමිත් සමරනායක මහතා - බෙල්ලන්තර රු.1,000/- ♦ ප්‍රියංකා ජයසිංහ මහත්මිය - දොඩංගොඩ - රු.1,000/- ♦ රංජිත් වික්‍රමසිංහ

මහතා, පද්මාවතී වික්‍රමසිංහ මහත්මිය, ඩබ්.ආර්. ගුණතිලක මහතා - කඩිගමුව, උපුල් විජේනායක මහතා - මාවනැල්ල, මනෝජ් ජයසූරිය මහතා, උදාන ආරියවංශ මහතා - මහරගම, ඉසුරු සම්පත් මහතා - කළුතර, චන්දිම ගුණදාස මහතා - මොරටුව, දුමින්දා සංජීවනී මහත්මිය - නිට්ටඹුව, කුමාරි ගොඩවිට මහත්මිය, හෙසඳ සත්කුමාර පුතා - කුරුණෑගල, යමුනා උඩුමලගල මහත්මිය - පිළියන්දල, රසික තුශාන්ත මහතා - හෝමාගම, චතුර මල්වාන මහතා - කෑගල්ල, චන්දිම ජයසංඛ දාස්වත්ත මහතා - දොම්පෙ, රංජිත් පතිරණ මහතා - කුරුණෑගල, තිස්ස අතාවුද මහතා - ජාඇල, එම්.ඩී. තිලකරත්න මහතා - වැලිපැන්න, තුසිත ජයවික්‍රම මහතා - ජගත් රොබෝ ටෙක් ආයතනය, කීර්ති ප්‍රසාද් නන්දජීව මහතා - ගොඩගම, දිලීප රන්ජන් ධර්මසිරි මහතා - පිළිමතලාව, මීගොඩ විමල් ගරුසිංහ මහතාට පිං පිණිස, දමයන්ති ලියනගේ මහත්මිය - කිඹුලාපිටිය, ඩී.කේ. විජේසූරිය මහතා - අළුබෝමුල්ල, සෝමාවතී වැරණියගොඩ සහ ලීලා නානායක්කාර මහත්මීන් - රු. 9,850/- ♦ එකතු වූ සියලු මුදල් පරිත්‍යාග- රු. 173,350/- ♦ පළමු පිටපත් 10000 සඳහා මුද්‍රණ වියදම රු. 232,500/- ♦ අනෙකුත් වියදම් - 9,650/- ♦ සම්පූර්ණ වියදම - රු. 242,350/- මුද්‍රණ කටයුතු සඳහා ගිය හිඟ මුදල සඟරා අලෙවියෙන් පියවා ගන්නා ලදී. සඟරා අලෙවියෙන් ලැබෙන ඉතිරි සියලු මුදල් නැවත මුද්‍රණ කටයුතු ඇතුළු දහම් කටයුතු සඳහා යොදවනු ලැබේ.

**ඉහත නම් සඳහන් පිංවත් පිරිස ඇතුළු ආධාර උපකාර කළ සියලු දෙනා සිදු කරගත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද හේතු කොටගෙන, අනන්ත සසරේ පටන් මේ දක්වා තම තමන් අතින් අවැඩ, අසාධාරණ, වැරදි, ප්‍රමාද දෝෂවලට ලක් වූ සියලු දෙනාට මෙන්ම උදව් උපකාර කළ සැමටත්, මියගිය සතර වරිගයක ඥාති මිත්‍රාදීන්ටත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද විහිදී පැතිරී පිහිටා සුඛිත මුදිත වෙත්වා, සුගතිගාමීව තම තමන්ගේ පැතුම් පරිදි නිර්වාණාවබෝධයටද හේතු වාසනා වේවා! එම ආධාර උපකාර කළ පිංවත් පිරිස් ඇතුළු සිය පවුල්වල සැමටත්, කරන කියන යහපත් රැකී රක්ෂා ව්‍යාපාර ආදියෙන් සියලු ජයග්‍රහණයන් අත් වේවා. දූ දරුවන්ගේ අධ්‍යාපන ආදී කටයුතුවලින් විශිෂ්ඨ ජයග්‍රහණ අත් වී සුචරිත පිරිසක් වී සියලු අභිවෘද්ධිය උදා වේවා!**

## සියවස් ගණනාවකට පෙර සැඟව ගිය නිමල බොදු මග යළි පුබුදුවමින්,

**හෙළ බොදු පියුම දහම් කරුණු ඔබ වෙත රැගෙන එන්නේ, බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළ, අග්ගඤ්ඤ සූත්‍රය, නිරුක්තිපථ සූත්‍රය සහ අරණවිභංග සූත්‍රය යන සූත්‍රාන්තයන්ට අනුව, දහම් පදවල සැඟවුණු දහම් අරුත් මතු කරන පද නිරුක්ති සහ අතීතය, වර්තමානය, අනාගතය හඟවන තුන්කල් නිරුක්ති සහිත ව්‍යවහාර ශබ්ද නිරුක්ති ක්‍රමවේදය අනුව මිස, උන්වහන්සේ අනුමත නොකළ ලිඛිත භාෂා රීති සහිත බමුණන්ගේ ත්‍රිවේද නිරුක්ති මත නොවන බව සලකන්න.**

**පින්වත් ඔබ වෙනුවෙන් එළි දැක්වූ දහම් ගබඩාවන්...**

www.hiddendhamma.net mp3.hiddendhamma.net www.helabodhupiyuma.net
www.aaryadharma.org විද්‍යුත් ලිපිනය: webmaster@helabodhupiyuma.net දු.අං:- 071 3046895

**දම් සභා ගුවන් හඬ** - www.waharaka.com වෙබ් අඩවිය ඔස්සේ පුර සහ අමාවක පොහොය දිනයන්හි උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා

**සැඟවුණු බොදු මග යළි විවර කරමින් වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානයේ සදහම් වැඩසටහන් පැවැත්වෙන කාල හෝරාවන්:**

සෑම පුන් පොහෝ දිනකම සහ සෑම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා - පෙහෙවත් සමාදානය, දහම් සාකච්ඡා සහ විශේෂ පුණ්‍යානුමෝදනාව.

## හෙළ බොදු පියුම දහම් සඟරාවේ පසුගිය කලාපයන් ඇතුලු සියලු කලාපයන් දැනට ලබාගත හැකි ස්ථානඃ

1. ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලය - 33, තලවතුගොඩ පාර, පිටකෝට්ටේ
2. නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ.
3. නිව් පියුමි කොමිනිකේෂන් - පීරිස් මාවත, කළුබෝවිල - 0773742023
4. තුෂාරා ෆැෂන් - හයිලෙවල් පාර, හෝමාගම.
5. පිනැකල් නෙට් - ශානි ඉන්ස්ටිටියුට් - හයිලෙවල් පාර, ගොඩගම
6. තුෂාරි සාරි සෙන්ටර් - කොළඹ පාර, පාදුක්ක.
7. සුජය ෆාමසි - කටුබැද්ද හංදිය, මොරටුව.
8. ගේට්වේ අධ්‍යාපන ආයතනය - කලේගාන, ගාල්ල.
9. සමනල පොත්හල - නෙළුව.
10. නිව් මෙට්‍රෝ කම්පියුටර්ස් - කාලිදාස මාවත, මාතර
11. මෝලෙ කඩේ - මුදුන, වලස්මුල්ල.
12. කේ. පී. ස්ටෝර්ස් - ගන්තුන, කෑගල්ල.
13. ලසන් ට්‍රේඩ්සෙන්ටර් - 8, අලුත්ගොඩ පාර, තිස්සමහාරාමය - 0718523556
14. නුගේගොඩ නාලන්දාරාම විහාරස්ථානයේ සදහම් වැඩසටහනින් (ඉරිදා උදේ 9.00 සිට සවස 2.00 දක්වා පමණි.) (0773742023)
15. දෙහිවල කරගම්පිටිය ශාස්ත්‍රානන්ද පිරිවෙන් විහාරස්ථානයේ සදහම් වැඩසටහනින් (සෙනසුරාදා උදේ 8.30 සිට සවස 2.00 දක්වා පමණි) (දෙහිවල පොලිස් ස්ථානය අසල) - 0713228571
16. සරසවි පොත්හල - 330/ඒ, ගාලුපාර, අළුත්ගම - 0773474081


**තැපෑලෙන් ගෙන්වා ගැනීම සඳහා විමසන්න - ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලය - අංක 33, තලවතුගොඩ පාර, පිටකෝට්ටේ - 0777794676**

***ඉහත ආයතන හිමි පින්වතුන් මෙම සද් කාර්ය ඉටු කරනු ලබන්නේ කිසිදු වෙළඳ ලාභයකින් තොරව සාසනික කටයුත්තක් වශයෙන් පමණි.***




# තමන් බඩ වඩා ගන්නට...















සතෙකුටවත් හිංසා නොකරන බොදු පිළිවෙත්
තිබුණාට මුත් පෙර සිට පැවතෙන අද නොම වෙත්
හිතනටවත් අකමැති දන මරණෙදි වද වෙත්
හැම දෙනටත් එල දෙන කම් නියමය පොදු වෙත්

අනුන් මරා හෝ රකිනට තමන්ගෙම දිවී
කොහින් කොහොම හරි විකුණයි නමැති විස අවී
උපන් උපන් තැන මනු ලොව යහපතක නොවී
තමන්ටත් වෙනව වහ කන්නටම දැවී දැවී

තමන් බඩ වඩා ගන්නා අරමුණින් සිතා
අනුන් කනෙන බොන අහරය වස විසෙන් ඔතා
වෙනින් දෙයක් කා බී තම සුව සැපෙන් පතා
දනන් අහර විකුණයි නෙක බොරු වදන් ගොතා

අධි ලොබයෙන් ධනය සොයන මං හඳුන ගෙනා
සැදී දුලබව මනු භවයක අගය නොම දැනා
බුදිනට සලසා අනුනට වස විසම දෙනා
විඳිනට වෙයි නෙක ලෙඩ දුක් ඔසුද නැති වෙනා

විසෙන් විස පිරුණු ආහර විකුණුමට සදා
රසෙන් ගුණින් පිරි ආහර සඟව ගෙන නොදා
ඇසෙන් කනින් රවටා වැඩි මුදලකට බෙදා
වෙසෙන්නට බලයි කම් එල නොමැති ලෙස මෙදා

වග කිව යුතු නිලධරයන් දෙ ඇස කන පියා
අග මුල නොම දත් උන් ලෙස තනතුරම අයා
දිග පළලින් එයි නම් තුටු පඬුරු ලෙස තියා
හඟවන් නැත රස දැනුනොත් නොමැත කිසි දයා

සමගින් වැට සහ නියරත් ගොයම් කන ලෙසේ
අමතයි විස වෙළඳුන් ලොකු තැන් සමග තොසේ
නොම දත් අසරණ ලිප උඩ විස අහර පිසේ
පමණයි නීතිය වදනට බණ කියන දෙසේ

නොම දෙයි නම් පිළියම් දැන් එරෙහිව ඊට
තම හැකි පමණින් දිරි දී විස නැති දේට
සැම දෙන එක් වී පර දා වෙළඳුන් කූට
නිමවමු වස පිරි ලොව නොබලා කිසි පාට

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන

# සසර ගමනක නිමාව.

පබැඳුම
නීතිඥ චන්දන සිරිවර්ධන



තිබුනද වරම් දැකුමට අම නිවන එදා
සතුනද නේක ගොඩලම් අදිටනද සදා
දුක විඳ නොයෙක අත්බැව්වල දිවිද පුදා
මහ වෙද රජුන් දම් ඔසු දී නිවිය මෙදා

පුහු දන මනසකට ගෝචර නොවන දිග
අභු වින දිනූ පසු තුන් ලොව නිවන මග
මුහු කර අවිදු ලෝ සත දිවි සසර අග
වැහුනේ දහම් ඔසුවෙනි මුනි සමිඳු ළඟ

දෙව් බඹ මිනිස් තිරිසන් යන ගති හතර
සව් සත විලස ඉපදී හැම සත අතර
පව් මඳ පිනින් වැඩි කම් කර ගෙන නිතර
ලොව්තුරු සුවය විඳ නික්මිය භව කතර

ගති හතරකට කොටු වී ආ ලොවෙහි නෙක
නැති විය කිසිදු හරයක් රිසි ලෙසට දැක
සිතිවිලි මැරී මැරී උපදින අනත දුක
හති වැටෙනකල් දිවි දුර ගැන නොමැත සැක



නොවුනේ කවුද අනතව ආ සසර දුර
දැවුනේ නොයෙක අත් බැව්වල වැඩිම වර
ගෙවුනේ රුදුරු මරු පැරදී එ හැම වර
නිවුනේ අදයි මතු දුක් නැති ලෙසට තිර

බුදු පදවිය ලදත් මස් ලේ කයෙහි දුක
සිදු විය විඳින්නට සව් සත ලෙසට එක
සැදු මහ බලෙන් යට කරනට වුවද හැක
පොදු බව කිව යුතුයි නොකළෙම් එලෙස දැක

තිලොවින් ජය ලැබූ බුදු පදවිය ගාවා
කෙළෙසුන් නසා මහ දුක් කඳ ගිනි ලෑවා
නිවනින් පිරුණු පසු කායික දුක නාවා
ගමනින් සසර දුන් දුක් කඳ නිම වූවා

එක් තිස් තලේ මැරී මැරී දුක් කඳුළු තෙමා
දික් විය සසර මෙත් සිත ලෝ සතට නමා
දැක් විය නැණින් පිරී සව් සත නිවන අමා
දුක් කඳ දුන් සසර ගමනකි මෙලෙස නිමා



නීතිඥ චන්දන සිරිවර්ධන විසින් නුගේගොඩ ගංගොඩවිල වනාත පාරේ අංක 96/A දරණ ස්ථානයේ පිහිටි ඉමාෂි මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.